# PRAPTAKARMA SUTRA.

උභය ලොකාර්ථ සිද්ධිය සඳහා

ගිහිජනයන් විසින් පිළිපැදිය යුතුවූ

# ප්‍රාප්තකර්මසූත්‍රය

සහ එහි අටුවාවද

පුරාතන පණ්ඩිතුමෙකු විසින් සහොදාහරණාදියෙන් යුක්තකොට

කරණ ලද

ව්‍යක්තාර්ථවහබහනය ද යන මෙයින්

සමන්විතයි.

---

**මබුගල්ලේ සිද්ධත්ථාභිධාන ස්වාමීන්වහන්සේ**

ලවා

ශුද්ධකරවා

ජෝන් පව්ලිස් ගුණවර්ධන පුඤ්චිමහත්මයා විසින්

ලඞ්කාභිනවවිශ්‍රැත යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවා

ප්‍රසිද්ධ කරණ ලදී.

---

ශ්‍රී බුද්ධ වර්ෂ 2436.

1893

# විඥාපනය.

## සන්න සහිත.

## ප්‍රාපතකම්ම සූත්‍රය.

දෙවාතිදෙවවූ අප සර්වඥ සම්බුදුරජාණන්වහන්සේ සියලු විනෙයජනයන් අමාපුර පමුණුවමින් සැවත්නුවර දෙව්රම් මහවෙහෙර වැඩවසන සෙමෙහි ගිහිගෙයිවැසි සකල සත්ත්වවර්ගයාකෙරෙහි පතළ මහාකරුණාවෙන් අනේපිඬුමහසිටාණන්ට මේ "ප්‍රාපතකර්මසූත්‍රය" දෙශනා කර වදාළසේක.

ඒ මේ සූත්‍රධර්මදෙශනාව සඞ්ගීතිකාරකමහාස්ථවිරයන්වහන්සේලාවිසින් අඞ්ගුත්තරනිකායෙහිවූ චතුෂ්කනිපාතයේ ද්විතියපණ්ණාසක "ප්‍රාපතකර්මවර්ගයේ" පළමුවෙනි සූත්‍රයක් කොට ඇතුළත් කරණ ලදී.

මේ සත්ත්වලොකවාසීන්විසින් සෙනෙවිරත් සිවුහනතුරු ඈ කරුණු සඞ්ගීතව රූපාදිපඤ්චකාමසම්පත්තීහු ඇතිවෙත්වයි සිත්මද-මෙසේ සිතූ යමෙක් විසින් එසේ දුර්ලභවූ රජඇමැති සෙනෙවිරත් සිවුහනතුරු සඞ්ගීතව වස්තු ලැබ මාතෘ පිතෘ යන උභයපක්ෂයෙහි වූ නෑයන්සමගද සුවදුක්දෙක්හි සමයිතැතිහෙයින් උපාධ්‍යායසඞ්ඛ්‍යාත සන්දිෂ්ට සම්භක්ත මිත්‍රයන් සමගද මාගේ කීර්ත්තිප්‍රශංසාදිය ඒ ඒ තැන ඉතා උස්ව පැතිරෙත්වයි සිතිමද-එය එසේ ලැබ නැවත බොහෝ කලක් ජීවත්වෙම් දීර්ඝකාලයක් ආයුපාලනය කෙරෙම්යි සිතිමද-මෙකී දෙය ලැබ මරණින් මතු දිව්‍යලොකයෙහි උපදිම්යි යන මේ කාරණා සතර ලොකයෙහි ඉතා දුර්ලභ පරිද්ද-එසේ අතිසයින්ම දුර්ලභවූ චතුර්විධ කාරණයන් සුවසේ ලැබීම්පිණිස පැවැත්වියයුතුවූ බුද්ධාදි රත්නත්‍රයෙහි ගුණඇදහීමාදිය ලක්ෂණ කොට ඇති ශ්‍රද්ධා ශීල ත්‍යාග ප්‍රඥා යන මේ කාරණා සතර ඇතිවියයුතුබවද-ඒ ශ්‍රද්ධාසම්පාදාදියෙහි විස්තර විභාගද-වීර්‍ය්‍යයෙන් හස්තබලයකරණ කොට ගෙණ ධහදිය සෙල්විමාදි වශයෙන් දහැමින් උපදවනලද වෑහුවෙන් ගතයුතු ප්‍රයොජනවත් කාරණා සතරද-අග්නිඋදකාදිඋපද්‍රවයන්ගෙන් සම්පතක් පැමිණිකල්හි එය දුරුකරගැණීමාදියට වස්තුව හෙතුවන පරිද්ද-ඥාතිබලිය, අතිථිබලිය, පූර්වප්‍රෙතබලිය, රාජබලිය, දෙවතාබලිය යන පඤ්චවිධ බලිද-ශ්‍රමණබ්‍රාහ්මණාදීන්කෙරෙහි චීවරපිණ්ඩපාතාදිය දීම හැර එයින් පිටත් අක්ෂධූර්ත්ත සුරාධූර්ත්ත ස්ත්‍රීධූර්ත්තාදී සෙසු නොකටයුතු නොපණත්දෙය කිරීමෙන් වස්තුව ක්ෂයභාවයට ගියේනම් ධහදිය වැගිරවීම්වශයෙන් වීර්‍ය්‍යයෙන් දැහැමින් දුකසේ සපයනලද ඒ භොගයෝ නොපැමිණිවියයුතුවූ අයුක්තස්ථානයට පැමිණියාහුයයි යනාදීන් වදාරණලද යහපත්ධර්මරාශියක් මෙහි අන්තර්ගතයි.

තවද මෙකල පවත්නා දෙවපූජාවාදය සම්බන්ධ සත්‍යාසත්‍යතාවය අවබොධ කර ගණු කැමැත්තන්ටද මෙය අත්‍යන්තොපකාරී වෙයි.

මේ ආදිවූ අවශ්‍යයෙන්ම දතයුතු යහපත් ධර්මරාශියක් මෙහි විද්‍යමානහෙයින් "දෙශනාපාලිය" ද-"අටුවාව" ද මිට පූර්ණප්‍රශස්ත පඬිතුමෙකු

විසින් සූත්‍රයෙහි ප්‍රකාශ ශුද්ධාශීලාදියෙහි මුඛමාත්‍රයක් රැගෙණ නොයෙක් දෙශනාපෙල අනුවාදිය නිදර්ශනකිරීමෙන් අතිවිස්තාරෞපමාකථාදියෙන් වර්ණනා කරණලද මාහැඟි සන්නය උඩපාතදෙරටින්ම පොත් කිපයක් සපයාගෙණ එකිනෙකට සංසන්දනය කොට බලා එහි සමහරතැන් පේළිගණන් අඩුවැඩිවී තිබුනුහෙයින් එය සම්පූර්ණකරවීමාදියෙන් හා අවියත් ලිපිකරුවන්ගෙන් හටගත් දොෂයන් මඩුගල්ලේ සිද්ධත්ථාභිධාන ස්වාමීන් වහන්සේ ලවා ශුද්ධකරවා ගෙණ මුද්‍රණය කරවන ලදී.

ගිනි දල්වන අවියෙන් මදපිය පිඹින්නාක්මෙන් සම්බුද්ධධර්මරත්නයන් සොයන ආශාවෙන් අරපොත මේපොත මුදල්දී ගන්නා පින්වතුන්ට මෙය චින්තාමාණික්‍යයක් වනබව පොත රැගෙණ බලා දැන ඒ වූ පරිද්දෙන් පිළිපැද දෙලෝවැඩ සාද ගෙණ කෙළවර ජාතිජරාමරණ නැත්තාවූ බුදුපසේබුදුමහරහතන්වහන්සේලා නිවී සැනසී පැමිණවදාළාවූ උතුම් නිර්වාණ සම්පත් අත්පත්කරගතයුතුයි.

මෙහි යම් ප්‍රමාදභ්‍රමාදියෙන් ජනිතස්ඛලිතස්ථාන විද්‍යමානවූවහොත් එය ශාසනාලයෙන් නැණවතුන්විසින් සමාධිය භජනයකරමින් ශුද්ධකරණු ලැබේවා.

මෙය නැවත නැවතත් අච්චුගැස්වීමේ අයිතිවාසිකම මෙහි පහත අත්සන් කරණ මටම තබාගත්බැව් දතයුතු.

මෙවගට,

J. P. Gunawardana
Kandy

වර්ෂ 1893 ක්වූ දෙසැම්බර් මස 20 වෙනි
කුජදින මහනුවරදීය.

# පත්තකම්මසුත්තං

**නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.**

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච.

චත්තාරො'මෙ ගහපති ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, කතමෙ චත්තාරො? භොගා මෙ උප්පජ්ජන්තු සහ ධම්මෙනා'ති අයං පඨමො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං, භොගෙ ලද්ධා සහ ධම්මෙන යසො මං අබ්භුග්ගච්ඡතු සහ ඤාතීහි සහ උපජ්ඣායෙහී'ති අයං දුතියො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං, භොගෙ ලද්ධා සහ ධම්මෙන යසං ලද්ධා සහ ඤාතීහි සහ උපජ්ඣායෙහි චිරං ජීවාමි දීඝමායුං පාලෙමී'ති අයං තතියො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං, භොගෙ ලද්ධා සහ ධම්මෙන යසං ලද්ධා සහ ඤාතීහි සහ උපජ්ඣායෙහි චිරං ජීවිත්වා දීඝමායුං පාලෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජාමී'ති අයං චතුත්ථො ධම්මො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං, ඉමෙ ඛො ගහපති චත්තාරො ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

ඉමෙසං ඛො ගහපති චතුන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං චත්තාරො ධම්මා පටිලාභාය සංවත්තන්ති, කතමෙ චත්තාරො? සද්ධාසම්පදා සීලසම්පදා චාගසම්පදා පඤ්ඤාසම්පදා, කතමා ච ගහපති සද්ධාසම්පදා? ඉධ ගහපති අරියසාවකො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං "ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා" ති අයං වුච්චති ගහපති සද්ධාසම්පදා.

කතමා ච ගහපති සීලසම්පදා? ඉධ ගහපති අරියසාවකො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති අයං වුච්චති ගහපති සීලසම්පදා.

කතමා ච ගහපති චාගසම්පදා? ඉධ ගහපති අරියසාවකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො අයං වුච්චති ගහපති චාගසම්පදා.

කතමාච ගහපති පඤ්ඤාසම්පදා ? අභිජ්ඣාවිසමලොභාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසාච සුඛාච ධංසති, ව්‍යාපාදාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසාච සුඛාච ධංසති, ථීනමිද්ධාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසාච සුඛාච ධංසති, උද්ධච්චකුක්කුච්චාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසාච සුඛාච ධංසති, විචිකිච්ඡාභිභූතෙන ගහපති චෙතසා විහරන්තො අකිච්චං කරොති කිච්චං අපරාධෙති අකිච්චං කරොන්තො කිච්චං අපරාධෙන්තො යසාච සුඛාච ධංසති.

සඛො සො ගහපති අරියසාවකො අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභං චිත්තස්ස උපක්කිලෙසං පජහති, ව්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා ව්‍යාපාදං චිත්තස්ස උපක්කිලෙසං පජහති, ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසං පජහති, උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපක්කිලෙසං පජහති, විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා විචිකිච්ඡං චිත්තස්ස උපක්කිලෙසං පජහති.

යතො ච ඛො ගහපති අරියසාවකස්ස අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභො චිත්තස්සඋපක්කිලෙසො පහීණො හොති, ව්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා ව්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති, ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා ථීනමිද්ධං චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති, උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා උද්ධච්චකුක්කුච්චං චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති, විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසො'ති ඉති විදිත්වා විචිකිච්ඡා චිත්තස්ස උපක්කිලෙසො පහීණො හොති අයං වුච්චති ගහපති අරියසාවකො මහා පඤ්ඤො පුථුපඤ්ඤො ආපාථදසො පඤ්ඤාසම්පන්නො අයං වුච්චති ගහපති පඤ්ඤාසම්පදා-

ඉමෙසං ඛො ගහපති චතුන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ඉමෙ චත්තාරො ධම්මා පටිලාභාය සංවත්තන්ති.

සඛො සො ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි චත්තාරි පත්තකම්මානි කත්තා හොති, කතමානි චත්තාරි ? ඉධ ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, මාතාපිතරො සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, පුත්තදාරදාසකම්මකරපොරිසෙ

සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, මිත්තාමච්චෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති, ඉදමස්ස පඨමං ඨානංගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං-

පුනචපරං ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි යා තා හොන්ති ආපදා අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියතො වා දායාදතො වා, තථාරූපාසු ආපදාසු භොගෙහි පරියොධාය වත්තති සොත්ථිං අත්තානං කරොති ඉදමස්ස දුතියං ඨානංගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං,

පුනචපරං ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි පඤ්චබලී කත්තා හොති ඤාතිබලිං අතිථිබලිං පුබ්බපෙතබලිං රාජබලිං දෙවතාබලිං, ඉදමස්ස තතියංඨානංගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං,

පුනචපරං ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි යෙ තෙ සමණබ්‍රාහ්මණා මදප්පමාදා පටිවිරතා ඛන්තිසොරච්චෙ නිවිට්ඨා, එකමත්තානං දමෙන්ති එකමත්තානං සමෙන්ති එකමත්තානං පරිනිබ්බාපෙන්ති තථාරූපෙසු සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං, ඉදමස්ස චතුත්ථං ඨානං ගතං හොති පත්තගතං ආයතනසො පරිභුත්තං,

සඛො සො ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිචිතෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි ඉමානි චත්තාරි පත්තකම්මානි කත්තා හොති.

යස්ස කස්සචි ගහපති අඤ්ඤත්‍ර ඉමෙහි චතූහි පත්තකම්මෙහි භොගා පරික්ඛයං ගච්ඡන්ති ඉමෙ වුච්චන්ති ගහපති භොගා අට්ඨානගතා අපත්තගතා ආයතනසො පරිභුත්තා'ති, යස්ස කස්සචි ගහපති ඉමෙහි චතූහි පත්තකම්මෙහි භොගා පරික්ඛයං ගච්ඡන්ති ඉමෙ වුච්චන්ති ගහපති භොගා ඨානගතා පත්තගතා ආයතනසො පරිභුත්තා'ති.

භුත්තා භොගා භතා භච්චා විතිණ්ණා ආපදාසු මෙ,
උද්ධග්ගා දක්ඛිණා දින්නා අථො පඤ්ච බලී කතා,
උපට්ඨිතා සීලවන්තො සඤ්ඤතා බ්‍රහ්මචාරියො,
යදත්ථං භොගං ඉච්ඡෙය්‍ය පණ්ඩිතො ඝරමාවසං,
සො මෙ අත්ථො අනුප්පත්තො කතං අනනුතාපියං,
එතං අනුස්සරං මච්චො අරියධම්මෙ ඨිතො නරො,
ඉධ චෙව නං පසංසන්ති පෙච්චසග්ගෙ ච මොදතී'ති.

පත්තකම්ම සුත්තං නිට්ඨිතං.

# මුණ්ඩවග්ගො

දුතියස්ස පඨමෙ-අනිට්ඨපටික්ඛෙපෙන ඉට්ඨා; මනෙ කමන්ති පවිසන්තීති කන්තා; මනං අප්පායන්ති වඩ්ඪන්තීති මනාපා; දුල්ලභා'ති, පරමදුල්ලභා; භොගා'ති, භුඤ්ජිතබ්බකා රූපාදයො විසයා; සහ ධම්මෙනා'ති, සධම්මෙනෙව සද්ධිං උප්පජ්ජන්තු මා ධම්මූපඝාතං කත්වා අධම්මෙනා'ති; අථවා-සහ ධම්මෙනා'ති, සකාරණෙන හෙතුනා සෙනාපතිසෙට්ඨිට්ඨානාදිනා කාරණෙන සද්ධිං උප්පජ්ජන්තූ'ති අත්‍ථො; යසො'ති, පරිවාරසම්පත්ති; සහ ඤාතීහී'ති, ඤාතිකෙහි සද්ධිං; සහ උපජ්ඣායෙහී'ති, සුඛදුක්ඛෙසු උපනිජ්ඣායිතබ්බත්තා උපජ්ඣායසඞ්ඛාතෙහි සන්දිට්ඨසම්භත්තෙහි සද්ධිං; අකිච්චං කරොතී'ති, අකාතබ්බං කරොති; කිච්චං අපරාධෙතී'ති කාතබ්බයුත්තකං කිච්චං අකරොන්තො තං අපරාධෙති නාම, ධංසතී'ති, පතති පරිහායති; අභිජ්ඣාවිසමලොභන්ති, අභිජ්ඣා සඞ්ඛාතං විසමලොභං; පජහතී'ති, නුදති නීහරති; මහාපඤ්ඤො'ති, මහන්තපඤ්ඤො; පුථුපඤ්ඤො, ආපාථදසො'ති, තං තං අත්‍ථං ආපාථෙන්තො'ව පස්සති සුඛුමම්පිස්ස අත්‍ථජාතං ආපාථං ආගච්ඡතියෙවා'ති අත්‍ථො; උට්ඨානවීරියාධිගතෙහී'ති, උට්ඨානසඞ්ඛාතෙන වීරියෙන අධිගතෙහි; බාහාබලපරිචිතෙහී'ති, බාහාබලෙන පරිචිතෙහි වඩ්ඪිතෙහි; සෙදාවක්ඛිත්තෙහී'ති, අවක්ඛිත්තසෙදෙහි සෙදං මුඤ්චිත්වා වායාමෙන පයොගෙන සම්භතෙහී'ති අත්‍ථො; ධම්මිකෙහී'ති, ධම්මෙසු යුත්තෙහි; ධම්මලද්ධෙහී'ති, දසකුසලකම්මපථධම්මං අකොපෙත්වා ලද්ධෙහි; පඤ්ච කම්මානි, අනුච්ඡවිකකම්මානි; සුඛෙතී'ති, සුඛිතං කරොති; පීණෙතී'ති, පීණිතං බලසම්පන්නං කරොති; ඨානංගතං හොති, කාරණගතං හොති; කිං පනෙතන්ති චතූසු ඵකං භොගෙහි කාතබ්බං කම්මං භොගජාතමෙව ඨානගතං; පත්තගතන්ති, සුට්ඨු පත්තට්ඨානං ගතං; ආයතනසො පරිභුත්තන්ති, කාරණෙනෙව පරිභුත්තං භොගජාතං හොති; පරියොධාය වත්තතී'ති, යථා අග්ගිආදීහි උප්පන්නාසු ආපදාසු එවං ආදිත්තගෙහනිබ්බාපනාදිනං අත්‍ථාය ධනපරිච්චාගං කත්වා තාසං ආපදානං මග්ගං පිදහති වාරෙති; සොත්‍ථිං අත්තානං කරොතී'ති, නිරුපද්දවං ඛෙමං අත්තානං කරොති; ඤාතිබලින්ති, ඤාතකානං බලිං. අතිථිබලින්ති, ආගන්තුකබලිං; පුබ්බපෙතබලින්ති, පරලොකගතානං බලිං; රාජබලින්ති, රඤ්ඤො කාතබ්බබලිං; දෙවතාබලින්ති. දෙවතානං කාතබ්බබලිං සබ්බමෙතං තෙසං යථානුච්ඡවිකවසෙන දාතබ්බදානස්ස අධිවචනං; බන්ති සොරච්චෙ නිවිට්ඨා'ති. අධිවාසනඛන්තියඤ්ච සුසීලතායඤ්ච නිවිට්ඨා; එකමත්තානං දමෙන්තී'ති, එකං අත්තනො'ව අත්තභාවං ඉන්ද්‍රියදමෙන දමෙන්ති; සමෙන්තී'ති, අත්තනො'ව අත්තභාවං කිලෙසවූපසමනෙන සමෙන්ති; පරිනිබ්බාපෙන්තී'ති, කිලෙසපරිනිබ්බානෙනෙව පරිනිබ්බාපෙන්ති; උද්ධග්ගිකාදි ආදිසු උපරූපරිභූමීසු ඵලදානවසෙන උද්ධග්ගමස්සාති-උද්ධග්ගිකං, සග්ගස්ස හිතාති තත්‍රූපපත්තිජනනතො සොවග්ගිකො; නිබ්බත්ත නිබ්බත්තට්ඨානෙසු සුඛො විපාකො අස්සාති=සුඛවිපාකො; සුට්ඨු අග්ගානං දිබ්බවණ්ණාදීනං දසන්නං විසෙසානං නිබ්බත්තනතො සග්ගසංවත්තනිකො; එවරූපං දක්ඛිණං පතිට්ඨාපෙන්ති'ති අත්‍ථො; අරියධම්මෙ ඨිතො'ති, පඤ්චසීලධම්මෙ පතිට්ඨිතො; පෙච්චසග්ගෙ ච මොදතී'ති, පරලොකං ගන්ත්වා යත්‍ථ පටිසන්ධිං ගණ්හාති තත්‍ථ මොදති සොතාපන්නසකදාගාමිනො වා භොගානුභාගම්'ති සබ්බෙසං අයං පටිපදා ලබ්භතෙ වා'ති.

# ප්‍රාපතකර්මසූත්‍ර ව්‍යාඛ්‍යානය

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

එවමෙම් සුතං—මෙ, ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන් වහන්ස මා විසින් විශුද්ධබුද්ධීන් ප්‍රසිද්ධවූ සකල ශ්‍රොතෘජනමනඃප්‍රසාදජනක වූ මේ ප්‍රාපතකර්ම සූත්‍රාන්ත ධර්මදෙශනාව ; එවං සුතං, “එවං නිදස්සනා‘කාරෙ‘පමාසු සම්පහංසනෙ උපදෙසෙ ච වචනපටිග්ගාහෙ‘වධාරණෙ ගරහායෙදමත්ථෙ ච පරිමාණෙ ච පුච්ඡනෙ” යනු හෙයින් මේ “එවං,, ශබ්දය ‘එවම්බ වදෙහි,, යන තන්හි සෙයින් නිදර්ශනයෙහි වැටෙයි, ඔවින් බැහැර “එවං ජාතෙන මච්චෙන,, යන තන්හි උපමායෙහි වැටෙයි, “එවං තෙ අභික්කමිතබ්බං,, යන තන්හි උපදෙශයෙහි වැටෙයි, “එවමෙතං සුගත,, යන තන්හි සම්ප්‍රහර්ෂණයෙහි වැටෙයි, “එවමෙතං වසලී,, යන තන්හි ගර්හායෙහි වැටෙයි, “එවම්භන්තෙ,, යන තන්හි සම්ප්‍රතිග්‍රහණයෙහි වැටෙයි, “එවංච වදෙහි,, යන තන්හි ආකාරයෙහි වැටෙයි, “එවනෙතා එත්ථ හොති,, යන තන්හි අවධාරණයෙහි වැටෙයි, “එවං ගතානි,, යන තන්හි ඉදමර්ථයෙහි වැටෙයි, “එවං නුබො,, යන තන්හි පෘච්ඡායෙහි වැටෙයි, “එවං ලහු පරිවත්තං,, යන තන්හි පරිමාණයෙහි වැටෙයි, මෙසෙයින් උපමූපදෙශාදිවූ අනෙකාර්ථයෙහි වැටෙන්නාවූ මේ “එවං,, ශබ්දය මෙ තැන්හි ආකාර නිදර්ශනාවධාරණය යන අර්ථත්‍රයෙහි වැටෙයි, එහෙයින් මේ ආකාරයෙන් අසන ලද මෙසේ අසන ලද මෙසේම අසන ලදී; එකං සමයං, “සමවායෙ ඛණෙ කාලෙ සමූහෙ හෙතුදිට්ඨිසු පටිලාභෙ පහාණෙ ච පටිවෙධෙ ච දිස්සති“ති*. මෙසෙයින් සමය ශබ්දය සමවායය සමූහය කාරණය යනාදිවූ අනෙකාර්ථවාචී වුවද මෙතැන්හි කාලවාචී වනහෙයින් එක් දෙශනා කාලයෙක්හි (හෙවත්) ගර්භාවක්‍රාන්තිසමය ජාතිසමය සංවෙගසමය අභිනිෂ්ක්‍රමණසමය දුෂ්කරක්‍රියාසමය මාරවිජයසමය සම්‍යක්සම්බොධි සමධිගමකාලසමය දෘෂ්ටධර්මසුඛ විහාරසමය අත්තහිතපටිපත්තිසමය පරහිත පටිපත්තිසමය දෙශනාසමය පරිනිර්වාණසමය යනාදිවූ දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශ සමයන් අතුරෙන් කරුණාකෘත්‍යසමය සඞ්ඛ්‍යාතවූ එක් ධර්මදෙශනාසමයෙක්හි ; භගවා, සර්වානර්ථපරිහාරපූර්වඞ්ගම නිරවශෙෂහිතසුඛවිධාන තත්පර නිරතාතිශය ප්‍රයොගසම්පත්තියෙන් දෙව් මිනිසුන් සහිත සකලලොකයාහට අත්‍යන්තොපකාරත්වයෙන් භගවත් නම්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේ; සාවත්ථියං, සාවත්ථික නම් සෘෂිහට නිවාසස්ථාන වන හෙයින් ද (නොහොත්) ‘සර්වමස්ති’ කීය යුතු තන්හි නෛරුක්තික විසින් ශ්‍රාවස්තිය යන නමින් ප්‍රසිද්ධවූ සකලනගරාධිශ්‍රීසමෘද්ධීන් සශ්‍රීකවූ පුරන්දරපුරාකාර කොසල දෙශතිලකාය මානවූ සැවැත්මෙන්සුත් සැවැත්

* “සමයො සමවායෙ ච සමූහෙ කාරණෙ ඛණෙ,
පටිවෙධෙ සියා කාලෙ පහාණෙ ලාභදිට්ඨිසු,,ති—අභිධානප්පදීපිකා.

නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙත නම් රාජකුමාරයාවිසින් රොපිත සංව
ර්ධිත විකසිත පඤ්චවිධපද්මොත්පලසඤ්ඡන්න නානා මධුරජල සම්පූර්ණ පුෂ්කරණි
යෙන් හා සුරභිමකරන්දබින්දුසන්දොහසඤ්චරසඤ්චරික භෘඞ්ගකොකිලාලාපවාචාල
මඤ්ජුරපුඤ්ජමඤ්ජුකුඤ්ජවන්දන පූග පුන්නාග නාග තාලතමාලහින්තාල වකුල ඛර්ජූ
රික ක්‍රමුකාම්බ ජම්බුජම්බීර පනස පාටලකෙතකාශොක චම්පකාදි නිත්‍යඵල
නිත්‍ය පුෂ්පයෙන් යුක්ත නෛකමහීරුහ සඞ්ඝාතයෙන් සකලජන මනොනන්ද
නීයවූ ජෙතවනොද්‍යානයෙහිවූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, සතත සුචරිත
විසද සකරුණා හෘදය පරිහෘතදුරිතසමුදය සකලගුණනිධිවිබුධජනසබනිඛිල
ජනපරහිත නිරතනිජදෙහධරවූ සිඟලු අනාථජනයන්ට සුරභි සුරමිණි සුරතුර
සුරු විතරණයෙන් කැමැති මහරු ඉසුරුසිරි දීමෙන්; පරම නාථවූ අනාථ
පිණ්ඩික නම් මහසිටුහු විසින් ත්‍රිභුවන නෛකප්‍රදීපාය මානවූ සර්වඥරාජො
ත්තමයානන්වහන්සේ උදෙසා සිව්පණස් කෙළක් ධන වියදම් කොට කරවා
පිළිගන්වන ලද චක්‍රවාටපර්‍යන්තාකාර ගොපුරවාරශතකවාටසම්බරතරප්‍රාකාරවල
යාලඞ්කෘත කෛලාශකූටසිඛරප්‍රතිභාග සුධාකර්ම විචිත්‍රකර්ම නිර්ම්මිතභිත්ති
ස්තම්භතුලාසඞ්ඝාට වෙදිකාකවාටමුඛවටවීගොපානච්ඡදන සොපානමාලාල
ඞ්කෘත ගාඬෙගය හඞ්ග පිඞ්ග රඞ්ග ශෘඞ්ග නිකරකිරණ මාලායෙන් පෘෂ්වා
න්ධකාරඇතිජ්දනස්‍රාදශීචෙජදග්‍රාවලම්බමාන ප්‍රවාලහෙමදාමමුක්තාලතාකුලිත
විවිධධ්වජපතාකපටපිකාබද්ධප්‍රාසාදමණ්ඩප චඞ්ක්‍රමණ කූටාගාරාදීන් සජ්ජිතවූ
සුරාසුරනරවරනයනරසායනතරප්‍රවර ජෙතවනාරාමයෙහි; විහරති, මෛත්‍රී
කරුණා මුදිතා උපෙක්ෂාය යන චතුර්විධ ආයර්‍ය්‍යෙර්‍ය්‍යාපථබ්‍රහ්මවිහරණයෙන්
යුක්තව වැඩවාසය කර වදාරණසේක.

අථඛො, ඉක්බිත්තෙන්; අනාථපිණ්ඩිකො ගහපති, යථොක්තප්‍රකාරයෙන්
ගුණගණොපශොභිතවූ අනාථපිණ්ඩික නම් ගෘහපතිතෙම; භගවා, අපරි
මිතනිරූපමප්‍රභාව ශීලාද්‍යගුණවිශෙෂ සමඞ්ගිතත්වයෙන් භාග්‍යවත්වූ සර්වඥ
රාජොත්තමයානන්වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එතැන්හි;
උපසංකමි, එළඹියේය; (නොහොත්) භගවා, ප්‍රමාණාතික්‍රාන්තලොකධාතු
ගත අනන්තාපර්‍ය්‍යන්තසත්වයන්ට උත්තම ගෞරවස්ථානීයවූ සර්වඥරාජොත්ත
මයානන්වහන්සේ; යෙන, යම් නානාප්‍රකාරගුණවිශෙෂාධිගමයක් හෙතු කො
ට ගෙණ මධුරඵල රසාස්වාදනය පිණිස කීරකොකිලශාරිකාදි පක්ෂිසමූහයා
විසින් නිත්‍යඵලහරිත මහාවෘක්ෂයක් මෙන් දිව්‍යමනුෂ්‍යයන්විසින් එළඹිය
යුතු වේද; තෙන, ඒ කාරණයෙන්; උපසංකමි, තමා හුන්තැනින් නික්මැ තත්
තත් ප්‍රදෙශාතික්‍රමණය කොට සමීපස්ථව ගියේය; උපසංකමිත්වා, උපසඞ්ක්‍රම
ණක්‍රියාව අවසන් කොට (නොහොත්) යම් තැනකට ගියේ උපසඞ්ක්‍රාන්ත
නම් වීද ඒ උපගතස්ථානයෙන් ප්‍රශ්නවිචාරණ ධර්මශ්‍රවණාදි කෘත්‍යයට
යොග්‍යවූ ආසන්නතරස්ථානයට පැමිණ; භගවන්තං, ඓශ්වර්‍ය්‍ය පූර්ණ යශශ්‍රී
සංකල්ප සිඩි ප්‍රයත්නය යන ෂාඩ්ගුණ්‍යයෙන් සමුපෙතවූ සර්වඥයන් වහන්
සේට; අභිවාදෙත්වා, භයලොභාදීන් විනා භක්තිප්‍රෙමාතිභාවනත්‍යොත්තමා
ඞ්ගයෙන් නමස්කාර කොට; එකමන්තං නිසීදි, අතිදූරසන්නප්‍රතිබාධක

ඝනතප්‍රදෙශපශවාදාභිමුඛ ෂඩ්භිසදෘශදෙෂයන් වර්ජිත කොට යටත් පිරිසෙසින් වැඩහුන් තැනට පස්රියනකින් දුරුව එකත්පසෙක්හි හුන්නේය; එකමන්තං නිසින්නං ඛො, එකත්පස්ව, හුන්නාවූ; අනාථපිණ්ඩිකං ගහපතිං, අනාථපිණ්ඩික නම්වූ ගෘහපතියහට ; භගවා, ශතපුණ්‍යලක්‍ෂණධරත්වාදි භාග්‍යයෙන් යුක්තවූ සර්වඥයන් වහන්සේ; එතදවොච, මේ මතු කියන ලද්දවූ වචනයෙන් මෙසේ වදාළසේක—කෙසේද ?

ගහපති, එම්බා ගෘහපතිය ; ඉට්ඨා, අනිෂ්ටප්‍රතිපක්‍ෂපයෙන් ඉෂ්ටවූ ; කන්තා, සිත්හි ප්‍රියවශයෙන් ප්‍රවිෂ්ටවචනාර්ථයෙන් කාන්තවූ ; මනාපා, සිත්පිනවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ථයෙන් මනාපවූ ; ඉමෙ චත්තාරො ධම්මා, මේ චතුර්විධවූ ධර්මයෝ ; ලොකස්මිං, සත්වලොකයෙහි ; දුල්ලභා, පරම දුර්ලභ වන්නාහුය ; කතමෙ චත්තාරො, ඒ චතුර්විධවූ ධර්මයෝ නම් කවරහුද ? මෙ, මට ; භොගා, භුජිතව්‍යාර්ථයෙන් භොග නම්වූ රූපාදි පංචකාමයන්ට විෂයවූ උපභොග පරිභොග වස්තූහු ; ධම්මෙන සහ, ධර්මූපඝාතනය නො කොට ස්වධර්මය හා සමග (නොහොත්) සෙනාපති සිටුතනතුරු ආදී කාරණා සහිතව ; උප්පජ්ජන්තු ඉති, උපදිත්වයි යන ; ඉට්ඨො, අනිෂ්ටප්‍රතික්‍ෂෙපයෙන් ඉෂ්ටවූ ; කන්තො, සිත්හි ප්‍රියවශයෙන් ප්‍රවිෂ්ටවනාර්ථයෙන් කාන්තවූ ; මනාපො, සිත්පිනවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ථයෙන් මනාපවූ ; ලොකස්මිං, ලොකයෙහි ; දුල්ලභො, පරමදුර්ලභවූ ; අයං පඨමො ධම්මො, මේ ප්‍රථම ධර්මය නම් වන්නේය.

ධම්මෙන සහ, ධර්මය හා සමග ; භොගෙ ලද්ධා, වස්තූන් ලැබ ; ඤාතීහි සහ, මාතෘපක්‍ෂ පිතෘ පක්‍ෂය යන උභය පක්‍ෂයෙහි නෑයන් හා සමග ; උපජ්ඣායෙහි සහ, "සුඛදුක්ඛෙසු උපනිජ්ඣායිතබ්බතො උපජ්ඣායො"යි, කීහෙයින් සුවදුක් දෙක්හි සමව සිතන හෙයින් උපාධ්‍යාය සඞ්ඛ්‍යාතවූ සංදෘෂ්ට සම්භක්ත මිත්‍රයන් හා සමග ; මං, මාගේ ; යසො, කීර්තිප්‍රශංසාදිය ; අබ්භුග්ගච්ඡතු ති, ඉතා උස්වැ පැනනැගේවයි යන ; ඉට්ඨො, අනිෂ්ටප්‍රතික්‍ෂෙපයෙන් ඉෂ්ටවූ ; කන්තො, සිත්හි ප්‍රියවශයෙන් ප්‍රවිෂ්ටවනාර්ථයෙන් කාන්තවූ ; මනාපො, සිත්පිනවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ථයෙන් මනාපවූ ; ලොකස්මිං, ලොකයෙහි ; දුල්ලභො, පරම දුර්ලභවූ ; අයං දුතියො ධම්මො, මේ ද්විතීය ධර්මය නම් වන්නේය.

ධම්මෙන සහ, ධර්මය හා සමග ; භොගෙ ලද්ධා, භොගයන් ලැබ ; ඤාතීහි සහ, නෑයන් හා සමග ; උපජ්ඣායෙහි සහ, යථොක්තවූ මිත්‍රයන් හා සමග ; යසං ලද්ධා, කීර්තිප්‍රශංසාදිය ලැබ ; චිරං, බොහෝ කලක් ; ජීවාමි, ජීවත්වෙමි ; දීඝමායුං පාලෙමීති, දීර්ඝකාලයක් ආයුපාලනය කෙරෙමි යන ; ඉට්ඨො, අනිෂ්ටප්‍රතික්‍ෂෙපයෙන් ඉෂ්ටවූ ; කන්තො, සිත්හි ප්‍රියවශයෙන් ප්‍රවිෂ්ටවන අර්ථයෙන් කාන්තවූ; මනාපො, සිත්පිනවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ථයෙන් මනාපවූ ; ලොකස්මිං, ලොකයෙහි; දුල්ලභො, පරම දුර්ලභවූ ; අයං තතියො ධම්මො, මේ තෘතීය ධර්මය නම් වන්නේය.

ධම්මෙන සහ, ධර්මය හා සමග ; භොගෙ ලද්ධා, වස්තූන් ලැබ ; ඤාතීහි සහ, නෑයන් හා සමග ; උපජ්ඣායෙහි සහ, උපාධ්‍යායසඞ්ඛ්‍යාතවූ මිත්‍රයන් හා සමග ; යසං ලද්ධා, කීර්තිප්‍රශංසාදිය ලැබ ; චිරං, බොහෝ කලක් මුළුල්ලෙහි ; ජීවිත්වා, ජීවත්ව ; දීඝමායුං පාලෙත්වා, බොහෝ කාලයක් මුළුල්ලෙහි ආයු පාලනය කොට ; කායස්ස භෙදා, කරජකායයාගේ භෙදයෙන් ; පරං මරණා, චුතිචිත්තයෙන්* මත්තෙහි ; සුගතිං, ශොභනකර්මයෙන් යායුතු හෙයින් සුගති නම්වූ ; සග්ගං, සියලු පඤ්චකාමසම්පත්තීන් සුදු අග්‍ර හෙයින් ස්වර්ග නම්වූ ; ලොකං, දිව්‍යලොකයෙහි ; උපපජ්ජාමීති, උපදිමි යන ; ඉට්ඨො, අනිෂ්ට ප්‍රතික්ෂෙපයෙන් ඉෂ්ටවූ ; කන්තො, සිත්හි ප්‍රියවශයෙන් ප්‍රවිෂ්ටවනාර්ථයෙන් කාන්තවූ ; මනාපො, සිත්පිනවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ථයෙන් මනාපවූ ; ලොකස්මිං, ලොකයෙහි ; දුල්ලභො, පරම දුර්ලභවූ ; අයං චතුත්ථො ධම්මො, මේ චතුර්ථවූ ධර්මය නම් වන්නේය ; ගහපති, එම්බා ගෘහපතිය ; ඉට්ඨා, අනිෂ්ටප්‍රතික්ෂෙපයෙන් ඉෂ්ටවූ ; කන්තා, සිත්හි ප්‍රියවශයෙන් ප්‍රවිෂ්ටවන අර්ථයෙන් කාන්තවූ ; මනාපා, සිත්පිනවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ථයෙන් මනාපවූ ; ඉමෙ ඛො චත්තාරො ධම්මා, මේ චතුර්විධවූ ධර්මයෝ වනාහි ; ලොකස්මිං, ලොකයෙහි ; දුල්ලභා, අත්‍යන්ත පරම දුර්ලභ වන්නාහුයයි වදාළසේක.

(මෙසේ සත්වලොකයෙහි අත්‍යන්තපරම දුර්ලභවූ සතර ධර්මයක් වදාරා එම චතුර්විධ ධර්මයන්ගේ ප්‍රතිලාභය පිණිස අනිකුදු සතර ධර්මයක් වදාරන්නාවූ සතරමර ලොකවිනාශමාණිකාවූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ "ඉමෙසං ඛො ගහපති චතුන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං" යනාදිවූ පාළිය වදාළසේක.)

ගහපති, එම්බා ගෘහපතිය ; ඉට්ඨානං, අනිෂ්ටප්‍රතික්ෂෙපයෙන් ඉෂ්ටවූ ; කන්තානං, සිත්හි ප්‍රියවශයෙන් ප්‍රවිෂ්ටවනාර්ථයෙන් කාන්තවූ ; මනාපානං, සිත්පිනවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ථයෙන් මනාපවූ ; ලොකස්මිං, ලොකයෙහි ; දුල්ලභානං, දුර්ලභවූ ; ඉමෙසං ඛො චතුන්නං ධම්මානං, මේ චතුර්විධවූ ධර්මයන්ගේ ; පටිලාභාය, ප්‍රතිලාභය පිණිස ; චත්තාරො ධම්මා, සතරධර්ම කෙනෙක් ; සංවත්තන්ති, පවත්නාහුය ; කතමෙ චත්තාරො, ඒ සතර ධර්මයෝ නම් කවුරුද ? සද්ධා සම්පදා, ශ්‍රද්ධාසම්පත්තියය ; සීලසම්පදා, ශීල සම්පත්තියය ; චාගසම්පදා, ත්‍යාගසම්පත්තියය ; පඤ්ඤාසම්පදා, ප්‍රඥාසම්පත්තියයි ; ගහපති, එම්බා ගෘහපතිය ; සද්ධාසම්පදා, ශ්‍රද්ධා සම්පත්තියතොමෝ ; කතමා ච, කවරීද ? ගහපති, එම්බා ගෘහපතිය ; ඉධ, මේලොකයෙහි ; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවක තෙම ; සද්ධො හොති, රත්නත්‍රය හැදහීම ලක්ෂණ කොට ඇත්තාහුද කර්මඵල හැදහීම ලක්ෂණ කොට ඇත්තාහුද ලෞකික ලොකොත්තර ශ්‍රද්ධායෙන් සමන්විතවූයේ ; තථාගතස්ස, සර්වඥයන් වහන්සේගේ ; බොධිං, අර්හත්මාර්ගය ; (නොහොත්) සර්වඥතාඥාන සඞ්ඛ්‍යාතබොධිය ; සද්දහති "ඉතිපිසො භගවා අරහං සම්මා–පෙ–බුද්ධො භගවාති" කියා ශීලසමාධ්‍යාදී

---

* 'මරණින්,'යි සමහර.

ලෞකිකලොකොත්තර බුදුගුණ අදහන්නේය—හේ කෙසේදයත් ?

සො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; ඉතිපි අරහං, සර්වක්ලේශයන් කෙරෙන් දුරුවූ බැවින්ද රාගාදි ක්ලේශ නැමැති සතුරන් මාර්ගඥානයෙන් සමූලඝාතව නැසූ හෙයින්ද සංසාරචක්‍රයාගේ අර කැඞූ හෙයින්ද දිව්‍යබ්‍රහ්ම නාග සුපර්ණ ගරුඩ ගන්ධර්ව සිද්ධවිද්‍යාධරාදීන් විසින් කරණලද උදාර ප්‍රත්‍යය ප්‍රතිපත්තිපූජාවට යොග්‍ය හෙයින්ද ලොභමොහාදි පාපහෙතූන් සුප්‍රහීණ බැවින්ද රහසත් පව් නොකරණ හෙයින්ද යන මෙතෙක් කාරණයෙන් 'අර්හත්' නම් වනසේක.

සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි සම්මා සම්බුද්ධො, අවිපරීත කොට පරප්‍රත්‍යය නොවී ස්වලක්ෂණ සාමාන්‍යලක්ෂණවශයෙන් විශිෂ්ටඥානයෙන් දතයුතු චතුස්සත්‍ය ධර්මයන් පූර්වභාගයෙහි විදර්ශනාඥානයෙන්ද අධිගමක්ෂණයෙහි මාර්ගඥානයෙන්ද අපර භාගයෙහි සර්වඥතාඥානයෙන්ද අවබොධ කෙළේය යන මෙතෙක් කාරණයෙන් 'සම්‍යක්සම්බුද්ධ' නම් වනසේක.

සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි විජ්ජාචරණසම්පන්නො, සර්වවිෂය විදිතකරණාර්ථයෙන් විද්‍යා නම්වූ විදර්ශනාඥානමනොමයඍද්ධිවිධදිව්‍යශ්‍රොත්‍රපරචිත්තවිජානනපූර්වෙනිවාසානුස්මෘති දිව්‍යචක්ෂුරභිඥාදි අෂ්ටවිද්‍යායෙන් හා ශීලසංවරය ඉන්ද්‍රියෙහි ගුප්තද්වාරබවය භොජනයෙහි මාත්‍රාඥබවය ජාගර්‍ය්‍යානුයොගය ශ්‍රද්ධාය හිරිය අපත්‍රපා බහුශ්‍රැත්‍යය වීර්‍ය්‍යය ස්මෘතිය ප්‍රඥාය යන මේ එකොළොස හා රූපාවචර ධ්‍යාන සතරය යන පසළොස්චරණධර්මයෙන් යුක්තහෙයින් 'විජ්ජාචරණසම්පන්න' නම් වනසේක.

සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි සුගතො සොභනගති සඞ්ඛ්‍යාත විශුද්ධාර්‍ය්‍යමාර්ගයෙන් නිර්වාණමාර්ගයට ක්ෂිප්‍රාභිඥාවශයෙන් ගිය හෙයින්ද (නොහොත්) දීපංකරපාදමූලයෙහි පටන් බොධිමූලය දක්වා සමත්‍රිංශත් පාරමිධර්මයන් පුරන්නාහු අවිපරීතප්‍රතිපත්තියෙන් සියලු සත්වයන්ට හිත සැප එළවමින් සාස්වතොච්ඡෙද කාමසුඛ ආත්මක්ලමථය යන චතුරන්තරයට නො ගොස් ආර්‍ය්‍යමාර්ගගතියෙන් ගිය හෙයින්ද සකලසංස්කාරප්‍රවෘත්තීන්ගේ අභාවයට යෙත්ද ඒකාන්තසුන්දරවූ අමෘතමහානිර්වාණයට ගියහෙයින්ද තත් තත් මාර්ගයෙන් ප්‍රහීණක්ලේශයන්ගේ අපුනරාවෘත්ති කරණවශයෙන් මනාකොට ගිය හෙයින්ද යුක්තවචනයක් නිෂ්පාද්‍ය කල්හි සත්‍යසාර්ථ ප්‍රියවචනයන් කථනය කරණ හෙයින්ද ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණ සීතානුව්‍යඤ්ජනව්‍යාමප්‍රභානුරඤ්ජිත රූපකාය සම්පත්තියක් ඇතිබැවින්ද ද්‍රැත විලම්බිත ස්ඛලිතානුකර්ෂණ නිෂ්පීඩනොත්කුටිලතාකුලතාදි දොෂරහිත අපහාසිත රාජහංසවෘෂභවරවාරණමෘගරාජගමනවිලාශඇති ශොභනවූ කායගමනින් හා විපුලවිමලකරුණාස්මෘතිවීර්‍ය්‍යාදි ගුණවිශෙෂ සහිතවූ ඥානගමනින් යුක්ත හෙයින්ද යන මෙතෙක් කාරණයෙන් 'සුගත' නම් වනසේක.

සො භගවා-පෙ-ඉතිපි ලොකවිදූ. "එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා තිස්සො වෙදනා,

චත්තාරො ලොකා චතුබ්බිධාහාරො, පඤ්ච ලොකා පඤ්චුපාදානක්ඛන්ධා" යනාදීන් දක්වනලද ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධසංස්කාරයන්ගේ සමූහසඞ්ඛ්‍යාත සංස්කාර ලොකය ද "සබ්බෙසම්පි සත්තානං ආසයං ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති අප්පරජක්ඛෙ ජානාති මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ" යනාදීන් දක්වනලද ඉන්ද්‍රිය ප්‍රතිබද්ධස්කන්ධයන්ගේ සමූහසඞ්ඛ්‍යාත සත්ත්වලොකය ද "යාවතා චන්දිම සූරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා" යනාදීන් දක්වනලද අයාමින් විතරින් දොළොස් ලක්ෂ තුන් දහස් සාරසිය පණස් යොදුන් පමණ ඇති වටින් සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් පමණ ඇති චක්‍රවාටය, දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් පමණ බොලය ඇති මහා පස්පොළොවය, ඒ පස්පොළොව දූරූ රැඳවූ සාරලක්ෂ අසූදහසක් යොදුන් පමණ බොලය ඇති දිය පොළොවය, ඒ දිය පොළොව දූරූ නවලක්ෂ සැටදහසක් යොදුන් පමණ වාපොළොවය, මෙසේ සිටි මෙර සුවාසූ දහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලී සිටී සුවාසූ දහසක් යොදුන් පමණ නැඟී සිටි මහමෙරු පර්වතයට අර්ධඅර්ධප්‍රමාණයෙන් සමුද්‍රයෙහි ගැලී නැඟී දෙව යක්ෂවාස නානාවිධ රත්නයෙන් විචිත්‍ර යුගන්ධර ඊෂධර කරවීක සුදර්ශන නෙමින්ධර විනතකාදි සප්තකුල පර්වතයෝය, පන්සියයක් යොදුන් පමණ උසඇති අයමින් විතරින් තුන් දහසක් යොදුන් පමණ ඇති සුදර්ශන චිත්‍රකූට කෛලාශකූට යනාදී සුවාසූ දහසක් කූටයෙන් ප්‍රතිමණ්ඩිතවූ හිමාල පර්වතය, මෙම දඹදිවට සලකුණුවූ මුලසිට වෙළප පණස්යොදුනක් පමණ ඇත, එසේම පණස්යොදුන් පමණවූ පඤ්චමහා ශාඛාවන් ඇති සියක් යොදුන් පමණ විස්තාරොද්ධ ඇති සිසාරා තුන්සියයක් යොදුන් පමණ ඇති මහාජම්බුවෘක්ෂය දෙයාසූදහසක් පමණ සාගරයෙහි ගැලීසිටි දෙයාසූදහසක් යොදුන් පමණ නැඟී සිටි සක්වළගලය, අයමින් විතරින් උසින් එකුන් පණස් යොදුන් සඳමඬලය, එසේම පණස් යොදුන් හිරුමඬලය දසදහසක් යොදුන් පමණ ඇති සක්දෙව්රජහට නිවාසවූ තව්තිසා භවනය, එසේම දසදහසක් යොදුන් පමණ අසුරභවනය හා අවීචිමහානරකය හා ජම්බුද්වීපය, සත්දහසක් යොදුන් පමණ ඇති අපරගොයානය හා පූර්වවිදෙහය, අටදහසක් යොදුන් පමණ ඇති උතුරුකුරුදිවයිනය යන ක්ෂුද්‍රද්වීප පන්සියයක් පිරිවරකොට ඇති සතරමහාද්වීපය යනාදී වශයෙන් අනන්තාපරියන්ත ලොකධාතුයයි කියනලද අනින්ද්‍රිය ප්‍රතිබද්ධ රූපකාය යන්ගේ සමූහසඞ්ඛ්‍යාත අවකාශලොකය ද යන මේ ත්‍රිවිධලොක යම සර්වප්‍රකාරයෙන් අවබොධ කෙළේය යන මෙතෙක් කාරණයෙන් 'ලොකවිදූ' නම් වනසේක.

සො භගවා-පෙ-ඉතිපි අනුත්තරො පුරිසදම්මසාරථි, "ඉමස්මිං ලොකෙ පරස්මිං වා පන බුද්ධෙන සෙට්ඨො සදිසො න විජ්ජති" යනු හෙයින් ශීල සමාධි ප්‍රඥා විමුක්ති ඥානදර්ශනාදී ගුණවිශෙෂයෙන් ආත්මසදෘශාධික පුද්ගලාන්තරයක්හු නැති බැවින් ද දම්‍යය හයි කියන ලද අපලාල නාගරාජ චූලොදර අග්නිශිඛ ධූමශිඛ ධනපාලාදිවූ තිරශ්චීන පුරුෂයන්ද සච්චක නිගණ්ඨ

සූත්‍ර අම්බට්ඨසීනාතවක පොක්ඛරසාති සොණදණ්ඩ කූටදන්ත ඝොටමුඛ උපාලිගෘහපති ආදිවූ මනුෂ්‍යපුරුෂයන්ද ආලවක සූචිලෝම ඛරලෝම යක්ෂ ශක්‍රදෙවරාජ බකබ්‍රහ්මාදිවූ අමනුෂ්‍යපුරුෂයන්ද යන කායවාක් සමාතාබීයෙහි යෙදිය යුතුවූ පුරුෂයන් සුදුසු සුදුසු පරිද්දෙන් තද්ධනවිනයාදියෙහි පිහිටුවන හෙයින්ද යන මෙතෙක් කාරණයෙන් 'අනුත්තරපුරිසදම්මසාරථී' නම් වනසේක.

ඉතිපි සත්ථා දේවමනුස්සානං, උත්කෘෂ්ටසත්වභව්‍යපුද්ගලපරිච්ඡේද වශයෙන් දිව්‍යමනුෂ්‍යයන්ට හා උපනිශ්‍රය සම්පත්තිප්‍රදානයෙන් තිර්‍යග්ගතයන්ට ද යථාශීලෛහිකාමුෂ්මිකපරමපුරුෂාර්ථය යන මෙයින් අනුශාසනා කරණ හෙයින්ද චෞරකාන්තාරාදියෙන් අතික්‍රමණය කොට නිරුපද්‍රවස්ථානයට පමුණුවන්නාවූ සාර්ථවාහකයක්හුමෙන් ජාතිකාන්තාරාදියෙන් සමස්ත සත්වයන් තරණය කොට නිර්වාණක්ෂේමභූමියට පමුණුවන්නේය යන මෙතෙක් කාරණයෙන්ද 'ශාස්තෘ' නම් වනසේක.

ඉතිපි බුද්ධෝ, භූත භවිෂ්‍යත් වර්තමාන ස්ථාවරජඞ්ගමනිත්‍යානිත්‍යාදි සකලඥෙය මණ්ඩලය කරතලාමලකයක්මෙන් අවබෝධ කළ හෙයින්ද (නොහොත්) සම්මා සම්බුද්ධ පදයෙන් ප්‍රතිවේධඥානානුභාවය ප්‍රකාශිතබැවින්ද නානානය නිපුන අනේකාධ්‍යාශ සමුත්ථානාර්ජවව්‍යඤ්ජනසම්පන්න විවිධප්‍රාතිහාර්‍ය්‍යයෙන් යුක්ත සද්ධර්මදේශනාඥානානුභාව සමායෝගයෙන්ද යන මෙතෙක් කාරණයෙන් 'බුද්ධ' නම් වනසේක.

ඉතිපි භගවා, ලෞකිකලෝකෝත්තර හිතසුඛනිර්වර්තක දානශීලාදි පාරප්‍රාප්ත භාග්‍යයෙන් යුක්තබැවින් ද ලෝභද්වේෂමෝහාවිපරීතමනසිකාරාදිවූ ක්ලේශශතසහස්‍රයෙන් හා සංක්ෂේපයෙන් ක්ලේශස්කන්ධාභිසංස්කාර මෘත්‍යුදේවපුත්‍රමාරයන් භග්න කළහෙයින්ද ඓශ්වර්‍ය්‍යපූර්ණ්‍ය යසශ්‍රීසංකල්පසිද්ධිප්‍රයත්නය යන ෂාඩ්ගුණ්‍යයෙන් පරිපූර්ණ හෙයින්ද කුශලාදි ධර්මයන් පඤ්චස්කන්ධද්වාදශායතනාෂ්ටාදශධාතු චතුස්සත්‍ය ද්වාවිංශතීන්ද්‍රිය ද්වාදශාඞ්ග ප්‍රතීත්‍යසමුත්පාද චතුස්ස්මෘතිසප්‍රස්ථානසම්‍යක් ප්‍රධානාදි වශයෙන් විභාග කළහෙයින්ද දිව්‍යබ්‍රහ්මාර්‍ය්‍යවිහාරකාය චිත්තෝපධිවිවේක ශූන්‍යතාප්‍රණිහිත නිමිත්තවිමෝක්ෂ ප්‍රඥාසිංහාදිවූ ලෞකිකලෝකෝත්තර උත්තරිමනුෂ්‍යධර්මයන් භජනය කළහෙයින් ද කාමරූපාරූපසඞ්ඛ්‍යාතභවත්‍රයෙහි තෘෂ්ණාගමනය අශීත්මාශීඥාන මුඛයෙන් වාන්තහෙයින්ද යන මෙතෙක් කාරණයෙන් 'භගවත්' නම් වනසේකැයි යනාදීන් සර්වඥරාජෝත්තමයානන්වහන්සේගේ අශීත්මාශීහාදි බෝධිය අදහන්නේය; ගහපති, එම්බා ගෘහපතිය; අයං සද්ධාසම්පදා, මේ ශ්‍රද්ධාසම්පත්තියයි කියා; වුච්චති, කියනු ලැබේ. මෙහි දක්වනලද ශ්‍රද්ධාසම්පත්තිය නම්,

“සද්ධා බලං විරියබලං හිරිඔත්තප්පියං බලං,
සතිබලං ච සමාධිඤ්ච පඤ්ඤා, මෙ සත්තමං බලං”යි.

විදූරණලද සප්තබලයන් කෙරෙහි පළමුවන බලය නම් වන්නේය.

“සද්ධාධනං සීලධනං හිරිඔත්තප්පියංධනං,
සුතධනං ච චාගොච පඤ්ඤා, වෙ සත්තමං ධනං” යි.

වදාරණලද සප්තවිධ ධනයන් කෙරෙහි පළමුවන ධනය නම් වන්නේය.

“යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ සද්ධා භවිස්සන්ති වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානී” යනාදීන් වදාරණලද සප්ත අපරිහානියධර්මයන් කෙරෙහි පළමුවන අපරිහානියධර්මය නම් වන්නේය.

“සත්තිමෙ භික්ඛවෙ සද්ධම්මා, කතමෙ සත්ත? සද්ධො හොති හිරිමා හොති ඔත්තප්පී හොති බහුස්සුතො හොති ආරද්ධවිරියො හොති සතිමා හොති පඤ්ඤවා හොති ඉමෙ ඛො භික්ඛවෙ සත්තසද්ධම්මාති” වදාරණ ලද සප්ත සද්ධර්මයන් කෙරෙහි පළමුවන සද්ධර්මය නම් වන්නේය.

මෙම ශ්‍රද්ධාවෙහි අනුසස්නම් කවරහයත්? මේ ලෙව්හි යම් පමණ සත්පුරුෂකෙණෙක් ඇද්ද? ඔහු සියල්ලෝම ශ්‍රද්ධාවන්ත පුද්ගලයාහටම පළමුකොට අනුග්‍රහ කරන්නාහුද වෙති ඔහුකරම එළඹෙන්නාහුද වෙති ඔහුගේම දෙය්‍යධර්මය ප්‍රතිග්‍රහණය කරන්නාහුද වෙති ඔහටම දහම් දෙසන්නාහුද වෙති ශ්‍රද්ධාවන්ත තැනැත්තේ කාබුන්මරණින්මත්තෙහි සුගතිස්වර්ගසඞ්ඛ්‍යාත දිව්‍යලොකයෙහි උපදී—එයින් වදාළහ.

“පඤ්චිමෙ භික්ඛවෙ සද්ධෙ කුලපුත්තෙ ආනිසංසා, කතමෙ පඤ්ච? යෙ තෙ භික්ඛවෙ ලොකෙ සන්තො සප්පුරිසා තෙ සද්ධංයෙව පඨමං අනුකම්පන්ති නො තථා අසද්ධං, සද්ධංයෙව පඨමං උපසඞ්කමන්තා උපසඞ්කමන්ති නො තථා අස්සද්ධං, සද්ධස්සෙව පඨමං පටිගණ්හන්තා පටිගණ්හන්ති නො තථා අස්සද්ධස්ස, සද්ධස්සෙව පඨමං ධම්මං දෙසෙන්තා දෙසෙන්ති නො තථා අස්සද්ධස්ස, සද්ධො කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චසද්ධෙ කුලපුත්තෙ ආනිසංසාති.”

තවද චාතුර්මහාපථයෙහි සුජාතවූ නිග්‍රොධවෘක්ෂය බොහෝ පක්ෂිසමූහයාට ප්‍රතිසරණ වේද එපරිද්දෙන් ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රතෙම භික්ෂූන්නාදී බොහෝ පර්ෂදහට ප්‍රතිසරණ වේ—එයින් වදාළහ.

“සෙය්‍යථාපි භික්ඛවෙ සුභූමියං චාතුම්මහාපථෙ මහානිග්‍රොධො සමන්තා පක්ඛීනං පටිසරණං හොති, එවමෙව ඛො භික්ඛවෙ සද්ධො කුලපුත්තො බහුනො ජනස්ස පටිසරණං හොති භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානන්ති.”

තවද හිමවත් පර්වතරාජයා නිසා මහාවෘක්ෂයෝ ශාඛා පත්‍ර ත්වච පපටිකා සාරය යන පඤ්චප්‍රකාරවෘද්ධීන් වැඩෙන්නාහු වෙද්ද, එපරිද්දෙන් අනෙකවා සිකජනයෝ ශ්‍රද්ධාශීලශ්‍රැතත්‍යාගප්‍රඥාය යන මේ පඤ්චප්‍රකාරවෘද්ධීන් වැඩෙන්නාහු වෙත් - එයින් වදාළහ.

“හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪන්ති කතමාහි පඤ්චහි? සාඛා පත්තෙන වඩ්ඪන්ති තචෙන වඩ්ඪන්ති පෙ

ග්ගුණා වඩ්ඪන්ති සාරෙන වඩ්ඪන්ති හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා ඉමාහි පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪන්ති-එවමෙවඛො භික්ඛවෙ සද්ධං කුලපතිං නිස්සාය අන්තොජනො පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪන්ති—කතමෙහි පඤ්චහි? සද්ධාය වඩ්ඪති සීලෙන වඩ්ඪති සුතෙන වඩ්ඪති චාගෙන වඩ්ඪති පඤ්ඤාය වඩ්ඪති සද්ධං හි භික්ඛවෙ කුලපතිං නිස්සාය අන්තොජනො ඉමාහි පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪන්ති."

තවද මේ ලෝකයෙහි යම් පුද්ගලයෙක් පුත්‍රධනධාන්‍යාදිවූ ලාභයන් ලබන්නේ මිථ්‍යාදෘෂ්ටිකමිථ්‍යාප්‍රතිපන්න ශ්‍රමණබ්‍රාහ්මණයන්කෙරෙහි ප්‍රසන්නවශයෙන් ශ්‍රද්ධාලාභයද ලබන්නේය ඒ ලාභයෝ හීණය ග්‍රාම්‍යය පෘථග්ජනකය නිර්වාණය පිණිස නොවන්නේය, යමෙක්වනාහි බුද්ධාදීන් කෙරෙහි අතිප්‍රසන්නවශයෙන් ශ්‍රද්ධාලාභය ලබන්නේද ඒ ලාභය දුඃඛදෞර්මනස්‍යයන්ගේ විනාශය පිණිසද ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමය පිණිසද නිර්වාණයාගේ සාක්ෂාත් කිරීම පිණිසද පවත්නාහෙයින් සියලු ලාභයක් කෙරෙන් අග්‍රලාභය නම් වන්නේය--එයින් වදාළහ.

"ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො පුත්තලාභම්පි ලභති දාරලාභම්පි ලභති ධනලාභම්පි ලභති උච්චාවචං වා පන ලභති සමණෙ වා බ්‍රාහ්මණෙ වා මිච්ඡාදිට්ඨිකෙ මිච්ඡාපටිපන්නෙ සද්ධං ලභති අත්ථෙව සො ච සො භික්ඛවෙ ලාභො න සො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, සො න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බාණාය සංවත්තති, යො ච ඛො භික්ඛවෙ තථාගතෙ වා තථාගතසාවකෙ වා සද්ධං පටිලභති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො එතදනුත්තරියං භික්ඛවෙ ලාභානං සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථංගමාය ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං තථාගතෙ වා තථාගතසාවකෙ වා සද්ධං පටිලභති නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො ඉදං වුච්චති භික්ඛවෙ ලාභානුත්තරියං"—සී.

එබැවින් කුශලධර්මයෙහි නියුක්තවූ පුරුෂයන් විසින් ශ්‍රද්ධාදියෙහි පිහිටා ස්වර්ගමොක්ෂසම්පත් ලැබීමට උත්සාහ කටයුතු.

ගහපති, එම්බා ගෘහපතිය; සීලසම්පදා, ශීලසම්පත්තිතොමෝ; කතමා ච, කවරීද? ගහපති, එම්බා ගෘහපතිය; ඉධ, මේ ලෝකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; පාණාතිපාතා, ප්‍රාණඝාතචෙතනාසඞ්ඛ්‍යාත දුශ්ශීල්‍යයෙන්; පටිවිරතො හොති, ආදීනව දැනීම් වශයෙන් විශෙෂයෙන් වැළැක්කේ වේද?

මෙහි දක්වනලද ප්‍රාණඝාතයෙහි ආදීනව නම් කවරහයත්? ප්‍රාණවධ කරණ්නූයේ මෙම ජන්මයෙහිම ශස්ත්‍රශෘඛාදීන් උපහත වෙයි, නරකයෙහි ඉපද අනෙක වර්ෂකොටිසහස්‍රයෙනි පැසී එයින් මුක්තවූ කලැ මහත් විභූතිඇති කුලයෙහි අපිරූපව උපන්නේද ඒනම් සම්පත් නොවළඳම නවයෞවනයෙහි මරණ ලැබේ-එයින් කීහ.

"සබ්බූපභොගධනධඤ්ඤවිසෙසලාභී
රූපෙන හො සමකරඬ්ජසනාතිහොපි,
සො යොබ්බනෙපි මරණං ලභතෙ අකාමං
කාමං සදූතු පරපාණහරො නරො හි" යි.

සමෙක් ද්‍රාණවධ කෙළේද ඔහට අන්තරීක්ෂයෙහිදු සිටිය සමුද්‍රමධ්‍යයෙහිදු සිටිය විදුරු ගුහාවටද වන පාපකර්මයෙන් මුක්ති නැත් - කෙසේදයත් ? කර්මාන්තයෙහි නොපවත්නා ගොණික්නු බැඳහොවා පිදුරුගිනින් දවා මැරූ මිනිසෙක් අවීචිමහානරකයෙහි ඉපද අනෙක වර්ෂකොටිසහස්‍රයෙහි පැසී එසින් මුක්තව ගියකලැ සියක්අත්බැවැ ආකාශ ගතකලද පිදුරු ගිනින් දැඩ මෙළේය.

බල්ලකුකර වැලිකළයක් බැඳ දියෙහි ගලා මැරූ ස්ත්‍රියක් අවීචියෙහි ඉපද අනේවාසුවහස් පැසී එයින් මිදී ගියකල්හි සියක් අත්බැවැ සමුද්‍රමධ්‍යගතක ලද කර වැලිකළ බැඳ දියෙහි ගලා මරණ ලද්‍ද.

ගොයකු තුඹසෙක තිරකොට හොවා සතියෙන් හළ ගොපළුදරුවෝ සත් දෙනෙක් ඔහු නොමැරූහෙයින් නිරා නොගොස් තුදුස් අත්බැවෙක පර්වත විවරයට වන්නාහු පහණින් පිහිතවූ ලෙණදොර ඇතිව සත්සත්දවස් නිරාහාර වූහු.

මෙසෙයින් අන්තරීක්ෂයෙදු සිටිය සමුද්‍රමධ්‍යයෙහිදු සිටිය විදුරුගුහාවටද වන පාපකර්මයෙන් මුක්ති නැත්-එයින් වදාළහ.

"න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා"-යී.

අපිච-මල්ලිකාදෙවී එක්ජන්මයෙක්හි කුලදුවක්වැ පතිකුලයෙහි වසන්නී අමුත්තක්හු දැක ඔහට බත්දීසපිව මස් සොයා නොලදින් පැසුලූ දොරහොත් එළියක හිස්සුන, ඒ පාපයෙන් අනේවාසුවහස් නරකයෙහි පැසී එයින් මිදී ගියකල උපනුපන්තන්හි ඒ එළියගේ ලොම්ගණිනින් හිස් සිඳුන් ලද්‍ද, එයින් කිව තමා දිනනා දෙවිකල්හි ජාතිස්මරණඥානයෙන් තමා විඳි දුක් දැක එසිය යක් රජුන් හිස්සිඳුවන්නට සිටි බරණැස් රජහට.

"එකිස්සා කණ්ඨං ඡෙදිත්වා ලොමගණනාය පච්චියං,
බහූනානං කණ්ඨ ජෙජාන කථං කාහසි බ්‍රාහ්මිය" යි.

එම දක්වන්නට වදාළහ බුදුහු.

"එවමෙ සන්තා ජනෙයන්ථං දුක්ඛායං ජාතිසම්භවො,
න පාණො පාණිනං හඤ්ඤෙ පාණඝාතීහි සොචති-යී.

අපිච-උත්තර සාමණේරයන්වහන්සේ සසර වසනකල ඒක්ජන්මයෙක ගම්දරුව ඉපද සෙසු බොහෝ ගම්දරුවන් හා සමග කෙළෙනාහු දවසෙක

කොසඹසුඹලකින් ඉතා සියුම්වූ කූරක් ගෙණ එක්මැස්සකු අල්වා ගෙණ ඒ කොසඹකූරෙහි උල හිඳුවාපූවැ, තවද එක්දවසෙක තමන්ට වැඩකැමතිව අව වාදකරන්නාවූ මෑනියන්ට කිපී දිවස්හුල හිඳුවයි කියා බිණූයේය, ඒ අකුශල කර්මදෙක නිසා සසර පන්සියයක් වාරයෙහි කොසඹදණ්ඩෙහි දිවස්හුල හුන්නේය, මෙසේ සුවදුක් විඳිමින් ඇවිදිනාසේක් මහත් පින්ඇතිහෙයින් අප බුදුන්ගේ ශාසනයෙහි පැවිදිව වසනසේක් පෙරකළ අකුශලකර්මය නොගෙවුනුහෙයින් වස්සකාර නම් මගධ මහාමාත්‍යයාගේ නියොගයෙන් කොසඹහුලක දිවස්හුල හිඳුවන ලද්දේය, ඒ බව ප්‍රකාශ කොට වදාරන්නාවූ බුදුරජානන්වහන්සේ–

''අතීතෙ කිර එකස්මිං ගාමෙ ඡමසි දාරකො,
දාරකෙහි සමාගම්ම කීළනෙනා කීළමණ්ඩලෙ.

ගහෙත්වා සුඛුමං සූකං තදා, ඡවං නිම්බ ජලලියා,
උත්තාසෙසි තදා සූකෙ ජීවමානකමක්ඛිකං.

අපරම්පි තෙ පාපකම්මං පවක්ඛාමි සුණොහි මෙ,
ඔවදන්ති හි තෙන ඡවං අතීතෙ සකමාතරං.

ජීවසූලෙ නිසීදාහි කොපෙනාහිසපි ඡකං,
ඉමෙහි වීහි පාපෙහි සරං සංසාර සාගරෙ.

පඤ්චජාතිසතෙ අවජ් ජීවසූලම්හි නිම්බජෙ,
අයං තෙ පුරිමාජාති එතනාපිච විපච්චිසො''–සී.

යනාදින් ඒ සාමණේරයන්ගේ අදහස්වූ පරිද්දෙන් ධර්මදෙශනා කොට වදාළ කල්හි දෙශනාව කෙළවර සියලු කෙලෙසුන් නසා ෂඩ්අභිඥ ලදින් රහත්වැ ඒ ළලින් අහසට පැනනැඟී වැඩිසේක, ප්‍රාණාතිපාතයෙන් අපායභාගී වන පරිද්ද මනුෂ්‍යත්වයක් ලද අල්පායුෂක වන පරිද්ද දක්වන්නට වදාළහ බුදුහු,

''පාණාතිපාතො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති තිරච්ඡානයොනිසංවත්තනිකො හොති පෙත්තිවිසයසංවත්තනිකො හොති යො සබ්බලහු සො පාණාතිපාතස්ස විපාකො මනුස්සභූතස්ස අප්පායුකසංවත්තනිකො හොති''–සී.

ප්‍රාණඝාතයෙහි අඞ්ගනම් කවරහයත් ?

''සත්තො සත්තො'ති සඤ්ඤා, ච වධකචිත්තමුපක්කමො,
තෙන ජීවිතනාසො ච සඟජා චතුරඞ්ගිකො''–සී.

සනුහෙයින් සතෙකු කෙරෙහි මොහු සතෙක යන සංඥාවද, මරම් යන සිත් විල්ලද, ඊට කරණලද උපක්‍රමයද (හෙවත්) ආයුධ දඬු ආදීන් ගැසීමද, ඒ උපක්‍රමයෙන් දිවිනැසීමදැයි යන තමාඅතින් සිද්ධවන ප්‍රාණහිංසාකොමෝ සතර අඞ්ගයක් ඇත්තේය.

"යථාභිප්පාය ආණත්ති තථා තං සම්පටිච්ඡනං,
පටිඤ්ඤං අවිනාසෙත්වා තථා'ව කරණම්පි ච.
පයොගෙ හෙඨා වුත්තෙසු ජඞ්ගෙසු සහ තෙහි ච,
ජලඞ්ගාණත්තියා හොති පාණහිංසා'ති දීපයෙ" යි.

යනුයෙයින් අභිප්‍රායවූ පරිද්දෙන් නියොගකිරීමය, එහෙයින්ම නියොග කරණලද්දාහුවිසින් ගිවිසුමය, ප්‍රතිඥා නොනසා එහෙයින්ම කිරීමය යන මේ තුන් අඞ්ගය හා යට කී ස්වහස්තප්‍රයොගයෙහි කියනලද සතර අඞ්ගයෙහි තමාඅතින් කරණ ප්‍රයොග හැර යට කී තුන් අඞ්ගයෙන් හා එක්ව ආණත්තියෙන් සිඬවන ප්‍රාණහිංසාකොමෙ? සඅඟක් ඇත්තීයයි දතයුක්තේයි—මේ ප්‍රාණඝාතයෙහි ආදීනව හා අඞ්ගයි එබැවින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් ප්‍රාණඝාතාදිය හැර කුශලධර්මයෙහි පිහිටා සගමොක්සිරිසැපත් අත්පත් කටයුතුනායි.

අදින්නාදානා, වස්තුස්වාමීහුවිසින් කයින් වචසින් මනසින් නුදුන් වස්තුව ග්‍රහණය කිරීම ස්වභාවකොට ඇත්තාවූ අදත්තාදානයෙන්; පටිවිරතො හොති, ආදීනව දැනීම් වශයෙන් විශෙෂයෙන් වැළැක්කේ වේ ද; මෙහි දක්වනලද අදත්තාදානයෙහි ආදීනව නම් කවරහයත් ?—පරද්‍රව්‍යයාගේ ආදානය ආත්මද්‍රව්‍යයාගේ විනාශයට හෙතු වේ, සොරකම් කළවුන්ගේ සම් සුවගන්නා බැවිනි, එයින් කිහ නීතිශාස්ත්‍රයෙහි "පරද්‍රව්‍යහරණමාත්මද්‍රව්‍යස්‍ය විනාශහෙතුඃ" යි පරද්‍රව්‍යහරණයෙන් මෙම ජන්මයෙහිම කණ්ටකලතාඝාතාදී අනෙකප්‍රකාර කම්කටුලට පැමිණෙත්-එයින් වදාළහ.

"යථාරූපං බොපන පාපකානං කම්මානං හෙතු රාජානො චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා කම්මකරණා කාරෙන්ති කසාහිපි තාලෙන්ති වෙත්තෙහිපි තාලෙන්ති අඩ්ඪදණ්ඩකෙහිපි තාලෙන්ති හත්ථම්පි ඡින්දන්ති පාදම්පි ඡින්දන්ති හත්ථපාදම්පි ඡින්දන්ති කණ්ණම්පි ඡින්දන්ති නාසම්පි ඡින්දන්ති කණ්ණනාසම්පි ඡින්දන්ති බිලඞ්ගථාලිකම්පි කරොන්ති සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති රාහුමුඛම්පි කරොන්ති ජොතිමාලකම්පි කරොන්ති හත්ථපජ්ජොතිකම්පි කරොන්ති එරකවත්තිකම්පි කරොන්ති චීරකවාසිකම්පි කරොන්ති එණෙය්‍යකම්පි කරොන්ති බලිසමංසිකම්පි කරොන්ති කහාපණකම්පි කරොන්ති ඛාරාපතච්ඡිකම්පි කරොන්ති (එරාපතච්ඡිකම්පි කරොන්ති) පළිඝපරිවත්තිකම්පි කරොන්ති පලාලපීඨකම්පි කරොන්ති තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති සුනඛෙහිපි ඛාදාපෙන්ති ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති අසිනාපි සීසං ඡින්දන්ති" යි.

මෙසේ අනෙකප්‍රකාරවූ නොවින්ද හැකිවූ නොබැළිය හැකිවූ ඉහාත්මභාවයෙහිදු නරක දුක් හා සමානවූ කම්කටුලට පමුණුවන හෙයින් චෞරකර්මයට වැඩි අනික් මරණපාශයෙක් ඇත්තේ නොවෙයි, එයින් කිහ නීතියෙහි—"න චෞර්‍ය්‍යාත්පරම්මෘත්‍යුපාශඃ" යි, මෙසෙයින් ජන්මාන්තරයට නොගෙන තුරුම් මහානර්ථකරවන බැවින් පරද්‍රව්‍යයා ගිනිසෙයින් විෂසෙයින් ආශීවිෂසත් සෙයින් ඝොරවිෂසර්පයක් සෙයින් දුරින්ම දුරුකටයුතු—එයින් කිහ,

"හස්තපාදශිරශ්ඡෙදී බහුවිඝනස්‍ය කාරණම්,
සර්වෙෂාමපි පරද්‍රව්‍යං විෂවත් කො න වාරයෙත්"-සී.

මෙසේ මෙම ජන්මයෙහිම මහත් අනයව්‍යසනයට පමුණුවන අදත්තාදානය කළාහු නරකයෙහි ඉපද අනෙක වර්ෂකොටිසහස්‍රයෙහි පැසී එයින් මිදී ගිය කල ප්‍රෙතාත්මභාවයට පැමිණ බලවත් ක්ෂුත්පිපාසායෙන් අභිභූතව අනෙක අනන්තකල්පයෙහි වෙහෙසී මිනිස්පියක් ලදහුනම් ඝදිව කපණව විවණව ධික් ධික් යන අක්ෂරශබ්දයෙන් සන්තර්ජිතව හීණපිරුණු වැරළිඇතිව හිස්පිරුණු උකුණන්ඇතිව බෙරපිරුණු දූලිඇතිව සිත්පිරුණු ශොකඇතිව ඇස්පිරුණු කඳුලුඇතිව මුඛපිරුණු වලප්ඇතිව කෑද නො ලදින් බත් නො ලදින් මනුෂ්‍යප්‍රෙතව වෙවුලමින් ඇවිදිත්-එයින් කීහ.

"යො යාචකො භවතී භින්නකපාලහත්ථො
මුණ්ඩො * ධිගන්තරසඨෙහි ච තජ්ජියනෙතො, †
භික්ඛං සදූරිහවනෙ සකුචෙලවාසො
දෙහෙ පරාපි පරවිත්තහරො නරො සො" සී.

අපිච-සොරසිතින් වස්ත්‍රයක් ගත් ස්ත්‍රියක් දෙවතාව ඉපද පවා ඒ පාපකර්මබලයෙන් බොහෝ කාලයක් මුලුල්ලෙහි වස්ත්‍ර නො ලද්දීය-හේ කෙසේ ද යත්? යටගිය දවස බරණැස් නුවර එක්තරා වෛශ්‍යවක් වන්නීය, ඕ තොමෝ ඉතා දිළිඳුහෙයින් තලමිරිකා තෙල් වෙළඳමින් ජීවත් වන්නීය, ඒ වෛශ්‍යාදූතොමෝ එක්දවසක් රා බී මත්ව නිදන මිනිසුන් දැක ඔවුන් හිණතිබුනු පිළී සොරා ඇර ගත්තීය, නැවත එක්දවසක් ගෙපිළිවෙළින් සිඟාවැඩි එක්රහත් තෙරකෙණකුන් වහන්සේ දැක සතුටුව තමාගේ ගෙට කැඳවා ගෙණ ගොස් ආසනයක වඩා හිඳුවා මිරිකමින් සිටි තලතෙල්මුසු තලමුරුවට වළඳවා පහන්සිතින් හිසට කුඩයක් අල්වා ගෙණ සිටියාය, ඒ රහත්තෙරුන්වහන්සේද එහිම හිඳ ඇගේ සිත සතුටුකරවා බණ වදාරා වැඩි සේක, ඕ තොමෝ කල්යාමකින් මිය ගොස් කුසල් අකුසල් මිශ්‍රහෙයින් මුහුදුමැද එක්රන්විමනෙක මහත් රූපශොභාවෙන් යුක්තව හුදකලාව උපන්නීය, එසේද උවත් මිනිසුන්ගේ පිළී සොරා ගත් පවින් පිළී නො ලබන්නීය, මෙසේ නැවත නැවත මිය ඒ රන්විමනෙහිම වසන්නී දහසක් අවුරුද්දෙන් අඟලක් උස වඩනා පොළොව එක්යොදුන් තුන් ගවුවක් වඩනාතුරු එක් බුද්ධාන්තරයක් නම් වේ, එතුවක් කල් මුලුල්ලෙහි පිළී නැතිව උපත්ව නග්නතියෙහිම උපන්නීය, ඉක්බිති අප බුදුරජානන්වහන්සේගේ කාලයෙහි සැවැත්නුවර වැසි සියයක් පමණ වෙළෙන්දෝ නැව් නැඟී සුවර්ණභූමියට රත්රන් පිණිස වෙළඳාමට යන්නෝ මහාසමුද්‍රයෙහි සුළං වේගයෙන් නැව ඔබමොබ දිවන්නේ ඒ රන්පාය සමීපයට ගියෝය.

---

* මුණ්ගො-සීද, මුණ්ඩො-සීද පොත්. † "තජ්ජයනෙතා"-සමහර.

ඉක්බිති ඒ විමන්දෙව්දුව විමානයෙහි සිට ඒ වෙළෙඳුන්ට තමාගේ විමානස දක්වා ඔවුන්ට නො පෙණීම සිට කථා කළාය, එකල ජ්‍යෙෂ්ඨ වෙළෙඳපුත්‍රතෙමේ එම්බා දෙව්දුව තී වසන රන්විමනින් නික්මැ අපට පෙණී සිට කථා කරවයි කීයේය, එබසට විමානප්‍රේතිය කියන්නී එම්බා සගයෙනි මම එළියට එන්ට ලජ්ජා ඇත්තෙමි ඇඳගන්නා පිළියක් නැත්තේයයි කීවාය, නැවත ඒ වෙළඳහු කියන්නාහු එසේවීනම් දෙව්දුව අපගේ උතුරුසළු දෙම්හයි ඒ ඇඳගෙණ රන්විමනින් නික්මැ අපට පෙණී සිටුවයි කියා ඒ තමන්ගේ උතුරුසළුව දුන්නාහුය, එකල දෙව්දු කියන්නී,

"හත්ථෙන හත්ථෙ දින්නං න මය්හං උපකප්පති,
එසෙත්ථුපාසකො සද්ධො සම්මා සම්බුද්ධසාවකො.
එතං අච්ඡාදයිත්වාන මම දක්ඛිණ මාරිස,
තථාහං සුඛිතා හෙස්සං සබ්බකාමසමිද්ධිනී" යි.

යන මේ ගාථා දෙකින් මෙසේ දුන්නාවූ දෙය මට හැඳගන්ට නො පිළිවන එසේහෙයින් තොප අතුරෙන් යම් කෙණෙක් තුනුරුවන් කෙරෙහි පහන් සිතින් සැදැහැඇතිව වෙසෙද්ද ? යම්කෙණෙක් සරණසිල් පන්සිල් අටසිල් දසසිල් පුරද්ද යම්කෙණෙක් මෛත්‍රී හා තිලකුණු මෙනෙහි කෙරෙද්ද එබඳු සිල්වත්වූ උපාසක කෙණෙක් හෝ උපාසිකා කෙණෙක් හෝ තොප අතුරෙන් ඇත්නම් මට දෙන උතුරුසළුව උන්ට දී ඔවුන් හඳවා මට පින්පෙත් දෙව එසේ කල්හි මම දිව පිළී ලැබ සුවපත් වෙමි කීවාය, එවේලෙහි තුනුරුවන් කෙරෙහි පැහැද තිසරණ පිහිටි උපාසකයෙකු එහි ඇතිහෙයින් ඒ උපාසකයාට පිළීසඟලක් දන් දී ඇට පින්පෙත් දුන්නාහුය, එකෙණෙහි නානාවර්ණ සම්පන්නවූ කුස්සළුවෙන් හා නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්තවූ දිව බොජුන් පහළවිය, මෙසේ එදා වස්ත්‍ර ලබනතුරු බුද්ධාන්තරයක් මුළුල්ලෙහි එකම වස්ත්‍රයකුදු නො ලද්දීය, අදත්තාදානයෙන් අපාය භාග්වන පරිදි හා මිනිස්පියක් ලදහුනම් මනුෂ්‍යාගම දුල්ලභ වන පරිදිද දක්වන්නට වදාළහ බුදුහු.

"අදින්නාදානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති තිරච්ඡානයොනි සංවත්තනිකං හොති පෙත්තිවිසය සංවත්තනිකං හොති යො සබ්බලහු සො අදින්නාදානස්ස විපාකො මනුස්සභූතස්ස මනුස්ස භොගහගසංවත්තනිකො හොති" යි. අදත්තාදානයෙහි අඞ්ග නම් කවරහයත් ?

"පරපරිග්ගහභණ්ඩා ච පරපරිග්ගහසඤ්ඤිතා
ථෙය්‍යාදිසෙවකචිත්තඤ්ච ඨානා චාවනමෙව ච,
පයොගො චේ'ති පඤ්චඞ්ගමදින්නං සාහත්ථිකම්මතං" යි.

යනු හෙයින් පරපිළිබඳ භාණ්ඩයක් බවය, පරපිළිබඳය යන සංඥාඇති බවය, ථෙය්‍යාදින් අතුරෙන් එක්සිතක් ඇතිබවය, තුබූ තැනින් පහකිරීමය, තමාඅතින් කරණ ප්‍රයොගයයි, කියා සවහස්තයෙන් සිද්ධවන අදත්තාදානය පස් අඟක් ඇත්තේයයි දන්නා ලදී.

“යථාධිප්පායමාණත්ති තථා තං සම්පටිච්ඡනං,
පරිච්ඡෙදං අවිනාසෙත්වා තථා'ව කරණම්පි ච.
ඨානා චාවනප්පයොගඤ්ච අපනෙත්වාන පඤ්චමසු,
ලද්ධාණත්තියා හොති අදින්නන්ති පදීපයෙ” යි.

යතු හෙයින් අභිප්‍රායවූ පරිද්දෙන් නියොගකිරීමය, එසෙයින්ම නියොග කරණලද්දහු විසින් ගිවිසමය, ප්‍රතිඥාව නොනසා එසෙයින්ම කිරීමය, යන මේ තුන් අඞ්ගය හා යට කී ඨානාචාවනික ප්‍රයොගයෙහි පස් අඞ්ගයන් කෙරෙහි තුබූ තැනින් පහයීරීම ද තමා අතින් කරණ ප්‍රයොගයද යන මේ දෙක හැර එහි කී තුන් අඞ්ගය හා එක්ව ආණත්තියෙන් සිඩවන අදත්තාදානය ස අඞ්ගක් ඇත්තේයයි දතයුතුයි, මේ අදත්තාදානයෙහි ආදීනව හා අඞ්ගයි.

කාමෙසු මිච්ඡාචාරා, ආගමනීයස්ථානව්‍යතික්‍රමයයි කියනලද කාමමිථ්‍යාචාරයෙන්; පටිවිරතො හොති, ආදීකව දැහිම් වශයෙන් විශෙෂයෙන් වැළැක්කේ වේද ?

මෙහි දක්වනලද කාමමිථ්‍යාචාරයෙහි ආදීනව නම් කවරහයත් ? පරදූර පරිග්‍රහ කළාහු මෙම ජන්මයෙහිම ශිරශ්ඡෙදණ්ඩයෙන් ධනදණ්ඩයෙන් වධ දණ්ඩයෙන් අභිභූතව ගොස් නරකයෙහි ඉපද අනේවාසුවහස් පැසී මිනිස්පියක් ලදහු නම් සියක් අත්බැවැ ස්ත්‍රීබවට පැමිණෙත් — එයින් කීහ.

“පුරිසා හි ඉත්ථියො වා ඉත්ථියො වා පුරිසා අභූතපුබ්බනාම නත්ථි පුරිසා හි පරස්සදාරෙ අතිචරිත්වා කාලං කත්වා බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චිත්වා මනුස්සජාතිං ආගච්ඡන්තා අත්තභාවසතෙ ඉත්ථිභාවං ආපජ්ජන්ති” යි.

කප්ලක්ෂයක් පිරූ පෙරුම්ඇති අප අනඳමහතෙරහු එක් ජන්මයෙක්හි කරණලද පරස්ත්‍රීසමාගමයෙකින් නරකයෙහි පැසී එයින් මිදී ගියකල තුදුස් අත්බැවෙක ස්ත්‍රී වූහ, සත්අත්බැවෙක අණ්ඩච්ඡෙදබවට පැමිණියෝ - කිසේ යයත් ? එව්හු සසර වසන කල මගධරට රජගහනුවර නරහල් දරුවක්වැ ඉපද පාපමිත්‍රසංසර්ගයෙන් පරදූරපරිග්‍රහ කොට ජීවිතපය්‍යාවසානයෙහි අවසරගත් අනෙක් පින්කමෙකින් වගුරට කොසඹෑ නුවර අසූකෙළක් ධනඇති සිටුදරුවෙක්වැ ඉපද කල්‍යාණමිත්‍රසංසර්ගයෙන් බොහෝ පින්කම් කොට මියන කල්හි රජගහනුවරලා කළ පව් අවසර යත්තෙන් රෞරව මහානරකයෙහි ඉපද අනෙක වර්ෂකොටිසහස්‍රයෙහි පැසී බොහෝ දුක්විඳ පව් ගෙවා කණ්ණාට ජනපදයෙහි කොටඑවක්වැ උපන්නු, එහි ඇමැතිදරුවෝ “මොහු පිළිකල කලෑ ජවසම්පන්න බලසම්පන්න වේ” යි අණ්ඩච්ඡෙද කොට තමනට වාහන කළෝ.

එයින් සැව මහත් වනයෙක්හි වඳුරුයොනියෙහි ඉපද උපන් දවස්ම යූථ පතිහු විසින් මපුතු මුඛ ගෙණෙවයි ගෙන්වා ගෙණ හඬව හඬවා තරකොට දැතින් ඩැහැ ඵලය උපුට පියන ලදහු, එයින් සැව දශාණ්ණ දෙශයෙහි ගොණෙක්වැ ඉපද නහඹුකල්හිම උද්ධතඵලවූහු, එයින් සැව වැදූහැරට මහා

ශාකකුලයෙක්හි නපුංසකවූ ඉපද දිළිඳු මිනිස්පියෙහි නොගැහැණි නො පිරිමි වූහු, එයින් සැව තව්තිසා දෙව්නුවර සක්දෙව්රජහට දිව්‍යකන්‍යාවක් වූහු, දෙවන වරද තුන්වන වරද සතර වන වරද එසෙයින්ම දිව්‍යකන්‍යාවක් වූහු, පස්වනවර එම දෙව්ලොව 'ජවන' නම් දෙව්පුතක්හට අගමෙහෙසුන් වූහු, එයින් සැව වැදූහැරට මිසුලුනුවර 'අඩකාති' නම් රජුහුගේ අගමෙහෙසුන් කුසැ ඉපද අභිරූපවූ 'රුජා' නම් රාජකන්‍යාවක් වූහු, පියරජ 'රතිවඩින' නම් සත්බුමුපහයක් කරවා දී දවස්පතා පස්විසි සුමුගක්මල් දෙව යි, වස්ත්‍රාභරණයෙහිදු අන්නපානයෙහිදු පමණක්නැත්, දන්දෙනු සඳහා අඩමසකට රන් දහසක් දෙව යි, ඒ ගෙණි දන්දී සිල් රැක ජීවිතාවසානයෙහි තව්තිසා දෙව්නුවර මහෙශාක්‍ය දිව්‍යපුත්‍රයෙක්ව උපන්හු–එයින් කීහ.

"ඉත්ථී න මුච්චති සදා පුන ඉත්ථිභාවං
නාරී සදා භවති සො පුරිසො පරස්ස,
යො ආචරෙය්‍ය පරදාරමලඞ්ඝනීයං
ඝොරඤ්ච වින්දති සදා ව්‍යසනඤ්චනෙකං" යි.

අපිච–පසේබෝසත් කෙණෙක් දොසාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් පැරුම් පුරා අවුදු කසුප් සම්මා සම්බුදුන්ගේ සස්නෙහි පැවිදිවූ විසිවාදහසක් මහණුවම් කොට කාමාවචර දිව්‍යලොකයෙහි ඉපද එයින් සැව බරණැස සිටුදරුවක් වූ පාපමිත්‍රසංසර්ගයෙන් පරදාරපරිග්‍රහ කොට නරකයෙහි ඉපද අනෙක වර්ෂකොටිසහස්‍රයෙහි පැසී පව් ගෙවා එයින් සැව බරණැස සිටුදුවක කුස අඹුන් මිනිස් පිළිසඳින් පිළිසිඳ ගෙණ ගැහැණිවූ ඉපද මව්පියන් විසින් වෙෂ්‍යව ස්වජනයනට අප්‍රියවූ පතිකුලයට ගොස් එහිදු ස්වජනයන් විසින් වෙෂ්‍යව වූ වෙන්නාහු පසේබුදුකෙණෙක්නට බත්පයක් දී පියුම්කලඹක් පුදා පිරිමි බවට පතා ජීවිතාවසානයෙහි තව්තිසා දෙව්නුවරෙහි 'මහාපදුම' නම් දිව්‍ය පුත්‍රයක්වූ ඉපද දෙව්සපු වළඳා වසන්නාහු බඹදත් රජහුගේ අගමෙහෙස්න ශීලවතී දෙවියට දරු දියටි සක්දෙව්රජහුගේ අයජමෙන් දෙව්ලොවින් සැව රජ උයන්හි මගුල්පොකුරුණියැ පියුම්ගැබ්හි ඉපද ශීලවත් දෙවිය හසනාගතවූ මහපෙරහරින් වඩනාහු ඉසිපතන් ගොස් පසේබුදු වූහු.

මෙසේ අස අනඳමහතෙරුන් වැනි පුන්පැරුම් සව්බෝසත්නට මහපියුම් කුමරහු වැනි පුන්පැරුම් පසේබෝසත්නටද පවා අපාය දුඃඛදායකව එයින් මිදී ගියකල්හි අණ්ඩවෙෂදක්‍ෂවයටද නපුංසකත්වයටද ස්ත්‍රීත්වයටද පමුණුවනු වූ පරදාරයන් ඩාකිනීන් සේ දක්කයුතු එයින් කීහ.

"සව්බ්දුඃඛාසපදන් ඝොරාන් පරදාරානපායදාන්,
න පශෙ‍ය්‍යත්මනසා චා'පි ඩාකිනීරිව නාසාදයෙත්" යි.

අපිච කසුබු සම්මා සම්බුදුන් දවස බරණැස්නුවර සිටුදරුවෝ සතරදෙනක් පරදාරපරිග්‍රහ කොට අවීචියෙහි ඉපද එක්අතුරුකපක් පැසී එයින්

සැට සැටයොදුන් ලොහොකුඹු නරකයෙහි ඉපද කකියන ලදුනෙහි සාල් සෙයින් උඩුයටිවැ බස්නාහු තිස්වාදහසෙකින් පත්ලට බැස තිස්වාදහසකින් මුවවිටට නැංගානු ඔවුනොවුන් දැක එකෙකී ගාථා කියටිවැ කියන්නට කල් නැත්තෙන් 'දු' යන 'ස' යන 'න' යන 'සො' යන සතර අකුරක් සතරදෙන කියා ලොහොකුඹුහි ගැලී ගියහ, කොසොල්රජු මැදුම්යම්හි අසා බියපත්වැ මල්ලිකා දෙවීන්ගේ නියොගයෙන් බුදුන් කරා ගොස් සැළකෙළේ—බුදුහු සතරනෙරිසක් කෙණෙකුන් පරදාරපරිග්‍රහ කළහෙයින් නිරය දුක් විඳුනා පරිදි දක්වා ඔවුන් කී සතර අකුරු ගෙණ ඔවුන් විසින් අපරිපූර්ණ සතර ගාථාවන් පරිපූර්ණ කොට වදාලෝ.

"දුජ්ජීවිතං අජීවිම්හ යෙ සන්තෙ න දදම්හසෙ,
විජ්ජමානෙසු භොගෙසු දීපං නාකම්හ අත්තනො.

සට්ඨිංවස්ස සහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං කදා අන්තො භවිස්සති.

නත්ථි අන්තො කුතො අන්තො න අන්තො පතිදිස්සති,
තදාහි පකතං පාපං මම තුය්හඤ්ච මාරිස.

සො හි නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නො කාහාමි කුසලං බහුං" යී.

මේ සතර ශබ්දයන් කොසොල්රජු ඇසූ තැන් පටන් ගෙණ ඔහු යටට බසිති ඔවුන් බස්නා තිස්වාදහසින් තව එක්වාදහසෙකුදු නො ගියේය, ඔහු අනෙකවර්ෂකොටිසහස්‍රයෙහි පැසී සතර අපායෙහි වෙහෙසී කුර්රු දරුණු දුක් විඳැ පව් ගෙවී ගියකලැ මිනිස්පියක් ලදහුනම්-ගැහැණී වෙති මව්පියනටද පවා අප්‍රිය වෙති සර්වජනයන් විසින් වෛෂ්‍ය වෙත්—මෙසේ මහාඅනර්ථකාරීවූ කාමමිථ්‍යාචාරයෙන් අපායභාගී වන පරිදි හා මිනිස්පියක් ලදහොත් සපත්න වෛර බහුල වන පරිදි දක්වන්නට වදාළහ බුදුහු—

"කාමෙසු මිච්ඡාචාරො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති තිරච්ඡානයොනි සංවත්තනිකො හොති පෙත්තිවිසය සංවත්තනිකො හොති යො සබ්බලහුසො කාමෙසු මිච්ඡාචාරස්ස විපාකො මනුස්සභූතස්ස සපත්තවෙරසංවත්තනිකො හොති" යී.

කාමමිථ්‍යාචාරයෙහි අඞ්ග නම්.

"පරපරිග්ගහිතිත්ථි ච පරපරිග්ගහසඤ්ඤිතා,
අතික්කමනචිත්තඤ්ච තථෙවාතික්කමො පි ච
එවං පරස්ස දාරෙසු චතුරඞ්ගො අතික්කමො" යී.

යනු හෙයින් පරපරිගෘහිත ස්ත්‍රියක් බවය, පරපිළිබඳය යන සංඥාඇතිබව්ය, ඉක්මියටි සිතය, එසෙයින්ම ඉක්මීම දුයි මෙසේ පරදාරාවන් කෙරෙහි ඉක්මීම සතර අඞ්ගක් ඇත්තේයයි දතයුතුයි—මේ කාමමිථ්‍යාචාරයෙහි ආදීනව හා අඞ්ගයි-එබැවින් සැදැහැවතන සත්පුරුෂයන් විසින් කාමමිථ්‍යාචාරාදිය හැර කුශලධර්මයෙහි පිහිටා සගමොක්සිරිසැපත් අත්පත්කටයුතු.

මුසාවාදා, මෘෂාවාදයෙන්; පටිවිරතො හොති, ආදීනව දැනීම් වශයෙන් විශෙෂයෙන් වැළැක්කේ වේද. මෙහි දක්වනලද මෘෂාවාදයෙහි ආදීනව නම් කවරහයත්? මෘෂාවාදී පුද්ගලයා නො කොට හැකි පව් නම් නැත්-එයින් වදාළහ.

“එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො,
විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියං” යි.

යම් ගිහියෙක්වැසි කෙණෙක්නට මෘෂාවාදයෙහි හැකුළුම් නැත්නම් ඔවුන්ගේ සන්තානයෙහි ගුණලවයක් නැති, යම් සසුන්වැසි කෙණෙක්නට මෘෂාවාදයෙහි ලජ්ජා නැත්නම් ඔවුනට මහණුවම් නැත්-එයින් වදාළහ.

“පස්සසි නො ත්වං රාහුල ඉමං උදකාධානං රිත්තං තුච්ඡං නති, එවං භනෙත එවං රිත්තං තුච්ඡං ඛො රාහුල තෙසං සාමඤ්ඤං යෙසං නත්ථි සම්පජානමුසාවාදෙ ලජ්ජා” යි-මෙසේ මහාදෝෂාවහවූ මෘෂාවාද සේවා කෙළේ “අභූතවාදී නිරයං උපෙති” යි වදාළ බැවින් නරකයෙහි ඉපද අනෙකවර්ෂකොටිසහස්‍රයෙහි පැසී එයින් මුක්තවූ කලැ මිකිස්සියට පැමිණ නොයෙක් දු සියෙහි අභූතයෙන් අභ්‍යාඛ්‍යානකරණු ලැබෙයි දීන වෙයි ජඩ වෙයි අඥාන වෙයි මූග වෙයි අප්‍රිය දර්ශන වෙයි මීනයන්සේ දිව් නැති වෙයි සර්පයන්සේ දෙදිව් වෙයි කපිලමත්ස්‍යයාසේ දුර්ගන්ධ මුඛ වෙයි දරුවෝ නො උපදිති උපදිත් නම් දූහු වෙති උපනද වහල් නොව යෙත්-එයින් කීහ.

“දීනො විගන්ධවදනො ච ජළො අපස්සුතො,
මූගො සඤ්ඤ භවති අප්පියදස්සනො ච,
පපෙපාති දුක්ඛමතුලඤ්ච මනුස්සභූතො
වාචං මුසා භණති යො හි අප්පඤ්ඤසත්තො” යි.

චෙතියරජ්ජුහුගේ මුඛයෙන් උත්පලගන්ධ වැහෙයි ශරීරයෙන් චන්දනගන්ධ වැහෙයි ආකාශයෙහි බබපයඞ්කා වෙයි ඛඩ්ගහස්ත විද්‍යාධරයෝ සතරදෙනෙක් චතුර්දිශායෙහි සිට ඔහු රක්‍ෂාකෙරෙති, ඒ රජු මෘෂාවාද කී තැනසිට විද්‍යාධරයෝ කඩු දමා පියා ගියහ, මුඛයෙන් වැහෙන මහනෙල්මල්ගඳද ඇඟින් වැහෙන සඳුන්ගඳද අන්තර්හිත විය, ආකාශයෙහි නොසිත්දැහි බිමට බට, බිමඇක්මෙත්ම පොළොව විවරවිය, ඒ විවරයෙන් ගොස් සවකායයෙන්ම නිරා වත්-එයින් වදාළහ බුදුහු.

“මුසාවාදෙ, භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති තිරච්ඡානයොනිසංවත්තනිකො හොති පෙත්තිවිසයසංවත්තනිකො හොති යො සබ්බලහු සො මුසාවාදස්ස විපාකො මනුස්සභූතස්ස අභූතබ්භක්ඛානසංවත්තනිකො හොති” යි-එබැවින් සුභාෂිතවචනයක්ම බිණියයුතු වන්නේය, දුර්භාෂිතවචනයක් නොම බිණියයුතු වන්නේය, මෙහි සුභාෂිතවචනය නම් කවරහයත්? යේ බුදුන්විසින් දැක්වීතයි.

"ඉධ භික්ඛවෙ භික්ඛු සුභාසිතඤ්ඤෙව භාසති නො දුබ්භාසිතං, ධම්මඤ්ඤෙව භාසති නො අධම්මං, පියඤ්ඤෙව භාසති නො අප්පියං, සච්චඤ්ඤෙව භාසති නො අලිකං, ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති නො දුබ්භාසිතා" යි එසින් වදාළහ වඞ්ගීස මහතෙරහු.

"තමෙව වාචං භාසෙය්‍ය යායත්තානං න තාපයෙ,
පරෙච න විහිංසෙය්‍ය සා වෙ වාචා සුභාසිතා.
පියවාචමෙව භාසෙය්‍ය යා වාචා පටිනන්දිතා,
යං අනාදාය පාපානි පරෙසං භාසතෙ පියං,
සච්චං වෙ අමතා වාචා එසධම්මො සනන්තනො,
සච්චෙ අත්ථෙ ච ධම්මෙ ච ආහු සන්තො පතිට්ඨිතා.
යං බුද්ධො භාසති වාචං ඛෙමං නිබ්බාණපත්තියා,
දුක්ඛස්සන්තකිරියාය සා වෙ වාචානමුත්තමා" යි.

මෙසේවූ සුභාෂිතවචනයක්ම මිස දුර්භාෂිතවචනයක් නො බිණුව මිනා බැවින් බොහෝ නො බිණිය යුතුවේ, බොහෝ බිණුව කවර දෝෂයයත්? එහි පස්ආදීනවයක් වේ, ඒ කවර පස්ආදීනවයයත්? වදාළේ මැනො.

"පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා බහුභාණිස්මිං පුග්ගලෙ කතමෙ පඤ්ච? මුසා භණති පිසුණං භණති ඵරුසං භණති සම්ඵප්පලපති කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති" යි පරිමිතභාෂායෙහි කවර අනුසස්ද යත්? ගෙද වදාළේ මැනො.

පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා මන්තභාණිස්මිං, කතමෙ පඤ්ච? න මුසා භණති න පිසුණං භණති න ඵරුසං භණති න සම්ඵප්පලපති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති" යී—මෙසෙයින් සුභාසිත පරිමිත වචනයක්ම මිස මහාඅනර්ථකරවූ දුර්භාෂිත වචනයක් නොම බිණිය යුතුවේ, මෙහි මෘෂාවාදයෙහි අඞ්ග නම් කවරහයත්?

"ලද්ධිගුහණි චිත්තස්ස වාචා තදනුලොමිකා,
වචනත්ථ පටිවෙදෙ ච මුසාවාදෙ තිවඞ්ගිකො" යී.

සතු හෙයින් ලබ්ධිගුහණියෙහි දිඨ්සුතාදි හෙයින්ද අදිඨ්සුතාදී හෙයින්ද ව සතු පිහිටවූ ලබ්ධියගේ (හෙවත්) පරිඥනයාගේ සැඟවීමෙහි සිතය, ඒ ලබ්ධිගුහණියට අනුලොම්ව සිටිනා තෙපුලය, වචනාර්ථයාගේ ප්‍රතිවෙධය ඝන මොහු කී තෙපුලෙහි ඇසූවාවුන් විසින් අර්ථ දැනීම යයි මෙසේ මෘෂාවාදය අඞ්ගත්‍රයක් ඇත්තේයයි දතයුතු-මේ මෘෂාවාදයෙහි ආදීනව හා අඞ්ගයි-එබැවින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් මෘෂාවාදාදී අකුශලයන් හැර කුශලධර්මයෙහි පිහිටා ස්වර්ගමොක්ෂසම්පත් ලැබීමට උත්සාහ කටයුතු.

සුරාමෙරයමජ්ජපමාදට්ඨානා මද ප්‍රමාදයට කාරණවූ රහමෙරින්; පටිවිරතො, ආදීනව දැනීම් වශයෙන් විශෙෂයෙන් වැළැක්මෙක් වේද- මෙහි දක්ව

න ලද මද්‍යපානයෙහි ආදීනව නම් කවරහයත්? යම් කෙණෙක් හලාහලවිෂ සෙයින් සුරාමෙරය මද්‍යපාන කළාහුද, ඔහු නරකයෙහි ඉපද අනෙකවර්ෂ කොටිසහස්‍රයෙහි පැසී එයින් මුක්තවූ කල්හි උන්මත්තක වෙති ලජ්ජා නැති වෙති දීන වෙති දුඃඛිත වෙති ශොකී වෙත් විරූප වෙත්-එයින් කීහ.

"උම්මත්තකා විගතලජ්ජගුණා භවන්ති
දීනා සදා ව්‍යසනසොක පරායණා ච,
ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා
පීත්වා හලාහලවිසං'ව සුරං විපස්සු" යී.

සුරාමෙරය දිව්‍යලොකයට ආවරණය, රාගාදීනට ප්‍රභවය, තුන්භවයට පිහිටය, තුන්මහාපුරුෂයන් විසින් ගර්හිතය, ත්‍රිවිධ දුශ්චරිතයට කාරණය, තුන් ලොවට පිහිටවූ සස්නට විනාශ කරයි-එයින් කීහ.

"තිදිවාවරණං තිමලප්පභවං තිභවස්ස ගතිං තිජනාවමතං,
තිවිධස්සපි දුච්චරිතස්ස හිතං තිභවුබ්භවසාසනනාසකරං" සී.

ජනයෝ පිපාසාමාත්‍රයක් නොසැහැ මද්‍යපානය කරන්නාහු නරකයෙහි තන්නිදානවූ ඝොරබිරම් දුක් කිසේ සහනුවහ? කියේ මැනො.

"පිබන්ති යෙ මජ්ජමසාධුකන්තං පිපාසමත්තං සහිතා සහන්තා,
තෙ තන්නිදානං නරකෙසු දුක්ඛං කථං සහිස්සන්ති සුඝොරරූපං" සී

මද්‍යපාන නො කළාහු නරලොව්හි රුවන්රැස්කඳමෙන් වොරෙජනා සක්රුවනින් සක්වළ විජය කොට සක්විති රජසිරි විඳිති, දෙව්ලොව්හි තන්විසිතුරු මිණිරැසින් අළු රුවන් විමන්කුළ්හි නැටුම් ගැව්ගත් සුරකතුන්ගේ මඳලස්වහස් බැල් මෙන් පිණපිණා දෙව්රජ කෙරෙති, අවසන්හි නුවණ තුරඟ සියෝ අරිඅටහිමගරිය අරා සසර කතර තරා නිවන්පුර වදිත්-එයින් කීහ.

"නරින්දසම්පත්ති නරින්දලොකෙ සුරින්දසම්පත්ති සුරබ්භමජ්ඣෙ;
මුනින්දසම්පත්ති මහාරහන්තා න දුල්ලභෙකන්තසුරා විරත්තෙ" සී.

මද්‍යපානයෙන් අපායභාග්වන පරිද්ද මිනිස්පිණට පැමිණි උන්මත්තක වන පරිද්ද දක්වන්නට වදාළහ බුදුහු.

"සුරාමෙරය පානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං හොති තිරච්ඡානයොනිසංවත්තනිකං හොති පෙත්තිවිසයසංවත්තනිකං හොති යො සබ්බලහු සො සුරාමෙරය පානස්ස විපාකො මනුස්සභූතස්ස උම්මත්තකසංවත්තනිකො හොති" සී.

අපිච-මද්‍යපාන කොට රහමෙදෙන් උදම් වූවාහු * ස්වතන්ත්‍රව යන්නට නො නිසිවන බැවින් තත්තත් ස්ථානයෙහි ද්‍රපතනය කෙරෙති, භක්ෂ්‍යාභක්ෂ්‍ය විචාරණයට නො නිසි වන බැවින් තත්තත් ආස්වාදනය කෙරෙති, ස්වචිත්ත

* 'උමත්වූවාහු' යී-සමහර.

යෙහි ඊශ්වර නොවන බැවින් මුඛපටයෙහි පැහැර පමින් මධ්‍යයෙහි නෘත්‍යනය කෙරෙති, ලජ්ජා විරහිත වන බැවින් නග්නවැ පෞරජනාකුලමාර්ගයට අවතීර්ණ වෙති, සුරායෙන් පරිමුෂිත මති වන බැවින් මාතෘ දුහිතෘ ආදීන් කෙරෙහි නිරවද්‍යව ප්‍රවෘත්ත වෙති, ආත්මයටද ජීවිතයටද සම්පත්තියටද විනාශ කෙරෙත් - එයින් කීහ.

"ආද්‍යන්තමගිචං මද්‍යං කඃ පිබෙද්විෂයොත්සවම්,
ආත්මජීවිත සම්පත්ති විපත්තිමති දුස්තරම්" යි.

සකල ජම්බුද්වීපයෙහි තෙසැට දහසක් නුවර පිරිවරණලද ද්වාරවතී නුවර වාසුදෙවනරේන්ද්‍රාදී දසබෑ රජදරුවෝ රහ බී මහමුගුරු ගෙණ උනුන් සපා මිය අපායභාගී වූහු-එයින් කීහ ශූරපාදයෝ.

"යාම්පීතවන්තො මදලුප්ත සංඥා වෘෂ්ණ්‍යන්ධකා විස්මෘතබන්ධුභාවාඃ,
පරස්පරං නිෂ්පිපිෂුර්ගදාභී රුන්මාදනී සා නිහිතෙහ කුම්භෙ" යි.

පූර්වදෙවයෝ සුරාපාන කොට මෙරුමස්තකයෙහි නිපතන වූවාහු ත්‍රිදශය න් විසින් අපහෘතවැ ක්ෂාරසාගරයෙහි නිමග්න වූහු-එයින් කීහ.

"යස්‍යාදෙශාත්පූර්වදෙවාඃ ප්‍රමත්තා හෘතාශ්‍රයාස්ත්‍රිදශෛර්නිගීයමානාඃ,
ත්‍රාවෙණිඹිණෙ ලවණජලෙ මමජ්ජු ස්තාස්තාඃ පූර්ණෙෂං කුම්භමිමං ක්‍රීණීධ්වම්" යි

සුරා උන්මාදවිද්‍යාය ව්‍යසන ප්‍රතිෂ්ඨාය දාරිද්‍ර්‍යකරය පාපජනකය අපායමාර්ගය අන්ධකාරගර්භයයි-එයින් කීහ.

"උන්මාදවිද්‍යාං ව්‍යසනප්‍රතිෂ්ඨාං සාක්ෂාදලක්ෂ්මීං ජනනීමඝානාම්,
අද්වෛතසිද්ධාං කලිපද්ධතිං තාං ක්‍රීණීත ඝොරං මනසස්තමිස්‍රාම්" යි.

මද්‍යපාන කළාහු භයානකවූ නරකප්‍රපාතයෙහි ප්‍රපතිත වෙති, තිර්‍යක්ප්‍රෙත ගතියට උපගත වෙති, එබැවින් සුරාපාන මනසිනුදු ද්‍රෂ්ටව්‍ය නො වේ-එයින් කීහ.

"සිමෙව්‍ය යද්දුශ්චරිත ප්‍රසක්තාඃ පතන්ති ශ්වභ්‍රමානනරකප්‍රපාතාන්,
තිර්‍යග්ගතිං ප්‍රෙතදරිද්‍රතාංච කො නාම තද්‍රෂ්ටුමපි ව්‍යවස්‍යෙත්" යි.

මද්‍යපාන කළාහු ඝොරබිරම් දෙගලන් අවුල් දසයොදුන් දහස් අවිදුමඩ ලෙහි වෙසෙති, තිරිසන්යොන්හි බලු කවුඩු ගර බරණ සිනි පලඟ පණු කීයි ඹිවැ පුනපුනා උපදිති, ප්‍රෙතලොකයෙහි 'අහො දුක්ඛං අහො දුක්ඛං' යි ලෙහි පැහැර පැහැර දළ කඳුළු විහිදුවති, අසුරකායි බිහිසුණු දරුණු දුක් අනුභව කෙරෙත්—එයින් කීහ.

"ලක්ෂුරපිච වීපාකො මද්‍යපානස්‍ය යස්මා-
න්මනුජගතිගතානාං ශීලදූෂිටිං ජහාති.
ජ්වලිතදහනරෞද්‍රෙ ඝෙන භූයො'පාවීචෞ,
නිවසති පිතෘලොකෙ හීන තිර්‍යක්ෂු ගෙවව" යි.

සුරාපානය ශීලසංක්ලේශට කෙරෙයි, යශස් නසයි, ලජ්ජා නිරස්ත කෙරෙයි, ප්‍රඥා නැති කෙරෙයි, තත් තද්ගුණයන් විධ්වංසනය කෙරෙයි-එයින් කීහ,

"ශීලං නිම්ලයති හන්ති යශඃ ප්‍රසහ්‍ය
ලජ්ජාං නිරස්‍යති මතිං මලිනී කරොති,
යානාම පීතමුපහන්ති ගුණාංශචන්‍යාංස්තාං-
ස්තත්පාතුමර්හසි කථං නෘප මද්‍යමද්‍ය" යි.

මේ මද්‍යපානයෙහි ආදීනවයි-එබැවින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂජනයන් විසින් ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර මෘෂාවාද සුරාපාන යයි කියනලද පඤ්ච දුශ්ශීල්‍යය හැර දාන ශීලාදී කුශලධර්මයෙහි පිහිටා ස්වර්ගමොක්ෂ සම්පත් ලැබීමට උත්සාහ කටයුතු.

ගහපති, එම්බා ගෘහපතිය; අයං, මේ තොමෝ; සීලසම්පදා, ශීලසම්පත්තියයි; වුච්චති, කියනු ලැබේ-මෙහි දක්වන ලද ශීලසම්පත්තිය නම් ? ශිරෝර්ථයෙන් 'ශීල' වේමය, ශීතලාර්ථයෙන් 'ශීල' වේමය, ශලනාර්ථයෙන් 'ශීල' වේමය, ශාලාර්ථයෙන් 'ශීල' වේ මැයි-නිශ්චය යත් ? යම් සේ ශිරච්ඡේද කළ කල්හි සියලු ආත්මභාවය විනාශයට යේද එසෙයින්ම ශීල හෙද වූ කල සියලු ගුණ ශරීරය විනාශයට යෙයි, ඒ හෙතුවෙන් ගුණශිරස්න වනබැවින් නෛරුක්තික පිවීන් 'ශීල' 'නම් වේ, සර්වක්ලේශ පරිදාහ සන්හිඳුවන බැවින් ශීතලාර්ථයෙන් 'ශීල' නම් වෙයි-සියලු අකුශලධර්මයන්ගේ ශලනසංවරණ කරණ බැවින් ශලනාර්ථයෙන් 'ශීල' නම් වෙයි, සර්වකුශලධර්මප්‍රවෙශයට ශාලා වනබැවින් ශාලාර්ථයෙන් 'ශීල' නම් වේ, (නොහොත්) ප්‍රාණඝාතාදියෙන් වෙන්ව වත්පිළිවෙත් පුරන්නාහුගේ චෙතනාදී ධර්මයෝ 'ශීල' නම් වේ, එයින් කීහ විශුද්ධිමාර්ගයෙහි "සීලන්ති පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිපත්තිං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා" යි-මෙහි ආනුසස් නම් කවරහ යත් ? ශීලසම්පන්නපුද්ගල අප්‍රමත්තව මහත් භොගස්කන්ධයට පැමිණෙයි, යශස් දශදිශාවෙහි පහළ වෙයි, යම් පර්ෂදකට වදී නම් විශාරදව එළඹෙයි, අසම්මූඪව කාලක්‍රියා කෙරෙයි, චුතිචිත්තයෙන් මත්තෙහි ස්වර්ගයෙහි උපදී, එයින් වදාළහ.

"පඤ්චිමෙ ගිහපති ආනිසංසා සීලවතො සීලසම්පදාය, කතමෙ පඤ්ච ? ඉධ ගිහපති සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති අයං ගිහපති පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය—පුන ච පරං ගිහපති සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති අයං ගිහපති දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය-පුනච පරං ගිහපති සීලසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති, යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො ව උපසඞ්කමති අමඞ්කුභූතො අයං ගිහපති තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය-පුනචපරං ගිහපති සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලං කරොති අයං ගිහපති චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය-පුනච

පරං භික්ඛවෙ සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති අයං භික්ඛවෙ පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා සීලවතො සීලසම්පදායාති'' යි.

අපිච - මේ මහාභද්‍රකල්පයට එකාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් ඈත 'අනවමදර්ශී' නම් බුදුන්ගේ කාලයෙහි හංසවතී නම් පුරයෙහි බැලමෙහෙ කොට ජීවත්වන්නාවූ එක් දුගී පුරුෂයෙක් වූයේය, ඒ පුරුෂතෙම එක්දවසක් බුදුන්ගෙන් බණ අසා මෙසේ සැලකීය, මේ සියලු ලොකවාසී සත්වයෝ මොහ නැමැති අන්ධකාරයෙන් වැසුනෝය, රාගද්වෙෂමොහයයි කියනලද ගිනිතුණකින් ඇවිල පවත්නාවූ චිත්තසන්තාන ඇත්තේය, මේ සසරින් ගොඩයාමට උපාය කවරේදැයි සිතනුයේ දන් දෙන්නට සුදුසු වස්තුවකුත් නැත්තේය, එබැවින් පඤ්චශීලය රක්ෂා කෙරෙමි යී සිතා 'අනවමදර්ශී' නම් සර්වඥයන්වහන්සේගේ 'නිසභ' නම් අගසව් මහතෙරුන්වහන්සේගේ සමීපයෙහිදී පඤ්චශීලය ගත්තේය, එකලට මනුෂ්‍යයන්ට අවුරුදු ලක්ෂයකට ආයුෂ ඇත්තේය, එපමණ කල් ජීවත්වන්නේත් නොකඩ කොට පඤ්චශීලය රක්ෂා කෙළේය, ඔහට මරණසන්නයෙහි දහසක් අශ්වයන් යෙදූ දිව්‍යරථයක් ගෙණ දෙවියෝ අහස සිට කැඳවූවාහුය, එම කුශලානුභාවයෙන් එම දිව්‍යරථයෙහි ඉඳ තව්තිසා දෙව්ලොවටම ගියෝය, තිස්වරෙක දිව්‍යරාජත්වැ ඉපද දිව්සුරන් පිරිවරා දිව්‍යලොකයෙහි දිව්‍යෛශ්වර්‍ය්‍යයෙන් දෙපන්සැත්තාවරෙක සප්තවිධරත්නයෙන් සමන්විතවූ සතරමහාද්වීපයට එකාතපත්‍රවූ චක්‍රවර්තිරාජ්‍යය කෙළේය, කාසිකොසලාදීවූ වෙන වෙන රාජ්‍යවල රජකළ ජාති පමණෙක් නැත්තේය, අප බුදුන් ලොව පහළවූ කල්හි දෙව්ලොවින් චුතව විශාලා මහනුවර මහත් වස්තුඇති කුලයෙක උපන්නේය, උපන් සත්අවුරුද්දෙහි මවුපියදෙදෙනා පන්සිල් ගන්වා අසා තමා එකාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් ඈත ගත්තාවූ පඤ්චශීලය සිහි කොට හුනස්නෙහිම හිඳ රහත් වූයේය, පස් අවුරුද්දෙහිම බුදුහු ඔහු පැවිදි කරවා උපසම්පදා කරවා වදාළසේක, උන්වහන්සේගේ පඤ්චශීලය වර්ණනා කරණසේක් මෙසේ වදාළසේක, මම මේ භද්‍රකල්පයට එකාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් ඈත යම් පඤ්චශීලයක් රක්ෂා කෙළෙම්ද එතැන්පටන් එක්කලෙකත් සතර අපායෙහි නූපන්මි, උපනුපන් තන්හි දීර්ඝායුෂකවීමි, මහත් උපභොගපරිභොග සම්පත් ඇතිවීමි, උපනුපන් තන්හි තියුණු නුවන ඇතිවීමි, සියල්ලවුන්ට මනොඥව උපන්මි, දැන් සියලු කෙලෙසුන් නසා සිව්පිළිසිඹියා හා සමග රහත් වීමි යී වදාළසේක, තවද කසුප් සම්‍යක් සම්බුදුන් දවස සොරහු දහසක් දෙනා ජනපද මනුෂ්‍යයන්විසින් ලුහුබඳනා ලද්දාහු පලා ගොස් අරණ්‍යයට වැද සැඟවෙන්නට නිසි ප්‍රච්ඡන්නගහණයක් නොලදින් සමීපයෙහි ගිරිගුහාවක වසන තපස්වී කෙණෙකුන් දැක වහන්සේ අපට සරණ වව යී කීහ, ඔහු තොපට සිල් හා සම පිළිසරණෙක් නැති, හැමදෙනම පන්සිල් ගැන්ව සුහු, සොරහු මැනවයි සිල්සමාදන්වූහ, තෙරහු තෙපි සිල්සමාදන්වව දැන් තොප ජීවිත විනාශවනකල්හිද පරද්වෙෂ කම් නො කරවයි අවවාද කළහ, ඔවුන් මැනවයි කිවිසි කල්හි ජනපදමනුෂ්‍යයෝ ගොස් සොරුන් දැක හැඹ

දෙනාම මැරුණු, ඔව්හු මිය කාමාවචර දිව්‍යලොකයෙහි උපන්හු, ඔවුන්කෙරෙන් සොරදෙටු දෙටදිව්‍යපුත්‍ර විය, තුඹුවෝ ඔහටම පරිවාර දිව්‍යපුත්‍ර වූහු, ඔව්හු අනුලොමප්‍රතිලොම වශයෙන් දෙව්ලොව් දිව්‍යසම්පත් වළඳා එක් බුද්ධාන්තරයක් ගියකල්හි අප බුදුන් උපන්කල්හි දිව්‍යලොකයෙන් සැව සැවැත් නුවරට නුදුරු තැන්හි දහසක් කෙවුලන්ඇති ගමෙක ඉපද වැඩිවිය පැමිණ සූත්‍රනිපාතයෙහි කී පරිද්දෙන් කපිලමත්ස්‍යයා ගෙණ බුදුන් කරා දෙව්රම්වෙහෙරට ගොස් බණ අසා මහණව රහත් වූහු-එයින් වදාළහ.

“ඤාතීනඤ්ච පියො හොති මිත්තෙසු ච විරොචති,
කායස්ස භෙදා සුගතිං උපපජ්ජති සීලවා” සී.

තවද අෂ්ටාඞ්ගශීලයෙහි අනුසස් නම් කවරහයත්? යමෙක් හෙරිතලයක් සෙයින් සමවූ සුවර්ණ රජත මුක්තා මාණික්‍යාදි සප්තවිධරත්නයෙන් යුක්තවූ (ගෙවත්) තිණ පමණ සත්රුවනින් සම්පූර්ණවූ සොළොස් ජනපදයෙන් අලඞ්කෘතවූ දඹදිව්තෙලෙහි ඓශ්වර්‍ය්‍යාධිපත්‍යයෙන් යුක්තව චක්‍රවර්ත්තිරාජ්‍යය කෙරේද, ඒ සක්විතිහුගේ එබඳු ඓශ්වර්‍ය්‍යී අෂ්ටාඞ්ගයෙන්යුක්තවූ අහොරාත්‍රියෙහි විසූ පෙහෙවස්හුගේ පින්කම් සොළොසක් කොට බෙදූකල්හි එයින් එක් කොටසකුදු අගනේ නො වෙයි, එයට හෙතු කවරේද යත්? මානුෂිකවූ චක්‍රවර්ත්තිරාජ්‍යය දිව්‍යසුඛපිණිස පරිත්ත වේ—එයින් වදාළහ.

“සෙය්‍යථාපි විසාඛෙ යො ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූතසත්තරතනානං ඉස්සරියාධිපච්චං රජ්ජං කාරෙය්‍ය, සෙය්‍යථීදං? අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චෙතීනං වඞ්ගානං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං අට්ඨඞ්ගසමන්නාගතස්ස උපොසථස්ස එකං කලං නාග්ඝති සොළසිං, තං කිස්සහෙතු? කපණං විසාඛෙ මානුසකං රජ්ජං දිබ්බංසුඛං උපනිධාය” සී-මෙහි දිව්‍යසුඛ නම් කවරහයත්? චාතුර්මහාරාජික නම්දිව්‍යලොකයෙහි දෙවියෝ මනුෂ්‍ය ගණනායෙන් අනූලක්ෂයක් අවුරුදු දිව්‍යසුඛ අනුභව කෙරෙත්, තව්තිසාවැසි දෙවියෝ තුන්කෙළසැටලක්ෂයක්, යාමයෝ තුදුස්කෙළසතළිස් ලක්ෂයක්, තුෂිතයෝ පස්පණස්කෙළ සැටලක්ෂයක් නෙර්මාණරතීහු දෙසියසතිස් ලක්ෂයක් පරනිර්මිතවසවර්තීහු නවසිය එක්විසිකෙළ සැටලක්ෂයක් හවුරුදු * දිව්‍යසුඛ අනුභව කෙරෙත්-යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අෂ්ටාඞ්ගසමන්නාගත කොට පෙහෙවස් විසූවාහුවීනම් ජීවිතපර්‍ය්‍යවසානයෙහි චාතුර්මහාරාජිකයන් කෙරෙහි උපදිත්මය, තවුතිසා වැසි දෙවියන්කෙරෙහි, තුෂිතයන් කෙරෙහි, නිර්මාණරතීන් කෙරෙහි, පරනිර්මිතවසවර්තීන් කෙරෙහි උපදිත් මැයි වදාළේ මැනෙ.

“ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජතියං ඉධෙකච්චො ඉත්ථී වා පුරිසො වා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය-පෙ-තාවතිංසානං දෙවානං, යාමානං දෙවානං, තුසිතානං දෙවානං, නිම්මාණරතීනං දෙවානං, පරනි

---

* මෙහි වනී 'සඞ්ඛ්‍යාවෙහි, ස්වල්ප වෙනසක් තිබේ,

ම්මිතවසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය" යි-මේය උපොසථශීල නම්-එබැවින් උභයලොකාර්ථකාමීවූ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන්විසින් පඤ්චශීල අෂ්ටාඞ්ගශීලාදිය රක්‍ෂා කොට මතු සගමොක් සිරිසැප අත්පත් කටයුත්තේයි.

ගහපති, එම්බා ගෘහපතිය; චාගසම්පදා, ත්‍යාගසම්පත්තිතොමෝ; කතමාච, කවරීද? ගහපති, එම්බා ගෘහපතිය; ඉධ, මේ ලොකයෙහි; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; මුත්තචාගො, විශිෂ්ටත්‍යාගී වූයේ (හෙවත්) ත්‍යාගවන්තවූයේ; පයතපාණී, ධෞතහස්තයෙන් යුක්තවූයේ (හෙවත්) අශ්‍රද්ධාවන්ත තැනැත්තේ සියක්වරෙකුදු හස්තධෝවනය කලත් මලිනහස්තම වෙයි, ශ්‍රද්ධාවන්ත තැනැත්තේ දානාධ්‍යාශය ඇතිවන බැවින් කිලුටු හස්ත වූයේද පවිත්‍රහස්ත වෙයි එයින් පයතපාණී වූයේ; වොස්සග්ගරතො, වොස්සග්ගසඞ්ඛ්‍යාතවූ දානයෙහි ඇලුනු සිත්ඇත්තේ; යාචයොගො, යාචකයන්ට යොග්‍යවූයේ-යාචකයන් විසින් පින්වත අපට අන්නපානවස්ත්‍රාභරණාදිය දෙව යනාදීන් යාචකයන්ට යොග්‍යවූයේ; දානසංවිභාගරතො, "දානං දදන්තො සංවිභාගඤ්ච කරොන්තො දානසංවිභාගරතො නාමාති" යි හෙයින් සකස් කොට දන් දෙන්නේ චතුර්විධප්‍රත්‍යයන්ගේ විභජනවශයෙන් දානසංවිභාග කරන්නේ; විගතමලමච්ඡෙරෙන චෙතසා, විගමනය කරණලද මසුරුමල ඇත්තාවූ චිත්තයෙන් යුක්තව; අගාරං, ගෘහවාසයෙහි; අජ්ඣාවසති, වාසය කරන්නේය; ගහපති, එම්බා ගෘහපතිය; අයං, මේ තොමෝ; චාගසම්පදා, ත්‍යාගසම්පත්ති යයි; වුච්චති, කියනු ලැබේ.

මෙහි දක්වනලද ත්‍යාගසම්පත්තිසඞ්ඛ්‍යාතවූ දානයෙහි විභාග නම් කවරහයත්? දානය නම්.

"දානං සීලං ච නෙක්ඛම්මං පඤ්ඤා විරියෙන පඤ්චමං,
ඛන්ති සච්චමධිට්ඨානං මෙත්තුපෙක්ඛාතිමෙ දස" යි.

වදාරණලද දශපාරමිතාවන් කෙරෙහි පළමුවන පාරමිතා නම් වන්නීය.

"දානං සීලං ච භාවනා පත්තිපත්තානුමොදනා,
වෙය්‍යාවච්චා පචායනඤ්ච දෙසනාසුති දිට්ඨිජු" යි.

වදාරණලද දශවිධ පුණ්‍යක්‍රියා වස්තූන්කෙරෙහි පළමුවන පුණ්‍යක්‍රියා වස්තුව නම් වන්නේය.

"දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං,
අක්කොධො අවිහිංසා ච ඛන්ති ච අවිරොධතා" යි.

වදාරණලද දශරාජධර්මයන්කෙරෙන් පළමුවන රාජධර්මය නම් වන්නේය. දානප්‍රියවචනාර්ථචර්‍ය්‍යාසමානාත්මතාය යන සතර සඞ්ග්‍රහ වස්තූන්කෙරෙහි පළමුවන සඞ්ග්‍රහ වස්තුවය-දාන ශීල භාවනා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තූන්කෙරෙහි පළමුවන පුණ්‍යක්‍රියාවය, හැම බෝසතුන් හසළමාර්ගය, හැම බුදුවරයන්ගේ වංශයි-දන් දෙනුවන්විසින් දානයෙන් පූර්වභාගයෙහි තුෂ්ට වූව මැනව, දෙමින් චිත්තප්‍රසාද කළ මැනව, දී සොම්නස් වූව මැනවි මේය දානසම්පත්ති නම්-එයින් කීහ.

"පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයෙ,
දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා" යි

දන් දෙනුයේ බොහෝ දෙනාහට ප්‍රිය වෙයි, සජ්ජනයන්ගේ සමාගමය ලැබෙයි, ඔහුගේ යශස් දශදිශායෙහි පැතිර බඹලොව දක්වා නැගෙයි, ගිහි වැසියන්ගේ ධර්මයන් අනපෙත වෙයි, ශරීරභෙදයෙන් උත්තරියෙහි ස්වර්ග පදප්‍රාප්ත වේ-වදාළේ මැනො.

"පඤ්චිමෙ භික්ඛවෙ දානෙ ආනිසංසා කතමෙ පඤ්ච? බහුනො ජනස්ස පියො හොති මනාපො සන්තො සප්පුරිසා භජන්ති කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති ගිහිධම්මා අනපෙතො හොති කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච දානෙ ආනිසංසා" යි.

යමෙක් ශ්‍රද්ධායෙන් දන් දේද සත්කාර කොට දේද කාලයෙන් දේද මානස ශක්තියෙන් අපරිග්‍රහිතචිත්තව දේද තමහටද මෙරමාහටද උපඝාත නොකොට දේද ශ්‍රද්ධායෙන් දන් දුන්නේ යම්යම් තැනෙක්හි ඒ දානය ඵල දුන් කල මහා භොගද වෙයි අභිරූපද වෙයි, සත්කාර කොට දන් දුන්නේ එසෙයින්ම මහා භොගද වෙයි ඔහුගේ පුත්‍රදාසකර්මකාරාදීහු විධෙය වෙත්-කාලයෙන් දන් දුන්නේ මහාභොගද වෙයි, සුකෘත ප්‍රාප්තකාලයෙහි සම්පත් අනුභවකරන්නට නිසි වයසැ ඔහට උපදනා අර්ථයෝ විපුලවද උපදිත්-මානසශක්තියෙන් අපරිග්‍රහිත චිත්තව දන් දුන්නේ මහාභොගද වෙයි, උදාරවූ පඤ්චකාමගුණ පරිභොගයට චිත්තය අවනත වෙයි, තමහටද මෙරමාහටද උපඝාත නො කොට දන් දුන්නේ මහාභොගද වෙයි, ඔහුගේ සම්පතට ගින්නෙන් දියෙන් රජුන් සොරුන් විසින් භයද නොවෙයි, මෙයිදු සත්පුරුෂ දානයි-වදාළේ මැනො.

"පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි, කතමානි පඤ්ච? සද්ධාය දානං දෙති සක්කච්චං දානං දෙති කාලෙන දානං දෙති අනග්ගහිතචිත්තො දානං දෙති අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච දානං දෙති, සද්ධාය ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො අභිරූපො ච හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, සක්කච්චං ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි සුස්සූසන්ති සොතං ඔදහන්ති අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, කාලෙන ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො කාලගතාවස්ස අත්ථා පචුරා හොන්ති, අනග්ගහිතචිත්තො ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො උළාරෙසු චස්ස පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති-, අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො න

වස්ස කුතොචි භොගානං උපඝාතො ආගච්ඡති අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියතො වා දායාදතො වා, ඉමානි ඛො භික්ඛවෙ පංච සප්පුරිසදානානි" යි.

මනාප දන් දුන්නේ මනාපස්ථාන ලැබෙයි, අග්‍රදාන දුන්නේ අග්‍රස්ථාන ලැබෙයි, වරදාන දුන්නේ වරපදප්‍රාප්ත ලැබෙයි, ශ්‍රෙෂ්ඨදාන දුන්නේ ශ්‍රෙෂ්ඨපද ප්‍රාප්ත වෙයි, හේ උපනුපන්නක්හි දීර්ඝායුෂ හා මහත් යශස් ඇති වේ-වදාළේ මැනො උග්‍රදෙවපුත්‍රයාහට.

"මනාපදායී ලභතෙ මනාපං අග්ගස්ස දාතා ලභතෙ පුනග්ගං,
වරස්ස දාතා වරලාභි හොති සෙට්ඨං දදෙ සෙට්ඨමුපෙති ඨානං.
යො අග්ගදායී වරදායී සෙට්ඨදායී ච යො නරො,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජති" යි.

මෙසේ දන් දෙනුයේ ප්‍රතිග්‍රාහකයන්ට දෙය්‍යවස්තුව මතු දුන්නා නම් නො වෙයි, ආයුෂ වර්ණ සැප බලද ප්‍රතිභානද දුන්නා නම් වෙයි-වදාළේ මැනො-දාන ඵල දක්වන බුදුන්විසින්.

"භොජනං භික්ඛවෙ දදමානො දායකො පටිග්ගාහකානං පඤ්චඨානානි දෙති කතමානි පඤ්ච ? ආයුං දෙති වණ්ණං දෙති සුඛං දෙති බලං දෙති පටිභානං දෙති, ආයුං ඛො පන දත්වා ආයුස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා, වණ්ණං දත්වා-පෙ-සුඛං දත්වා බලං දත්වා පටිභානං දත්වා පටිභානස්ස භාගී හොති දිබ්බස්ස වා මානුසස්ස වා" යි,

දානයෙන් සිද්ධ නොවන ලෞකිකලෝකොත්තර සම්පත් නම් නැති-එයින් වදාළහ.

"දානං හි ලොකෙ සක්කසම්පත්තිං දෙති මාරසම්පත්තිං දෙති බ්‍රහ්මසම්පත්තිං දෙති චක්කවත්තිසම්පත්තිං දෙති සාවකපාරමීඤාණං දෙති පච්චෙකබොධිඤාණං දෙති අභිසම්බොධිඤාණං දෙති" යි.

මේ හැම දානයට වඩා ත්‍රිවිධපර්‍ය්‍යාප්තියැ අලගද්දූපමාපරියත්තියෙන් විනිර්මුක්තවූ නිස්සරණධර්‍මයෙන් පවත්වනලද ධර්‍මදානයම මහාදාන නම් වේ-හේ කෙසේද යත් ?

යම්කිසිවෙක් ඉදින් සියලු සක්වළගැබ බඹලොව දක්වා නිරන්තරයෙන් වැඩහුන් බුදු පසේබුදු මහරහත්නට දුන් සියුම් සිවුරුදානයට වඩා එම පිරිසට පා පුරා දුන් ප්‍රණීත පිණ්ඩපාතදානයට වඩා එසෙයින්ම පා පුරා දුන් සප්පිනවනීතාදි භෛසජ්‍යදානයට වඩා මහාවිහාර සදෘශවූ විහාරසහස්‍රයන් හා ලෝවාමහාපාය සදෘශවූ ප්‍රාසාදසහස්‍රයක් හා කරවා දුන් සෙනසුන් දානට වඩා අනේපිඩු මහසිටුහු දෙව්රම් සඳහා කරණලද සුපර්ණස් කෙළක් ධන පරිත්‍යාගයට වඩා සටත්පිරිසෙයින් සතර පද ගාථාවකින් කරණ අනුමොදනා වශයෙන් පවත්වන ලද ධර්‍මදානයම අග්‍ර වෙයි-මෙවැනි මහාදානයද පවා ඒ ගය පින්කම් සොලොසක් කොට බෙදූ කල එයින් එක්භාගයෙක් අගනේ නොවෙයි, මෙසේම බණකියනුදු කියවනුදු අසනුදු මහාඵලය යමක්හුවිසින් ධර්මශ්‍රවණය කරණලදද ඔහටද මහත්ඵල මහානෘශංස නම් වේ, එයට හේතු කවර යත් ? එබඳු

පින්කම්කරන්නාහු බණම අසා කෙරෙති, නො අසා නොම කෙරෙත්, ඉදින් සත්හු බණ නො ඇසුවාහු වූහු නම් ලුවක් පමණ හබදු කොණ්ඩස්සක් පමණ බතුදු අන්හට නො දෙත්.

අපිච-කපක්දවස්වට වැස්සෙහි දියබිඳු ගණින්ට පොහොසත් නුවණ ඇති දම්සෙනෙවිසැරියුත් මහතෙරුන් වැනි මහාපුරුෂයෝද පවා තමන්ගේ ධර්මතාවෙන් සෝවාන්පල පසක් කරන්නට නො පොහොසත් වූහු-අස්සජි මහතෙරුන්වහන්සේ වදාළ ගාථාර්ධධර්මයක් අසා සෝවාන් වූහු-බුදුන් වදාළ දම්දෙසුන් අසා රහත්වූහු-මහාධර්මශ්‍රවණද ප්‍රකෘතිධර්මශ්‍රවණද උපනිශ්‍රිත කථාද චතුෂ්පදික ගාථායෙකින් කරණලද අනුමෝදනාද ධර්මදානයි-මෙසේ සියලු දානට වඩා ධර්මදානය අග්‍රදාන බැවින් මහාදාන නම් වේ-එයින් වදාළහ සක්දෙව්රජහට.

"සබ්බදානං ධම්මදානං ජිනාති සබ්බං රසං ධම්මරසො ජිනාති,
සබ්බං රතිං ධම්මරතී ජිනාති තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති"යි.

එබැවින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් දාන ශීලාදී කුශලධර්මයෙහි පිහිටා ස්වර්ගමොක්ෂ සම්පත් ලැබීමට උත්සාහ කටයුතු.

ගහපති, එම්බා ගෘහපතිය; පඤ්ඤාසම්පදා, ප්‍රඥාසම්පත්තිතොමෝ; කතමා, කවරීද? ගහපති, එම්බා ගෘහපතිය; අභිජ්ඣා විසමලොභාභිභූතෙන චෙතසා, අභිධ්‍යාසඞ්ඛ්‍යාත විෂමලොභයෙන් මැඩපවත්නාවූ චිත්තයෙන් යුක්තව; විහරන්තො, වාසය කරන්නේ; අකිච්චං, අකර්තව්‍යය (හෙවත්) නො කටයුතු; කරොති, කරන්නේය; කිච්චං, කර්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙති, නො කරන්නේය, අකිච්චං, අකර්තව්‍යය (හෙවත්) නො කටයුතු; කරොන්තො, කරන්නේ; කිච්චං, කර්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙන්තො, නො කරන්නේ; යසාච, ගුණකථන වශයෙන් ප්‍රචුරතවූ යශසින්ද; සුඛාච, ඓහලෞකිකපාරලෞකික සුවයෙන්ද; ධංසති, ප්‍රපතිත වන්නේය (හෙවත්) පිරිහෙන්නේය.

මෙහි දක්වනලද අභිධ්‍යාසඞ්ඛ්‍යාත විසමලොභයෙහි ආදීනව නම් කවරහයත්? ලොභී පුද්ගලතෙම ආත්මාර්ථපරාර්ථයන් ඥානචක්ෂුසින් නො දක්නා හෙයින් අන්ධ නම් වේ-එයින් වදාළහ.

"ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො අත්ථං න පස්සති,
අන්ධතමං තදා හොති යං ලොභො සහතෙ නරං" යි.

ලොභයෙන් අලොභය නූපදනේය ලොභයෙන් ලොභයම උපදනේය ලොභජවූ කර්මයෙන් දිව්‍යමනුෂ්‍යාදි ස්වර්ගොත්පත්ති නො වේ-එයින් වදාළහ.

"න භික්ඛවෙ ලොභා අලොභො සමුදෙති අථ ඛො භික්ඛවෙ ලොභා ලොභොව සමුදෙති න භික්ඛවෙ ලොභජෙන කම්මෙන දෙවා පඤ්ඤායන්ති මනුස්සා පඤ්ඤායන්ති යාවා පනඤ්ඤාපි සුගතියො" යි-අලොභයෙන් ලොභය නූපදවන්නේය අලොභයෙන් අලොභම උපදවන්නේය අලොභජකර්මයෙන් අපායොත්පත්ති නොවේ-එයින් වදාළහ.

“න භික්ඛවෙ අලොභො ලොභො සමුදෙති අථඛො භික්ඛවෙ අලොභො අලොභොව සමුදෙති න භික්ඛවෙ අලොභජෙන කම්මෙන නිරයෙ පඤ්ඤායන්ති තිරච්ඡානයොනි පඤ්ඤායන්ති යා වා පනඤ්ඤාපි දුග්ගතියො” යි-ලොභය බලවත් අකුශලය ලොභයෙන් මැඩපවත්නාහුය මෙරමාහට වධබන්ධනාදිය කොට අනෙකප්‍රකාරවූ අකුශලධර්‍මයන් ප්‍රසව කෙරේ-එයින් වදාළහ.

“යදපි භික්ඛවෙ ලොභො තදපි අකුසලං යදපි ලුද්ධො අභිසඞ්ඛරොති කායෙන වාචාය මනසා තදපි අකුසලං යදපි ලුද්ධො ලොභෙන අභිභූතො පරියාදින්න චිත්තො පරස්ස අසතා දුක්ඛං උපදහති වධෙන වා බන්ධනෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා බලවම්හි බලවත්තො ඉතිපි තදපි අකුසලං ඉතිස්ස මෙ ලොභජා ලොභසමුදයා ලොභපච්චයා අනෙකෙ පාපකා අකුසලාධම්මා සම්භවන්ති” යි.

අපිච-මේ ලොකයෙහි සත්වයෝ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියලු වස්තුවෙහි ලොභවශයෙන් මිය තිරිසන් යොනියෙහි උපදින්නේය, එසේම අතික් සිටානකෙණෙක් තිස්කෙලක් වස්තු නිධාන කොට තබා ලොභයෙන් මිය වස්තුපිට සජීව උපන්නේය, එසේම අනික් සිටානකෙණෙක් තිස්කෙලක් නිධාන කොට තබා ධනලොභයෙන් මිය මූෂිකවැ උපන්නේය, කසී රජ්ජුරුවන්ගේ උබහරී නම් බිසව උයනෙහි ලොභයෙන් මිය එම උයනෙහි ගොම්පැණිවැ උපන්නේය, තවද එක්තරා පුරුෂයෙකු පුතුන් දෙබෑකෙණෙකුන් හා එකම දුවක් වුව, ඒ දෙබෑයන්ගේ වැඩිමහළු පුතනුවෝ සමීපයෙහි විහාරයක වසන භික්ෂූන්වහන්සේ වදාරන්නාවූ බණ්‍ඩ අසා මහණවැ රහත් වූහු, කුඩා පුතනුවෝ ගිහිගෙයිම විසුව, උන්ගේ පියානෝ තමන්ගේ වැවෙහි කුඹුරෙහි ලොභයෙන් මිය ගොස් එහි ඌරුවැ උපන්හ, මෑනියෝ වලන් ආදියෙහි ලොභ කොට මිය ඒ ගෙයි ගැරඬිදෙන්වැ උපන්හ, නැගනියෝ දියකෙළි ආදියෙහි ලොභ කොට එම වැව මැඩිවැ උපන්හ, එක් දවසක් ගැරවිල්දෙන් ගොදුරු සොයා වැවට ගිය තැනැත්හි ඒ මැඩි ගැලපුව ගොදුරු කා නික්මැ ගෙණ ගැරවිල්දෙන හූරු ගිලීය, කරල් කන්නට බස්නා හූරු කුඩා පුතනුවෝ විද මරා මේ හූරුමස් මාගේ බෑනන්වහන්සේටත් දී අනුභව කළ මැනවැයි සිතා උදෑසනම විහාරයට ගොස් ඌරුමසක් ලදිම්යි, එසේ හෙයින් අද මාගේ ගෙයිදී වලඳන්ට වැඩියහොත් යහපතැයි කීවුය, එසේ තෙරුන්වහන්සේ කෙසේ උපන් ඌරුමස් දැයි ශෝධි පරීක්‍ෂා කොට බලා අප එනතෙක් හූරු මස් නො කරවයි මලනුවන් යවා මොහට පිටිවහල්වුව මැනවයි සිතා ධර්‍මසංවෙගයට පැමිණ පළමුව පැවති සියලුම කාය්‍ය්‍යම නුවනැසින් දැක කළ මනා වැඳිම් පිඳිම් ආදී සියලු කාය්‍ය්‍ය කොට නිමවා ගැටවවු ගන්වා පාත්‍රය අතින් ගෙණ මලනුවන්ගේ ගෙට ගොස් හූරු බලම්හයි කී කල්හි යහපත ස්වාමීනි යී කියා මලනුවෝ හූරු ගෙණහැර පෑවාහුය, එසඳ තෙරුන්වහන්සේ එතන සිට මේ හූරු බඩ ගැරඬිදෙනක් ඇතැයි කියා හූරුබඩ පලවා ගැරවිල් දෙන මෑත් කරවූයේය, නැවත ගැරවිල්දෙන බඩ මැඩියෙක් ඇතැයි කියා ගැරවිල්දෙනබඩ පලවා මැඩි මෑත් කරවා හූරු සමීපයෙහි ගැරවිල්දෙන

හොවා ගැරවිල්දෙන සමීපයෙහි මැඩියා හොවා මේ හූරා නම් තොපගේ පියානෝය, මේ ගැරවිල්දෙන නම් තොපගේ මෑනියෝය, මේ මැඩියා නම් තොපගේ නැගනියෝ යයි කීසේක, එසඳ මලනුවෝ භය පත්වැ ස්වාමීනි මූ හැමදෙන කුමක් නිසා මෙබඳුව උපන්හුදැයි විචාළාහුය, තෙරුන්වහන්සේ ඒබස් අසා වදාරණසේක් තොපගේ පියානෝ වැව හසර ලොභ කොට මිය එහි හූරුවැ උපන්හ, මෑනියෝ ගෙයි වලන් ආදියෙහි ලොභයෙන් මිය එහි ගැරඬිදෙන්වැ උපන්හ, තොපගේ නැගනියෝ දියකෙළියෙහි ලොභ කොට මිය එම වැවැ මැඩිවැ උපන්හ, මැඩි ගැරවිල්දෙන ගිලුව, ගැරවිල්දෙන හූරු ගිලිය, හූරා තොප ගලවන්ට සිටියාහුදැයි වදාළසේක, එසඳ මලනුවෝ භයින් ත්‍රස්තව ස්වාමීනි ජාතියෙන් වෙන්වූ කල මෙසේ වන නියාවෙද මෙසේ වන බව පළමු නොදන්මි සී වෙවුලන්ට වන්හ, තෙරුන්වහන්සේ මලනුවන්ගේ බස් අසා සසර අග්මුල් නැති පරිදි දක්වා ධර්මදෙශනා කළසේක, මලනුවෝ බණ අසා සසර කලකිරී ගිහිගෙන් නික්මැ බෑනන්වහන්සේ සමීපයෙහිම මහණව රහත්වැ අමෘතමහානිර්වාණයට පැමුණුනුසේක, එබැවින් උභය ලොකාර්ථකාමීවූ සත්පුරුෂයන් විසින් විෂම ලොභාදිය දුරු කොට කුශලධර්මයෙහි යෙදී සග මොක්සිරි සැප අත්පත්කට යුත්තේය.

ගහපති, එම්බා ගෘහපතිය; ව්‍යාපාදාභිභූතෙන චෙතසා, චිත්තයාගේ ප්‍රකෘතිභාවය නසන්නාවූ ව්‍යාපාදයෙන්වූ මැඩපවත්නා චිත්තයෙන් යුක්තව; විහරතො, වාසයකරන්නේ; අකිච්චං, අකර්ත්තව්‍යය (හෙවත්) නො කටයුතු; කරොති, කරන්නේය; කිච්චං, කර්ත්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙති, නො කරන්නේය; අකිච්චං, අකර්ත්තව්‍යය; කරොන්තො, කරන්නේ; කිච්චං, කර්ත්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙන්තො, නො කරන්නේ; යසාච, ගුණකථන වශයෙන් ප්‍රවෘත්තවූ යශසින්ද; සුඛාච, ඓහලෞකිකපාරලෞකික සුවයෙන්ද; ධංසති, ප්‍රපතිත වන්නේය (හෙවත්) පිරිහෙන්නේය.

මෙහි දක්වනලද ව්‍යාපාදය ප්‍රතිඝසඞ්ඛ්‍යාත ක්‍රොධය කරණ කොට ගෙණ උපදනේය, ඒ ක්‍රොධයෙහි දොෂ නම් කවර යත් ? ආකාශයසේ අනන්තාපරිමාණ දුර්ජනයන් හැමදෙනාම මරන්ට නො පිළිවන් බැවින් ක්‍රොධචිත්තයා මරණු මැනව, එකල හැම සතුරෝම මාරිත වෙත් - එයින් කිහ.

“කියතො මාරයිෂ්‍යාමි දුර්ජනාන් ගගනොපමාන්,
මාරිතෙ ක්‍රොධචිත්තෙ තු මාරිතාස්සර්වශත්‍රවඃ” යි.

යම්සේ කෙළ මුකුණු ඈ අශුචි මෘක්ෂිතස්ථාන එම අශුචින් දෝනේ පිරිසිදු කරන්නට නිර්ගන්ධකරන්නට අසමර්ථ වෙයි ඒතැන් භූයොභාවයෙන් අශුධ වෙයි දුර්ගන්ධ වෙයි, එසෙයින්ම හැවූවාහු හවනුයේ ගැසුවාහු ගසනුයේ වෛරයෙන් වෛර සංසිඳුවන්නට අසමර්ථ වෙයි, භූයොභාවයෙන් වෛරම කෙරේ, මෙසේ වෛරයෙන් වෛරය කිසිකලෙක්හිදු සන්හිඳුනේ නො වෙයි සිට සිට මඩී, යම්සේ කෙළ මුකුණු ඈ අශුචීහු විප්‍රසන්නොදකයෙන් දෙවුනාලද්දාහු නසත් ඒතැන් ශුධද වෙයි නිර්ගන්ධ වෙයි, එසෙයින්ම

අභවෙරයෙන් ක්ෂාන්ති මෛත්‍රී නැමැති උදකයෙන් වෛරයෝ සංසිඳෙති නසති අභාවයට යෙත්, මෙසේ අවෛරයෙන් වෛරය සංසිඳුවනු හැම පසේ බුදු මහරහතන් ගියමඟ-එයින් වදාළහ.

"නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො" සී.

යම්සේ කාෂ්ඨමථනයෙන් නැඟී ගිනිම එම කාෂ්ඨයෙහි ඇවිළ ගෙණ දවා ද? එසෙයින්ම යමක්හට සාරම්භයෙන්ම ක්‍රොධ උපන්නේ වීනම් ඔහුගේම සන්තානය දවයි-එයින් වදාළහ.

"කට්ඨස්මිං මත්ථමානස්මිං පාවකො නාම ජායති,
තමෙව කට්ඨං ඩහති යස්මා සො ජායතෙ ගිනි.
එවං මන්දස්ස පොසස්ස බාලස්ස අවිජානතො,
සාරම්භා ජායතී කොධො සොපි තෙනෙව ඩඃහති" සී.

තෘණයෙන් හා කාෂ්ඨයෙන් වඩනා ගිනිසෙයින් යමක්හුගේ ක්‍රොධ වඩී ද ඔහුගේ යශස් කෘෂ්ණපක්ෂයෙහි සඳහු සෙයින් පිරිහෙයි-එයින් වදාළහ.

"අග්ගීව තිණකට්ඨස්මිං කොධො යස්ස පවඩ්ඪති,
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්දිමා" සී.

ඉන්ධන රහිත ගින්නක්සෙයින් යමක්හුගේ ක්‍රොධ සංසිඳිද ඔහුගේ යශස්ද ශුක්ලපක්ෂයෙහි සඳහු සෙයින් වඩී-එයින් වදාළහ.

"අනෙධො ධූමකෙතූව කොධො යස්සූපසම්මති,
ආපූරයති තස්ස යසො සුක්කපක්ඛෙව චන්දිමා" සී.

ඝතවණ්ණාවෙන් රජස් සන්හිඳුනා නියායෙන් ක්ෂාන්තිමෛත්‍රීන් ද්වෙෂයන් සන්හිඳුවූ පරිදි දක්වන්නට වදාළහ - තමන් සුලුබෝසතවුස් කල්හි.

"උප්පජ්ජෙ මෙ න මුච්චෙය්‍ය න මෙ මුච්චෙය්‍ය ජීවතො,
රජඤ්ච විපුලා වුට්ඨි ඛිප්පමෙව නිවාරයෙ" සී.

ගූථකූපයන් බඳු ක්‍රොධ ශීලී පුද්ගලයා හා බුදුහු සංවාසය නො කරන්නට වදාළහ.

"සෙය්‍යථාපි භික්ඛවෙ ගූථකූපො කට්ඨෙන වා කඨලාය වා ඝට්ටිතො භිය්‍යො සොමත්තාය දුග්ගන්ධො හොති, එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො කොධනො හොති උපායාස බහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිට්ඨීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයං ච පාතුකරොති එවරූපො භික්ඛවෙ පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො" සී.

දෙමිවුඇති කියතෙකින් සොරහු යමක්හුගේ අඟපසඟ කඩද්ද හේ එවැනි කලද ද්වෙෂ නොකළේ වීනම් මේ සස්නෙහි පිළිවෙත් කළා නම් වේ-එයින් වදාළහ.

"උභතො දණ්ඩකෙන චෙපි භික්ඛවෙ කකචෙන චොරා ඔචරකා අඞ්ගමඞ්ගානි ඔක්කන්තෙය්‍යුං තත්‍රාපි යො මනො පදූසෙය්‍ය න මෙ සො තෙන සාසනකරො" යි.

යමෙක් ක්‍රොධ උපනාහ බහුල විද හේ නරකයෙහි නිෂ්පන්නමැයි - එයින් වදාළහ.

"ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ කතමෙහි ද්වීහි කොධනො ච උපනාහෙන ච" යි.

මෙසේ යමක්හු මහානර්ථදායක වූ ක්‍රොධය දුරු කොට මහානිසංසදායක වූ මෛත්‍රී පිරියයුතු, මෛත්‍රී මහානිසංස වන පරිදි කිසේද යත්? යමක්හුගේ චීවරයක් හෝ පිණ්ඩපාතයක් හෝ සයනාසනයක් හෝ ගිලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයක් හෝ පරිභොගකරණ භික්ෂුවෙක් මෛත්‍රීභාවනා කෙරේද ඔහුගේ පුණ්‍යස්කන්ධ මහාසමුද්‍රයෙහි උදකස්කන්ධ සෙයින් අසඞ්ඛ්‍යය අප්‍රමෙය්‍ය වෙයි අචින්ත්‍යය වේමැයි - එයින් වදාළහ.

"සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දෙ න සුකරං උදකස්ස පමාණං ගහෙතුං එත්තකානි උදකාළ්හකානීති වා එත්තකානි උදකාළ්හකසතානීති වා එත්තකානි උදකාළ්හකසහස්සානීති වා එත්තකානි උදකාළ්හකසතසහස්සානීති වා අථ ඛො අසංඛෙය්‍යො අප්පමෙය්‍යො මහාඋදකක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡති, එවමෙව ඛො භික්ඛවෙ ඉමෙහි චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතීති අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධොත්වෙව සඞ්ඛං ගච්ඡතී" යි,

යනාදීන් මෙසේ දායකයනට ඵලවිපුල වනකල භාවකයනට කියයුතු කිම, එසේම සුභූති මහතෙරහු දායකයනට ඵල විපුලවනු සඳහා කෙණෙහි අහර සිඟන්නාහු දොරදොර සිට අහර ගෙණ එතතුරු මෛත්‍රීධ්‍යානසමාපත්තියට සමවැද එයින් නැගී දෙය්‍යධර්ම පිළිගණිත් - දොරදොර සිට නිරොධසමාපත්තියට සමවදනා දම්සෙනෙවි ශරියුත් මහතෙරහු සෙයිනි - එයින් කීහ සඟිඅටුවායෙහි.

"ධම්මසෙනාපති කිර වත්ථුං සොධෙති සුභූතිත්ථෙරො දක්ඛිණං සොධෙති තථාහි ධම්මසෙනාපති පිණ්ඩාය චරන්තො ගෙහද්වාරෙ ඨිතො යාව භික්ඛං ආහරන්ති තාව බුද්ධභාගෙන පරිච්ඡින්දිත්වා නිරොධං සමාපජ්ජති නිරොධා වුට්ඨාය දෙය්‍යධම්මං පතිගණ්හාති සුභූතිත්ථෙරො තථෙව මෙත්තාජ්ඣානං සමාපජ්ජිත්වා මෙත්තාජ්ඣානා වුට්ඨාය දෙය්‍යධම්මං පතිගණ්හාති" යි.

යම් භික්ෂුවෙක් මෛත්‍රීභාවනායෙහි අර්පණෝපචාර විනාම සච්චිසඞ්ඛ්‍යයන්ට හිත සම්පූර්ණ චිත්තය අසුරු සැණෙක්හිදු ආසෙවනය කෙරේද හේ අපරිත්‍යක්තධ්‍යානවැ වෙසෙයි, මෙසෙයින් බුදුන්ගේ සසුන් කම් කළා නම් වේ, ඔහට

දුන් දනය මහත්ඵල මහානෘශංස වන බැවින් ක්ෂීණාශ්‍රවයා සෙයින් ස්වාමීව ශෛක්ෂයා සෙයින් දායාද භාග්වැ අනාණිව අචොරව පිණ්ඩපාත පරිභොග කෙරේ-එයින් වදාළහ.

"අච්ඡරා සඞ්ඝාත මත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං ආසෙව ති අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අපරිත්තජ්ඣානො විහරති සත්ථුසාසනක රො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති කො පන වාදෙ යෙ නං බහුලී කරොන්තීති" යි.

මෛත්‍රීභාවනා කරණ්නුයේ සුවයෙන් නිදයි, සුවයෙන් පුබුදී, පාපස්වප්න නො දකී මනුෂ්‍යයන්ටද අමනුෂ්‍යයන්ටද ප්‍රිය වෙයි, දෙවතාවෝ ඔහු රකිත්, අග්නි විෂ ශස්ත්‍රයෙන් උපද්‍රව නො වෙයි, වහා චිත්තසමාධාන ඇති වෙයි, මුහුණ පහන්පැහැය ඇති වෙයි, නුමුළාව කාලක්‍රියා කෙරෙයි, අධිගම නො කෙළේවීනම් බ්‍රහ්මලොකයෙහි උපදී-එයින් වදාළහ.

"මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියා-පෙ-උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති" යි යම්තාක් තාරකාවන්ගේ ප්‍රභා චන්ද්‍රප්‍රභාවගේ සොළොස්වන කලාවට අගනේ නො වෙයි, චන්ද්‍රප්‍රභා ඒ තාරකාවන්ගේ ප්‍රභා අභිභවා දිළියෙයි, එසෙයින්ම යම්තාක් උපධිනිබන්ධන පුණ්‍යකර්මයෝ මෛත්‍රීභාවනා ලක්ෂණ පුණ්‍යකර්මයාගේ සොළොස්වන කලාවට නො අගිත්-එයින් වදාළහ.

"සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි තාරකරූපානං පභා සබ්බා තා චන්දිමප භාය කලං නාග්ඝන්ති සොළසිං, චන්දප්පභායෙව අධිගගහෙත්වා භාසතෙච ත පතෙච විරොචතිච, එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤ කිරියවත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතො විමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙතො විමුත්ති අධිගගහෙත්වා භාසතෙච තප තෙච විරොචතිච" යි-යම්සේ සරත්කල්හි නැඟී සූර්‍ය්‍යයා හැමතැන්හි අන්ධකා ර විධ්වංසනය කොට දිළියේද එසෙයින්ම යම්තාක් භවසුඛසම්පාදක පින්ක ම්හු මෛත්‍රීභාවනාලක්ෂණ පින්කම්හුගේ සොළොස්වන කලාවට නොවටිත්-වදාළේ මැනො.

"සෙය්‍යථාපි භික්ඛවෙ වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විසුද්ධෙ විගත වලාහකෙ දෙවෙ වස්සනෙන ආදිච්චො නභං අබ්භුස්සුක්කමානො සබ්බං ආ කාසගතං තමගතං විහච්ච භාසතෙච තපතෙච විරොචතිච, එවමෙව ඛො, භික්ඛවෙ යානි කානිචි ඔපදිකානි පුඤ්ඤකිරියවත්ථූනි සබ්බානි තානි මෙ ත්තාය චෙතො විමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙ තො විමුත්තියා අධිගගහෙත්වා භාසතෙච තපතෙච විරොචතිච" යි.

යම්සේ අළුයම් නැඟී දහවත්තරු උද්දීප්තව දිළියේද එසෙයින්ම යම්තාක් භවභොගදායක පින්කම්හු මෛත්‍රීභාවනාලක්ෂණ පුණ්‍යකර්මයාගේ සො ළොස්වන කලාව නොවටිති, මෛත්‍රීම ඒ පුණ්‍යකර්මයම අභිභවා දිළියෙයි-වදාළේ මැනො,

"සෙය්‍යථාපි භික්ඛවෙ රත්‍යා පච්චූසසමයං ඔසධීතාරකා භාසතෙච තපතෙච විරෝචතිච, එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔසධිකානි පුඤ්ඤකිරියවත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තා චෙතොවිමුත්තියා අධිගගහෙත්වා භාසතෙච තපතෙච විරෝචතිච" යි-එබැවින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් හැමසත්හු සුවපත් වෙත්වයි යනාදීන් මෛත්‍රීභාවනා කොට එයින් ජනිතවූ ඉෂ්ටවිපාකයෙන්ම ස්වර්ගමොක්ෂ සම්පත් ලැබීමට උත්සාහ කටයුතු.

ගහපති, එම්බා ගෘහපතිය; ථීනමිද්ධාභිභූතෙන චෙතසා, ආලසිකචපලාධික ස්වභාව කොට ඇති කාය චිත්ත දෙදෙනාගේ අකර්මණ්‍යබව කරන්නාවූ ථීනමිද්ධයෙන් මැඩපවත්නාවූ චිත්තයෙන් යුක්තව; විහරන්තො, වාසය කරන්නේ; අකිච්චං, අකර්තව්‍යය (හෙවත්) නො කටයුතු; කරොති, කරන්නේය; කිච්චං, කර්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙති, නො කරන්නේය; අකිච්චං, අකර්තව්‍යය; කරොන්තො, කරන්නේ; කිච්චං, කර්තව්‍යය; අපරාධෙන්තො, නො කරන්නේ; යසාච, ගුණකථන වශයෙන් ප්‍රවෘත්තවූ යශසින්ද; සුඛාච, ඓහලෞකික පාරලෞකික සුවයෙන්ද; ධංසති, ප්‍රපතිත වන්නේය (හෙවත්) පිරිහෙන්නේය-ගහපති, එම්බා ගෘහපතිය; උද්ධච්චකුක්කුච්චාභිභූතෙන චෙතසා, ධ්‍යානවිදර්ශනාදියෙන් ව්‍යුපසමිත නොවන්නාවූ චිත්තයයි කියනලද උද්ධච්චකුක්කුච්චයෙන් මැඩපවත්නාවූ චිත්තයෙන් යුක්තව; විහරන්තො, වාසය කරන්නේ; අකිච්චං, අකර්තව්‍යය (හෙවත්) නො කටයුතු; කරොති, කරන්නේය; කිච්චං, කර්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙති, නො කරන්නේය; අකිච්චං, අකර්තව්‍යය (හෙවත්) නො කටයුතු; කරොන්තො, කරන්නේ; කිච්චං, කර්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙන්තො නො කරන්නේ; යසාච, ගුණකථන වශයෙන් ප්‍රවෘත්තවූ යශසින්ද; සුඛාච, ඓහලෞකික පාරලෞකික සුවයෙන්ද; ධංසති, ප්‍රපතිත වන්නේය (හෙවත්) පිරිහෙන්නේය-ගහපති, එම්බා ගෘහපතිය; විචිකිච්ඡාභිභූතෙන චෙතසා, බුද්ධාදී අටතන්හි ශංසය ස්වභාව කොට ඇත්තාවූ විචිකිච්ඡාවෙන් මැඩපවත්නාවූ චිත්තයෙන් යුක්තව; විහරන්තො, වාසය කරන්නේ; අකිච්චං, අකර්තව්‍යය (හෙවත්) නො කටයුතු; කරොති, කරන්නේය; කිච්චං, කර්තව්‍යය (හෙවත්) කටයුතු; අපරාධෙති, නො කරන්නේය; යසාච, ගුණකථන වශයෙන් ප්‍රවෘත්තවූ යශසින්ද; සුඛාච, ඓහලෞකික පාරලෞකික සුවයෙන්ද; ධංසති, ප්‍රපතිත වන්නේය (හෙවත්) පිරිහෙන්නේයයි වදාළසේක.

මෙසේ අභිද්‍යා ව්‍යාපාද ථීන මිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡාය යන පඤ්චනීවරණයෙන් යුක්තවූ පුද්ගලතෙම අකර්තව්‍යවූ ප්‍රාණවධාදී අකුසල් කොට කටයුතුවූ කුශලධර්මයන් නො කොට උභය ලොකාර්ථයෙන් පිරිහෙන්නේ යයි වදාරා නැවත ඒ පඤ්චනීවරණ චිත්තයා සම්බන්ධවූ උපක්ලේශයය, හේ ආර්‍යශ්‍රාවකයා විසින් දුරු කටයුත්තේ යයි වදාරන්නාවූ සර්වගුණරත්නනිධානීකෘතවූ සර්වඥරාජොත්තමයානන්වහන්සේ "සඛො සො ගහපති අරියසාවකො" යනාදි පාළිය වදාළසේක.

ගහපති, එම්බා ගෘහපතිය; සඛො සො අරියසාවකො, ඒ මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ; අභිජ්ඣාවිසමලොභො, අභිද්‍යාසඞ්ඛ්‍යාත විෂමලොභය; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ උපක්කිලෙසොති, උපක්ලේශ යයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන, චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසං, උපක්ලේශවූ; අභිජ්ඣාවිසමලොභං, අභිධ්‍යාසඞ්ඛ්‍යාත විසමලොභය; පජහති, දුරුකරන්නේය-ව්‍යාපාදෙ, ප්‍රදූෂිතවූ චිත්තය; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන: චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසං, උපක්ලේශවූ; බ්‍යාපාදං, ප්‍රදූෂිතවූ චිත්තය; පජහති, දුරුකරන්නේය-ථීනමිද්ධං, ථීනමිද්ධය; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි; ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසං, උපක්ලේශවූ; ථීනමිද්ධං, ථීනමිද්ධය; පජහති, දුරුකරන්නේය-උද්ධච්චකුක්කුච්චං, ඖද්ධත්‍යකෞකෘත්‍යය; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසං, උපක්ලේශවූ; උද්ධච්චකුක්කුච්චං, ඖද්ධත්‍යකෞකෘත්‍යය; පජහති, දුරු කරන්නේය-විචිකිච්ඡා, විචිකිත්සාව; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසං, උපක්ලේශවූ; විචිකිච්ඡං, විචිකිත්සාව; පජහති, දුරුකරන්නේය.

ගහපති, එම්බා ගෘහපතිය; යතො ච ඛො, යම්හෙයකින් වනාහි; අරියසාවකස්ස, ආර්‍ය්‍යශ්‍රාවකයා විසින්; අභිජ්ඣාවිසමලොභො, අභිධ්‍යාසඞ්ඛ්‍යාත විෂමලොභය චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසො, උපක්ලේශවූ; අභිජ්ඣා විසමලොභො, අභිද්‍යාසඞ්ඛ්‍යාත විසමලොභය; පහීණො හොති, ප්‍රහීණ කෙළේ වේද-ව්‍යාපාදෙ, ප්‍රදූෂිතවූ චිත්තය; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසො, උපක්ලේශවූ; ව්‍යාපාදෙ, ප්‍රදූෂිතවූ චිත්තය; ප්‍රහීණො හොති, පහීණ කෙළේ වේද; ථීනමිද්ධං, ථීනමිද්ධය; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසොති, උපක්ලේශයයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසො, උපක්ලේශවූ; ථීනමිද්ධං, ථීනමිද්ධය; පහීණො හොති, ප්‍රහීණ කෙළේ වේද-උද්ධච්චකුක්කුච්චං, ඖද්ධත්‍යකෞකෘත්‍යය; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසං, උපක්ලේශවූ; උද්ධච්චකුක්කුච්චං, ඖද්ධත්‍යකෞකෘත්‍යය; පහීණො හොති, ප්‍රහීණ කෙළේ වේද-විචිකිච්ඡා, විචිකිත්සාව; චිත්තස්ස, චිත්තයා සම්බන්ධිවූ; උපක්කිලෙසොති, උපක්ලේශයයි කියා; ඉති, මෙසේ; විදිත්වා, දැන; චිත්තස්ස, චිත්තයාගේ; උපක්කිලෙසං, උපක්ලේශවූ; විචිකිච්ඡං, විචිකිත්සාව; පහීණො හොති, ප්‍රහීණ කෙළේ වේද-ගහපති, එම්

බා ගෘහපතිය; අයං අරියසාවකො, මේ පඤ්චොපක්ලේශයන් කෙරෙන් මිනිර්
මුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම; මහාපඤ්ඤො, මහත්වූ ප්‍රඥාඇති; පුථුපඤ්ඤො,
ප්‍රචුරවූ ප්‍රඥාඇති; ආපාථදසො, සියුම්වූ අර්ත්‍ථසමූහයන් දන්නා සුලුවූ; පඤ්ඤා
සම්පන්නො, ප්‍රඥාසම්පූර්ණ්‍ණ තැනැත්තේයයි කියා; වුච්චති, කියනුලැබේ-ග
හපති, එම්බා ගෘහපතිය; අයං, මෝ තොමෝ; පඤ්ඤාසම්පදා, ප්‍රඥාසම්පත්ති
යයි; වුච්චති, කියනු ලැබේ.

ගහපති, එම්බා ගෘහපතිය; ඉට්ඨානං, අනිෂ්ටප්‍රත්‍යෙපයෙන් ඉෂ්ටවූ; ක
න්තානං, සිත්හි ප්‍රීතිවශයෙන් ද්‍රවීභාවනාර්ත්‍ථයෙන් කාන්තවූ; මනාපානං,
සිත්පිණවීම් වශයෙන් අභිවෘද්ධිකරණාර්ත්‍ථයෙන් මනාපවූ; ලොකස්මිං, ලොක
යෙහි; දුල්ලභානං, අත්‍යන්ත දුර්ලභවූ; ඉමෙසං බො චතුන්නං ධම්මානං,
මේ චතුර්විධ ධර්ම්මයන්ගේ; පටිලාභාය, ප්‍රතිලාභයපිණිස; ඉමෙචත්තාරො
ධම්මා, මේ චතුර්විධධර්ම්මයෝ; සංවත්තන්ති, පවත්වන්නාහු යයි වදාළසේක.

මෙසේ යථොක්තප්‍රකාර සතර ධර්ම්මයන්ගේ ප්‍රතිලාභය පිණිස ශ්‍රද්ධාසම්පදා
දිවූ චතුර්විධධර්ම්මයක් වදාරා නැවත ආර්‍ය්‍යශ්‍රාවකයාවිසින් උට්ඨානසඞ්ඛ්‍යාත වීර්‍ය්‍ය
යෙන් අධිගතවූ වස්තූන් කරණකොට ගෙණ යුක්තප්‍රාප්තවූ කර්ම්ම සතරක්
වදාරන්නාවූ ඝනමොහතිමිර අසිසිර කිරණසමානවූ සර්‍වඥරාජොත්තමයා
නන්වහන්සේ “සචෙ සො ගහපති අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි ” ය
නාදී පාලිය වදාළසේක.

ගහපති, එම්බා ගෘහපතිය; සචෙ සො අරියසාවකො, ඒ මේ ආර්‍ය්‍යශ්‍රාවක
තෙම; උට්ඨානවිරියාධිගතෙහි, උට්ඨානසඞ්ඛ්‍යාතවූ වීර්‍ය්‍යයෙන් පැමිණෙන ලද්
දාවූ; බාහාබලපරිචිතෙහි, හස්තබල කරණකොට ගෙණ රැස්කරණ ලද්දාවූ;
සෙදාවක්ඛිත්තෙහි, අවක්ෂිප්ත ස්වේදඅධිව්‍යායාමයෙන් උපදවනලද්දාවූ වීර්‍ය්‍ය
යෙන් පැමිණෙන ලද්දාවූ;)ධම්මිකෙහි, දැහැමින් යුක්තවූ; ධම්මලද්ධෙහි, දශ
කුශලධර්ම්මයෙන් අකොප්‍ය කොට ලබනලද්දාවූ; භොගෙහි, භොගයන් කර
ණකොට ගෙණ; චත්තාරි පත්තකම්මානි, චතුර්විධවූ යුක්තකර්ම්මයන්; ක
ත්තා හොති, කරන්නේ වේද; කතමානි චත්තාරි, ඒ චතුර්විධවූ යුක්තකර්ම්ම
යෝ නම් කවුරුද ? ගහපති, එම්බා ගෘහපතිය; ඉධ, මේ ලොකයෙහි; අරිය
සාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; උට්ඨානවිරියාධිගතෙහි, උට්ඨානසඞ්ඛ්‍යාත වීර්‍ය්‍යයෙ
න් පැමිණෙනලද්දාවූ; බාහාබලපරිචිතෙහි; හස්තබල කරණකොට ගෙණ
රැස්කරණ ලද්දාවූ; සෙදාවක්ඛිත්තෙහි, අවක්ෂිප්ත ස්වේදඅධිව්‍යායාමයෙන් උ
පදවන ලද්දාවූ; ධම්මිකෙහි, දැහැමින් යුක්තවූ; ධම්මලද්ධෙහි, දශකුශලධර්ම්ම
යෙන් අකොප්‍ය කොට ලබන ලද්දාවූ; භොගෙහි, භොගයන් කරණකොට
ගෙණ; අත්තානං, තමහට තමාය; සුඛෙති, සුවපත් කරන්නේය; පීණෙති,
කායික චෛතසික දුඃඛයන් හැර පිණවීම් වශයෙන් බලසම්පන්න කරන්
නේය; සම්මා, මනාකොට; සුඛං පරිහරති, සැප පරිහරණය කරන්නේය
(හෙවත්) පොෂ්‍යය කරන්නේය; මාතාපිතරො, මාතෘපිතෘන් දෙදෙනා; සු
ඛෙති, සුවපත් කරන්නේය; පීණෙති, පිණවීම් වශයෙන් බලසම්පන්න ක
රන්නේය; සම්මා, මනාකොට; සුඛං පරිහරති, සැපපරිහරණය කරන්නේ
ය (හෙවත්) පොෂ්‍යය කරන්නේය.

මෙහි දක්වන ලද මවුපියන් පොෂ්‍යය කිරීම යයි කියනලද උපස්ථානයෙහි විභාග නම් කවර යත්? දෙමවුපියන්ට උපස්ථානකරණුවන් විසින් තමා කට සුතු මෙහෙකරු දසාදීන් ඇද්ද ඔවුන්ට නො ඇණවා උදය නැගී සීත ඇත් නම් දර ගිනි එලුවාදී මහළු වුවද සෙම් සොටු මලමූත්‍රයෙන් වැකී ගිය ශරීර ඇද්ද වැදෑමස් ලේ කුණු ආදියෙන් තමා ළදරු කාලයෙහි කැත නො කොට අපමණ සෙනහයෙන් වැඩූ දෙමවුපියන්ගේ ගුණ සිහි කොට පසින් පහකළ මනාදෙය අතින් පහකොට අතින් පහකළ මනාදෙය ඉසින් පහ කොට සියඅතින් අත පය ආදිය උලා නාවා තමා ළදරුකාලයෙහි මනාපිළි යෙන් සැරහූ දෙමවුපියන්ගේ ගුණ සිහිකොට යෙහෙණ පමණකින් උතුම් පිළී හඳවා ඒ ඒ කලට ශරීරයට පැමිණි ව්‍යාධියට නිසි පිළියම් කොට තමා ළදරුකාලයෙහි මනාරස කැවූ දෙමවුපියන්ගේ ගුණ සිහි කොට කැඳ කැමතිවුව කැඳ පිළියෙළ කොට බත්කැමැතිවුව බත් පිළියෙළ කොට කැඳබත් දෙකම කැමතිවුව දෙකම පිළියෙළ කොට තමා ළදරුකාලයෙහි තෙල්කිරි ගා වැඩූ දෙමවුපියන්ගේ ගුණ සිහි කොට සුවඳ තෙල් ආදිය හස්තපාදාදියෙහි ගල්වා සියඅතින් මැඩ සකස්කරණලද ගෘහයෙක උතුම් හැඳක හොවා තුන්වේලෙහි වැඳ මවුපියන් දිවිරක්නාකාක්කාලයෙහි මේ ලෝකයෙහි විමර්ජනයන්විසින් ප්‍රශස්තවූ පරලෙව්හි ස්වර්ගාපවර්ගසම්ප්‍රාප්තියට හෙතුවූ පුණ්‍යකර්මය කිරීම උපස්ථාන නම්-වදාළේ මැනො.

"තස්මා හි තෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො,
අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච,
උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙන ච.

තායනං පාරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධ චෙව නං පසංසන්ති පෙච්චසග්ගෙ ච මොදති" යි.

මෙසේ කරණ සත්කාරයට මවුපියන් කවර ගුණයෙන් නිසිවූද යත්? දරුවන්ට තමන් බ්‍රහ්මවන හෙයින් පූර්වදෙව වන හෙයින් පූර්වාචාරී වන හෙයින් ආහුනෙය්‍ය වන බැවින් නිසිවූහු.

"බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං, පුබ්බදෙවාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං, පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං, ආහුනෙය්‍යාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං" යි.

මවුපියන් බ්‍රහ්ම වන පරිදි කිසේය යත්? මවුපියන්සේ මහාබ්‍රහ්මයාහට මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා ලක්ෂණ සතර භාවනාවෝ අවිජහිත වෙද්ද එසේහෙයින්ම මවුපියන්ට පුත්‍රයන්කෙරෙහි එම සතර භාවනාවෝ අවිජහිත වෙත්-කිසේය යත්? දරුවන් කුක්ෂිගත තැන්පටන් පිරිපුන් අඟපසඟැති නිරොගී පුත්‍රයා කවර දවසක දකුමෝද්දෝහෝයි මවුපියනට මෛත්‍රී සිත් උපද්දී. එසේ ලද පුත්‍රයා යම් කලෙක දුප්පත්වීනම් ඒ දුකින් මිදෙවයි කම්පිත වන බැවින් මවුපියනට කරුණා උපද්දී, දරුවාගේ මුඛශොභා දුටුකල හේ ඔවු

නට තාවරු වේවයි මවුපියන් සිත් පිණි වනබැවින් ඔහට මුදිතා උපද්දී, ඔහු කලත්‍රපරිග්‍රහ කොට වෙන ගෙයක වසන කල මේ දරු සුවබලයෙන් වැඩෙන්නට සමර්ථ වේවයි මැදහත් වනබැවින් මවුපියනට උපෙක්ෂා උපද්දී, මෙසේ සතර බ්‍රහ්මවිහාර භාවනාවෙන් අවිජහිත වනබැවින් මවුපියෝ පුත්‍රයාහට බ්‍රහ්ම වෙත්.

ඔවුන් පූර්වදෙව වන පරිදි කිසේය යත්? හැම ඉෂ්ටදෙවතාවන් කෙරෙහි පළමු දෙවියහ, එයින් මවුපියෝ පුත්‍රයන්ට පූර්වදෙව වෙත්, ඔවුන් පූර්වාචාර්ය වනපරිදි කිසේය යත්? පුත්‍රයා උපන් තැන්පටන් ගෙණ මෙසේ හිඳිනේය මෙසේ සිටිනේය යනාදීන් විසින් පළමු ශික්ෂාපනය කරවති, පැසුළු ඇතම් ආචාර්ය කෙණෙක් හස්තිශිල්ප අශ්වශිල්පාදිය ශික්ෂණය කරවති, ඇතම්හු සරණශීලාදී ගුණධර්මයෙහි පිහිටුවති, මොවුන් හැම ආචාර්යයන් කෙරෙහි මවුපියෝ පුත්‍රයන්ට පූර්වාචාර්ය වෙත්-ඔවුන් ආහුණෙය්‍ය වනපරිදි කිසේය යත්? අභිසංස්කෘත කොට ඇරදෙන්නට නිසි අන්නපානාදී ප්‍රතිග්‍රහණයට ආර්‍ය වනබැවින් ආහුණෙය්‍ය නම් වෙත්-එයින් වදාළහ.

“බ්‍රහ්මා’ති මාතාපිතරො පුබ්බාචරියා’ති වුච්චරෙ,
ආහුණෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා” යි.

මෙසේ සත්කාර කරණ දරුවෝ දෙමවුපියනට ප්‍රත්‍යුපකාර කළා නම් වෙද්දයත්? මේ ඔවුන් උපකාර ගුණ උපෙක්ෂා කළ කල්හි කිසි විස්මයක් නොවෙයි, කිසේයයත්? යමෙක් මවුපියන් තමහට උපකාරබැව් දැන ප්‍රත්‍යුපකාර කෙරෙමි යි පරවසව එක්දසරුවෙක මව හිඳුවා ගෙණ එක්දසරුවෙක පියා හිඳුවා ගෙණ අවුරුදු සියයක් පරිහරණය කෙරේද හේ ඔවුන් උම්මර්දනයනුදු හස්ත පාද පරිමර්දනයනුදු සීතොදක උෂ්ණොදක ස්නාන පානයනුදු අඞ්ගසම්බාහණයනුදු උපස්ථාන කෙරේද මවුපියෝ ඔහු අංශකූටයෙහිම හිඳ මූත්‍රපුරීසවිසර්ජන කෙරෙද්ද හේ එසේද වුව මවුපියන්ට උපකාර නම් නොවේ-එයින් වදාළහ.

“ද්වින්නාහං භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි, කතමෙසං ද්වින්නං? මාතුච්ච පිතුච්ච, එකෙන භික්ඛවෙ අංසෙන මාතරං පරිහරෙය්‍ය එකෙන අංසෙන පිතරං පරිහරෙය්‍ය වස්සසතායුකො වස්සසතජීවී සො ච නෙසං උච්ඡාදන පරිමද්දන නහාපන සම්බාහනෙන තෙපි තත්ථෙව මුත්තකරීසං චජෙය්‍යුං, නත්වෙව භික්ඛවෙ මාතාපිතුන්නං කතං වා හොති පතිකතං වා” යි.

මෙසේ මතු නොවෙයි සියළු දඹදිව්තලය හෙරීතලයක් සෙයින් සම කොට කිණි පමණ සත්රුවන් පුරා මවුපියන් එහි නායක කොට සක්විතිරාජ්‍යයෙහි පිහිටුවාද හේ කෙසේ කෙළේවී නමුදු මවුපියනට උපකාර නොවෙයි-එයින් වදාළහ.

“ඉමිස්සා භික්ඛවෙ මහාපඨවියා පහූතසත්තරතනාය මාතාපිතරො ඉස්සරියාධිපච්චෙ රජ්ජෙ පතිට්ඨාපෙය්‍ය නත්වෙව භික්ඛවෙ මාතාපිතුන්නං කතං වා හොති පතිකතං වා” යි කරුණු කිම යත්? මවුපියෝ පුත්‍රයන් ජීවිතයට ආ

පාදකයන පොෂකයන ප්‍රවෘත්තකයන හෘදරුධිර පෙරළා කිරි කොට පොවා අත් පා ගෑඹා අන්නපානයෙන් සන්තර්පිත කොට වැඩුවාහ, ඉදින් මවුපියෝ ඔහු උපන් දවසම පාදයෙහි ගෙණ අරණ්‍යයෙහි නදීශ්‍රොත්‍ර හෝ ප්‍රපාත යෙහි හෝ බහා පිහුවීනම් ඔහු මෙලොව දක්නට අසමර්ථ වෙති, එසේ නො කොට මවුපියෝ පුත්‍රයන් පරිපාලනය කොට ඉෂ්ටානිෂ්ටාලම්බනඇති ලො කය දක්වත්-එයින් වදාළහ,

“තං කිස්සහෙතු ? බහූපකාරා * භික්ඛවෙ මාතාපිතරෝ පුත්තානං ආපා දකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරො” යි.

ඔවුන් මවුපියනට ප්‍රත්‍යුපකාර වන්නේ නම් කවරකලද යත් ? පූර්වොක්ත ක්‍රමයෙන් ආදරඇතිව මවුපියන් පුස්නේ ශ්‍රද්ධා නැති මවුපියන් ශ්‍රද්ධාසම්පත්තෙ හි පිහිටුවා දුශ්ශීලයන් ශීලසම්පත්ත මාත්සර්‍ය්‍යයන් ත්‍යාගසම්පත්ත අඥානයන් ප්‍ර ඥාසම්පත්ත පිහිටුවාද මෙතෙකින් ජේ දෙමවුපියනට ප්‍රත්‍යුපකාර කළානම් වේ-එයින් වදාළහ.

“යොච ඛො භික්ඛවෙ මාතාපිතරො අස්සද්ධෙ සද්ධාසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති, දුස්සීලෙ සීලසම්පදාය-පෙ-මච්ඡරිං චාගසම්ප දාය-පෙ-දුප්පඤ්ඤෙ පඤ්ඤාසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති, එත්තාවතා ඛො භික්ඛවෙ මාතාපිතූනං කතඤ්ච හොති පතිකතඤ්ච අතිකත ඤ්චාති” යි.

එබැවින් සුවකැමැති ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන්විසින් ආදර බහුමානයෙන් මවුපියනට උපස්ථාන කොට සගමොක් සිරිසැපත් අත්පත් කටයුත්තේයි.

පුත්තදාරදාසකම්මකරපොරිසෙ, පුත්‍රකලත්‍ර දාස කම්කරු පුරුෂයන්; සුඛෙ ති, සුවපත්කරන්නේය; පීණෙති, පිණවීම් වශයෙන් බලසම්පන්න කරන් නේය; සම්මා, මනා කොට; සුඛං පරිහරති; සැප පරිහරණය කරන්නේය (හෙවත්) පොෂ්‍යය කරන්නේය—මිත්තාමච්චෙ, මිත්‍රාමාත්‍යයන්; සුඛෙති, සුවපත් කරන්නේය; පීණෙති, පිණවීම් වශයෙන් බලසම්පන්න කරන්නේ ය; සම්මා, මනාකොට; සුඛං පරිහරති, සැපපරිහරණය කරන්නේය (හෙව ත්) පොෂ්‍යය කරන්නේය; අස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; පත්තගතං, යුක්ත ප්‍රාප්තවූ; ආයතනසො පරිභුත්තං, කාරණ වශයෙන් පරිභොග කරණලද; ඉදංපඨමංඨානගතං හොති, මේ ප්‍රථමස්ථානයට ගියාවූ භොගස්කන්ධය නම් වන්නේය.

ගහපති, එම්බා ගෘහපතිය; පුනචපරං, නැවතද; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාව කතෙම; උට්ඨානවිරියාධිගතෙහි, උත්ථානසඞ්ඛ්‍යාතවීර්‍ය්‍යයෙන් පැමිණෙනලද්දා වූ; බාහාබලපරිචිතෙහි, හස්තබලකරණ කොට ගෙණ රැස්කරණලද්දාවූ; සෙදාවක්ඛිත්තෙහි, අවක්ෂිප්තසෙවදදීවූ ව්‍යායාමයෙන් උපදවනලද්දාවූ; ධ ම්මිකෙහි, ධර්‍මයෙන් යුක්තවූ; ධම්මලද්ධෙහි, දශකුශලධර්මයන් අකොප්‍ය කොට ලබනලද්දාවූ; භොගෙහි, වස්තූන් කරණකොට ගෙණ; යාතාආපදා, යම් මේ ආපදාකිසිකෙණෙක්; අග්ගිතොවා, ගින්නෙන් හෝ; උදකතො වා, දියෙන් හෝ; රාජතො වා, රජදරුවන්ගෙන් හෝ; චොරතො වා, සොරුන්

* “බහුකාරා” යි ඇතම් පෙල අටුවාහි පෙණේ,

යෙන් හෝ; අප්පියතො වා, අමනාපසඞ්ඛ්‍යයන්ගෙන් හෝ; දායාදතො වා, නෑයන්ට දියයුතු දායාදයෙකින් හෝ;* හොන්ති, වන්නාහුද; තථාරූපාසු ආපදාසු, එබඳුවූ ආපදාවක් පැමිණිකල්හි; භොගෙහි, භොගයන් කරණකොටගෙණ; පරියොධාය වත්තති, ඒ උපද්‍රවයන් පිහිත කොට පවත්නේය (හෙවත්) ආදිප්තගෘහනිර්ව්‍යාපණාදිය පිණිස ධනපරිත්‍යාග කොට ඒ විපත්ති මාර්ගයන් වසා පවත්නේය; අත්තානං, තමාහට; සොත්ථිං කරොති, නිරුපද්‍රව කරන්නේය; අස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; පත්තගතං, ප්‍රාප්තගතවූ; ආයතනසො පරිභුත්තං, කාරණවශයෙන් පරිභොග කරණලද; ඉදං දුතියංඨානගතං හොති, මේ ද්විතීය ස්ථානයට ගියාවූ භොගස්කන්ධය නම් වන්නේය-

ගහපති, එම්බා ගෘහපතිය; පුනචපරං, නැවතද; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; උට්ඨානවිරියාධිගතෙහි; උට්ඨානසඞ්ඛ්‍යාතවීර්‍ය්‍යයෙන් පැමිණෙණලද්දාවූ; බාහාබලපරිචිතෙහි, හස්තබල කරණකොටගෙණ රැස්කරණලද්දාවූ; සෙදාවක්ඛිත්තෙහි, අවක්ෂිප්තස්වේදාදී ව්‍යායාමයෙන් උපදවනලද්දාවූ; ධම්මිකෙහි, දැහැමෙන් යුක්තවූ; ධම්මලද්ධෙහි, දශකුශලධර්මයන් අකොප්‍ය කොට ලබනලද්දාවූ; භොගෙහි, භොගයන් කරණකොටගෙණ; ඤාතිබලිං, මාතෘපක්ෂය පිතෘපක්ෂය යන උභය පක්ෂයෙහි නෑයන්ට දියයුතු බිලිය; අතිථිබලිං, ආගන්තුකාදීන්ට දියයුතු බිලිය; පුබ්බපෙතබලිං, පරලොකප්‍රාප්තයන් උදෙසා දියයුතු මතකභක්තාදී බලිය; රාජබලිං, රජදරුවන්ට දියයුතු බිලිය; දෙවතාබලිං, දෙවියන් පිණිස දියයුතු බිලියයි යන; පඤ්චබලිකත්තා හොති, මේ පඤ්චප්‍රකාර බිලි කරන්නේ වේ; අස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; පත්තගතං, යුක්තප්‍රාප්තගතවූ; ආයතනසො පරිභුත්තං, කාරණ වශයෙන් පරිභොගකරණලද; ඉදං තතියං ඨානගතං හොති, මේ තෘතීයස්ථානයට ගියාවූ භොගස්කන්ධය නම් වන්නේය.

ගහපති, එම්බා ගෘහපතිය; පුනචපරං, නැවතද; අරියසාවකො, ආර්‍ය්‍යශ්‍රාවකතෙම; උට්ඨානවිරියාධිගතෙහි, උට්ඨානසඞ්ඛ්‍යාත වීර්‍ය්‍යයෙන් පැමිණෙණලද්දාවූ, බාහාබලපරිචිතෙහි, හස්තබල කරණකොට ගෙණ රැස්කරණලද්දාවූ; සෙදාවක්ඛිත්තෙහි, අවක්ෂිප්තස්වේදාදී ව්‍යායාමයෙන් උපදවනලද්දාවූ; ධම්මිකෙහි, දැහැමෙන් යුක්තවූ; ධම්මලද්ධෙහි, දශකුශලධර්මයන් අකොප්‍ය කොට ලබනලද්දාවූ; භොගෙහි, භොගයන් කරණකොටගෙණ, මදප්පමාදා, යෞවනමදාදිවූ ත්‍රිවිධමදයෙන් හා ස්මෘතිවිප්‍රවාස සඞ්ඛ්‍යාතවූ ප්‍රමාදයෙන්; පටිවිරතා, විශෙෂයෙන් වැළැක්කාවූ; ඛන්තිසොරච්චෙ නිවිට්ඨා, අධිවාස සඞ්ඛ්‍යාත ක්ෂාන්තියෙහිද සුශීලභාවයෙහිද පිහිටුයාවූ; යෙ තෙ සමණබ්‍රාහ්මණා, යම් ඒ ශ්‍රමණබ්‍රාහ්මණ කෙණෙක්; එකමත්තානං, ස්වකීයාත්මභාවය; දමෙන්ති, ඉන්ද්‍රියසංවර වශයෙන් දමනයකෙරෙද්ද; එකමත්තානං, එක ආත්මභාවය (හෙවත්) චිත්තය; සමෙන්ති, ක්ලෙශොපසමනයෙන් ව්‍යුපසමනයකෙරෙද්ද; එකමත්තානං, ස්වකීය චිත්තය; පරිනිබ්බාපෙන්ති, ක්ලෙශපරිනිර්වාණයෙ

---

* ''අප්පියතො වා දායාදතො වා'' යි දුටුතාක් සඟිපොත්හි පෙණෙන බැවින් සන්න කර්තෘයේ යෙදීමත් එසේමයයි සලකා වෙනස් නොකෙළෙමු.

න් නිවද්ද; තථාරූපෙසු, එබඳුවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් කෙරෙහි; උද්ධග්ගිකං,
මතුමත්තෙහි ඵලදීම් වශයෙන් උද්ධග්ගිකවූ; සොවග්ගිකං, ස්වර්ගෝත්පත්ති
වශයෙන් ස්වර්ගිකවූ; සුඛවිපාකං, උපදුපන්තන්හි සැපවිපාකදායකවූ; ස
ග්ගසංවත්තනිකං, සුවඳු අග්‍රවූ දශප්‍රකාර දිව්‍යවර්ණාදීන්ගේ නිෂ්පත්ති වශ
යෙන් ස්වර්ගසංවර්තිකවූ; දක්ඛිණං, මේ මේ ආකාරයෙන් ඵලදෙන්නාවූ දක්ෂි
ණාව; පතිට්ඨාපෙති, ප්‍රතිෂ්ඨාකරන්නේය (හෙවත්) පිහිටුවන්නේය; අස්ස,
ඒ ආර්යශ්‍රාවකයාගේ; පත්තගතං, යුක්තප්‍රාප්තගතවූ; ආයතනසොපරිභුත්තං,
කාරණවශයෙන් පරිභොගකරණලද; ඉදං චතුත්ථං ඨානගතං හොති, මේ ච
තුර්ථස්ථානයට ගියාවූ භොගස්කන්ධය නම් වන්නේය.

ගහපති, එම්බා ගෘහපතිය; සඛො සො අරියසාවකො, ඒ මේ ආර්යශ්‍රාවක
තෙම; උට්ඨානවිරියාධිගතෙහි, උට්ඨානසංඛ්‍යාත වීර්යයෙන් අධිගතවූ; බාහා
බලපරිචිතෙහි, භුජබල කරණකොටගෙණ රැස්කරණලද්දාවූ; සෙදාව
ක්ඛිත්තෙහි, අවක්ෂිප්තස්වේදදී ව්‍යායාමයෙන් උපදවනලද්දාවූ; ධම්මිකෙහි,
ධර්මයෙන් යුක්තවූ; ධම්මලද්ධෙහි, දශකුශලධර්මයන් අකොපත්‍ය කොට ලබන
ලද්දාවූ; භොගෙහි, වස්තූන් කරණකොටගෙණ; ඉමානි චත්තාරිපත්තක
ම්මානි, මේ චතුර්විධ යුක්ත කර්මයන්; කත්තා හොති, කරන්නේ වේ යයි
වදාලසේක.

මෙසේ ආර්යශ්‍රාවකයා විසින් උට්ඨානසංඛ්‍යාතවූ වීර්යයෙන් ලබනලද භො
ගයන් කරණකොටගෙණ චතුර්විධයුක්තකර්මයන් කටයුත්තේයයි වදාර
නැවත යම් කිසිවක්හුගේ වස්තූහු ඒ මේ චතුර්විධයුක්තකර්මයන් හැර අ
ක්ෂධූර්ත්ත සුරාධූර්ත්තාදි සෙසුතැන්හි ක්ෂයභාවයට යේනම් ඒ භොගයෝ අයු
ක්තස්ථානාදියට ගියාහුයයි වදාරන්නාහු සුපරිශුද්ධප්‍රවරනිඛිලගුණරත්නනි
ධිනිකෙත නිර්විශෙෂවූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ "යස්සකස්සචි
ගහපති අඤ්ඤත්‍ර ඉමෙහි චතූහි පත්තකම්මෙහි" යනාදී පාලිය වදාලසේක.

ගහපති, එම්බා ගෘහපතිය; යස්සකස්සචි, යම් කිසිවක්හුගේ; භොගා, ව
ස්තූහු; ඉමෙහි චතූහි පත්තකම්මෙහි, මේ චතුර්විධවූ යුක්තකර්මයන් හැර; අ
ඤ්ඤත්‍ර, අක්ෂධූර්ත්තසුරාධූර්ත්තාදී සෙසුතැන්හි; පරික්ඛයං ගච්ඡන්ති, ක්ෂයභා
වයට යෙද්ද ? ගහපති, එම්බා ගෘහපතිය; ඉමෙ භොගා, මේ භොගයෝ; අ
ඨානගතා, අස්ථානගතවූවාහුය; අපත්තගතා, අයුක්තප්‍රාප්තගතවූවාහුය;
අනායතනසොපරිභුත්තා, නිෂ්කාරණවශයෙන් පරිභොගකරණ ලද්දාහුයයි
කියා; වුච්චන්ති, කියනුලැබෙත්—ගහපති, එම්බා ගෘහපතිය; යස්සකස්සචි,
යම් කිසිවක්හුගේ; භොගා, වස්තූහු; ඉමෙහි චතූහි පත්තකම්මෙහි, මේ ච
තුර්විධයුක්තකර්මයන් කරණකොට ගෙණ; පරික්ඛයං ගච්ඡන්ති, ක්ෂයභාව
යට යෙද්ද ? ගහපති, එම්බා ගෘහපතිය; ඉමෙ භොගා, මේ භොගයෝ; ඨා
නගතා, ස්ථානගතවූවාහුය; පත්තගතා, යුක්තප්‍රාප්තවූවාහුය; ආයතනසො ප
රිභුත්තා, කාරණාවශයෙන් පරිභොග කරණලද්දාහුයයි කියා; වුච්චන්ති,
කියනුලැබෙත්.

මෙ, මා විසින්; භොගා, උත්ථානසඞ්ඛ්‍යාතවූ වීර්‍ය්‍යයෙන් අධිගතවූ භොගයෝ; භුත්තා, අනුභව කරණලද්දාහුය; භටා, පොෂ්‍යය කටයුතුවූ මවුපියාදීහු; භතා, පොෂ්‍යය කරණලද්දාහුය; මෙ, මට; ආපදාසු, ආපදායක් පැමිණි කල්හි, විතිණ්ණා, ඒ උපද්‍රවයන් දුරුකිරීම් වශයෙන් විශෙෂයෙන් තරණය කරණ ලද්දාහුය; අථො, නැවත; පඤ්චබලී, පඤ්චප්‍රකාර බලීහු; කතා, කරණ ලද්දාහුය; උද්ධග්ගා, මතුමතුයෙහි ඵලවිපාකදායකවූ; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; දින්නා, දෙනලද්දීය.

සඤ්ඤතා, කායවාග්සංයම සහිතවූ; බ්‍රහ්මචාරියො *, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යායෙන් යුක්තවූ; සීලවන්තො, සිල්වත්නට; උපට්ඨිතා, චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයයෙන් උපස්ථානකරණ ලද්දාහුය; ඝරමාවසං, ගෘහවාසීවූ; පණ්ඩිතො (නරෙ,) ප්‍රඥාවන්ත පුද්ගලතෙම; යදත්ථං, යම් අර්ථයක් පිණිස (හෙවත්) යම් වැඩදායකවූ ප්‍රයොජනයක් පිණිස; භොගං, වස්තුව; ඉච්ඡෙය්‍ය, කැමැති වන්නේද.

සො අත්ථො, ඒ අර්ථය; මෙ, මට; අනුප්පත්තො, සම්ප්‍රාප්තවූයේය; අනනුතාපියං, නො තැවියයුතුවූ කුශලධර්මය; කතං, කරණ ලද්දේය; එතං, මේ කාරණය (හෙවත්) තමා විසින් කරණලද කුශලය; අනුස්සරං, සිහිකරන්නාවූ; මච්චො (නරෙ,) සත්වතෙම; අරියධම්මෙ, ආර්‍ය්‍යධර්මසඞ්ඛ්‍යාතවූ පඤ්චශීලයෙහි; ඨිතො, සිටියේද; නං, ඔහු; ඉධචෙව, මේ ලොකයෙහිද; පසංසන්ති, ප්‍රසංශා කරන්නාහුය; පෙච්ච, පරලොවෙහිද; සග්ගෙච, සියලු පඤ්චකාමසම්පත්තීන් සුවඩු අග්‍රහෙයින් ස්වර්ගනම්වූ දිව්‍යලොකයෙහිද; මොදති, ප්‍රමොදවන්නේය (නොහොත්) ශ්‍රොතාපත්ති සකෘදාගාමි අනාගාමි ඵලප්‍රාප්තවූ අනතුරුව අමෘතමහානිර්වාණ ප්‍රතිලාභයට පැමිණෙන්නේ යයි වදාළසේක.

ප්‍රාප්තකර්මසූත්‍රාර්ථව්‍යාඛ්‍යානය.

නිමි.

---

* මෙය මෑත ලියන ලද සමහර පෙලපොත්හිද මුද්‍රිත "ශ්‍රෙයාජීදීපනී" යෙහිද "බ්‍රහ්මචාරයො" යී පෙණේ-එය එසේ නොව "බ්‍රහ්මචාරිනො" යී වියයුතුයයි ඇතම් භවතුන්ට අභිමත නමුත් පෞරාණික පුස්තකයන්හි "බ්‍රහ්මචාරියො" යී පැණෙන හෙයින්ද එහි පදසිද්ධිය මුගලන් ව්‍යාකරණයෙන් නිපදවිය හැකි හෙයින්ද මෙසේ යෙදූ බව දතයුතු.

# ශුද්ධිපත්‍රය.

——*——

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 15 | චිතනස්ස | චීතනස්ස |
| 3 | 6-7 | අපපියතොවාදුසාදතොවා | අපපියදුසාදතො වා |
| ,, | 26 | ආයතනසො | අනායතනසො |
| 4 | 13 | සුබ්බුම්මපිස්ස | සුබ්බුමම්පිස්ස |
| ,, | 18 | අකෙකාපෙතවා | අකොපෙතවා |
| ,, | ,, | පතනකම්මානි | පතනකම්මානී'ති |
| 6 | 36 | ප්‍රයතනය* | ප්‍රයතනය |
| 8 | 1 | ධම්මියා | ධම්මිය |
| 9 | 10 | සමානය | සාමාන්‍ය |
| ,, | 18 | අපත්‍රපා | අපත්‍රපාය |
| ,, | 33 | වෘහ | වෘෂභ |
| 10 | 1 | චතුබ්බිදු | චතුබ්බිධා |
| ,, | 29 | පන්සියයක් | පන්සියයක් පන්සියයක් |
| ,, | 37-38 | මුළොදර | මුළොදර මහොදර |
| 11 | 3 | සම්මානාධි | සංයමාදී |
| ,, | 9 | මුෂ්ටික | මුෂ්ටික |
| ,, | 14 | හවිසනත් | හවිෂභත් |
| 12 | 36 | සාඛා | සාඛාහි වඩ්ඪන්ති |
| 14 | 4 | සඳතු | පරළු |
| ,, | 18 | අනනරීක්ෂයෙදු | අනනරීක්ෂයෙහිදු |
| ,, | 29 | කණඩ | කණෙඩ |
| ,, | 31 | ජාතිසම්භවො | ජාතිසම්භවෙ |
| 28 | 36 | රාජිකනං | රාජිකානං |
| 30 | 1 | පසාදයං | පසාදයෙ |
| 32 | 10 | දුනට | දුනසට |
| 34 | 29 | කියනෙකා | කියකො |
| 36 | 20 | සොවතකිකො | සොවගගිකො |
| ,, | 37 | ධනව | ධ්‍යානව |